# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
# சிறு தேயிலைத் தோட்டஅபிவிருத்தி அதிகார சபை
# Tea Small Holdings Development Authority

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT
# 2024


අංක,70 පාර්ලිමේන්තු පාර පැලවත්ත, බත්තරමුල්ල
இலக்கம், 70 பாராளுமன்ற வீதி, பலவத்த, பத்தரமுல்ல
No: 70, Parliament Road, Pelawatte, Battaramulla
දුරකථන අංක தொலைபேசி இல Tele ( 011-790 9020/21) ෆැක්ස් பெக் Fax (011 -278 4925/28)
ඊ මේල් ஈ-மெயில Email: gmtshda@gmail.com /aetshda1@gmail.com

# දැක්ම සහ මෙහෙවර

## දැක්ම



ආර්ථික හා සමාජයීය වශයෙන් තිරසාර කුඩා තේ වතු ප්‍රජාවක් බිහිවීම

## මෙහෙවර



විශිෂ්ඨතම උපකාරක සේවා සැපයීම තුලින් කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාව සහ ගුණාත්මය වර්ධනය කිරීම

# සභාපතිතුමාගේ පණිවුඩය


ශ්‍රී ලංකාවේ වර්තමාන තේ කර්මාන්තයේ පවතින ප්‍රධාන ගැටළු දෙක නම් නිෂ්පාදනට යොදා ගන්නා තේ දළුවල ප්‍රමිතිය අඩු වීම හා ඒ හා සමගාමීව අස්වනු අඩු වීමය. දැනට ඇති දත්ත වලට අනුව අමු තේ දළුවල ප්‍රමිතිය නොමේරූ හානි නොවූ දළු 20% ත් 30% ත් අතර ප්‍රතිශතයක පවතින අතර, 2024 වර්ෂය වන විට අස්වනු මට්ටම හෙක්ටයාර් එකකට මසකට කි.ග්‍රෑ. 481 (මසකට අක්කරයකට කි.ග්‍රෑ. 195) ජාතික මට්ටටමේ සාමාන්‍ය අගයක් ලෙස පවතී. මේ හේතුව නිසා තේ වගා වල සිට අපනයනය දක්වා වූ අගයදාමය තුළ ඇති විවිධ පියවරයන් සියල්ලම ඵලදායීතාවයෙන් තොර වී ඇත. මේ නිසා, විශේෂයෙන්ම, තේ වගාකරුවන් තේ වගා කිරීම අත්හැරීම සහ තේ ඉඩම් වෙනත් බෝග සඳහා පරිවර්තනය කිරීම සිදු වෙමින් පවතී. එමඟින් ශ්‍රී ලංකාව අපනයනය කරන තේ ප්‍රමාණයන් ද අඩු වෙමින් පවතී. මෙය ශ්‍රී ලංකාවේ තේ අපනයන ආදායම ද අඩු කිරීමට බලපෑ හැකිය.

යහපත් තේ නිෂ්පාදනයක් සඳහා තේ දළුවල ප්‍රමිතිය 70%කට වඩා ඉහළ අගයක තිබිය යුතු වුවත් තේ කර්මාන්තය තුළ මෙම දළු ප්‍රමිතිය නඩත්තු කිරීම සඳහා ලබා දී ඇති අවධානය ඵලදායී මට්ටමක තිබී නැත. තේ ශාකය පොහොර යෙදීම ඇතුළු අනෙකුත් යහපත් කෘෂිකාර්මික ක්‍රියාවන්ට සංවේදී වන්නේ ප්‍රමිතියානුකූල දළු නෙලීමක් සිදු කළහොත් පමණි. එසේ නොවුනහොත් පොහොර යෙදීම සහ අනෙකුත් යහපත් කෘෂිකාර්මික ක්‍රියාවන් ප්‍රශස්ත මට්ටමකින් සිදු කළද තේ ශාකය ඒවාට අසංවේදී බවක් පෙන්වයි. මෙවැනි තත්වයක් යටතේ විශේෂයෙන්ම රසායනික පොහොර අඛණ්ඩව යෙදීමෙන් පසෙහි ප්‍රමිතීන් විනාශ වී පස අජීවී තත්වයකට පත් වේ. මේ නිසා ක්‍රමිකව අස්වනු අඩු වීමක් සිදු වන අතර එම සාධකය දළුවල ප්‍රමිතිය පිළිබඳ අවධානයකින් තොරව දළු නෙලීම සඳහා ගොවියා පොළඹවයි. මෙම ක්‍රියාවලිය දීර්ඝ කාලයක් තිස්සේ සිදු වෙමින් ඇති නිසා කුඩා තේ වතු ඌණ ප්‍රමිති දළු නෙලීම සහ පිරිහෙන පස යන සාධක මඟින් ධාවනය කෙරෙන විෂම චක්‍රයට හසුවී ඇතැයි සැලකිය හැක.

කුඩා තේ වතු අංශයේ අස්වනු පහළ වැටීමේ ප්‍රවණතාවය ගොඩනැගී ඇත්තේ 2014 වර්ෂයේ සිටයි. එම වර්ෂයේ කුඩා තේ වතු අංශයේ අස්වනු මට්ටම හෙක්ටයාර් එකකට මසකට අමු තේ දළු කි.ග්‍රෑ. 790 (අක්කරයකට මසකට 320)ක පමණ මට්ටමක පැවතිණි. ශ්‍රී ලංකාවේ තේ ඉතිහාසයේ උපරිම නිමි තේ නිෂ්පාදන ප්‍රමාණය වන වර්ෂයකට කි.මි. 340 නිෂ්පාදනය කෙරෙන්නේ මේ වර්ෂයේය. එම වාර්තාගත තේ නිෂ්පාදනයට කුඩා තේ වතු අංශයේ දායකත්වය 75%ක් විය.

ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු කර්මාන්තය යළිත් ඵලදායී තත්වයකට ගෙන ඒමට නම් ප්‍රමුඛ කාර්යයක් ලෙස 2024 වර්ෂය වන විට පැවති අස්වනු මට්ටමේ සිට අඩුම තරමින් 2014 වසරේ තිබූ අස්වනු මට්ටම කරා අනිවාර්යෙන් වැඩි කළ යුතුය. තේ පර්යේෂණ ආයතනයේ පරීක්ෂණ වලට අනුව වර්තමානයේ අනුගමනය කරන වැරදි දළු නෙලීම් ක්‍රම නිවැරදි කිරීමෙන් පමණක් වර්තමාන අස්වනු මට්ටම් 22%කින් පමණ වැඩි කළ හැකිය. ඒ හා සමගාමීව පරිහානියට පත්වී ඇති පස යළිත් කාබනික පෝෂක කොටස් යෙදීම මඟින් පුනරුත්ථාපනය කිරීමෙන් මෙම අස්වනු මට්ටම් මෙයටත් වඩා වැඩි කළ හැකි යැයි බලාපොරොත්තු විය හැකිය. දළු නෙලීමේ ක්‍රම නිවැරදි කිරීම සහ පාංශු පෝෂණයට අමතරව පාළු සිටුවීම සහ නැවත වගාව මෙම අස්වනු වැඩි කිරීමට දායක කර ගත හැක.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කාර්යයන් අතුරෙන් 2025 වර්ෂයේ සිට සිදු කළ යුතු ප්‍රථම සහ ප්‍රමුඛ කාර්ය විය යුත්තේ ඉහත සඳහන් පරිදි දළුවල ප්‍රමිතිය හා එහි අස්වනු ප්‍රමාණය වැඩි කිරීම මඟින් සමස්ථ තේ කර්මාන්තයේ ඵලදායීතාවය වැඩි කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ග සැලසුම් කර ක්‍රියාත්මක කිරීමයි. වර්තමාන රජයේ "පොහොසත් රටක් සහ ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්තිය සාක්ෂාත් කර ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයට පුනරුද යුගයක් නිර්මාණය කිරීම මෙමඟින් සිදු කළ හැකිවනු ඇත.



**වී.ජේ.සී.එන්. උඩුගම්පොල**
**සභාපති**
**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය**

## කුඩා තේ වතු අංශයේ කාර්යඵල දර්ශකය 2024

| අංකය | විස්තරය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|
| 1 | කුඩා තේ වතු බිම් ප්‍රමාණය (හෙක්ටයාර)<br>*ශ්‍රී ලංකා තේ මණ්ඩල ඉඩම් ලියාපදිංචියට අනුව | 123,324 | *157,907 | *158,060 | *158,221 | *158,247 |
| 2 | කුඩා තේ වතු ඉඩම් හිමියන් සංඛ්‍යාව | 404,291 | *418,328 | *418,531 | *418,938 | *418,989 |
| 3 | කුඩා තේ වතු අංශයේ නිමි තේ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් මිලියන) | 205.666 | 223.197 | 189.734 | 190.662 | 197.154 |
| 4 | ජාතික නිෂ්පාදනයට කුඩා තේ වතු දක්වන දායකත්ව ප්‍රතිශතය (%) | 73.8 | 74.56 | 75.44 | 74.46 | 75.20 |
| 5 | සාමාන්‍ය ඵලදායිතාවය (නිමි තේ/ කිලෝ ග්‍රෑම් /හෙක්ටයාරයට ) | 1,766 | *1,414 | *1,200 | *1,205 | * 1,246 |
| 6 | තේ නැවත වගා බිම් ප්‍රමාණය - දිරිදීමනා යටතේ (හෙක්ටයාර) | 946 | 1466 | 1596 | 1076 | 412.2 |
| | | STaRR ව්‍යාපෘතිය සමඟ | | | | |
| 7 | තේ අලුත් වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර) (දිරිදීමනා යටතේ) | 424 | 678 | 408 | 43.61 | - |
| 8 | තේ නැවත වගා ප්‍රතිශතය (%) | 0.95 | 1.47 | 1.60 | 0.60 | 1.06 |
| | | (STaRR ව්‍යාපෘතිය සමඟ) | | | | |
| 9 | භෝග පුනරුත්ථාපනය - පැළ සංඛ්‍යාව (මිලියන) | 2.137 | 3.324 | 2.431 | 0.20 | 2.01 |
| 10 | කුඩා තේ වතු සංවර්ධන සමිති | | | | | |
| | සමිති සංඛ්‍යාව | 1,483 | 1,484 | 1,484 | 1,492 | 1,497 |
| | සාමාජික සංඛ්‍යාව | 309,710 | 279,594 | 305,736 | 300,706 | 287,407 |
| 11 | ව්‍යාප්ති සහ උපදෙස් සේවා | | | | | |
| | ඒක පුද්ගල ව්‍යාප්ති සේවා සංඛ්‍යාව | 14,439 | 15,866 | 19,565 | 20,678 | 25,111 |
| | කණ්ඩායම් වැඩසටහන් සංඛ්‍යාව | 1,956 | 2,530 | 3,179 | 3,185 | 3,478 |
| | සහභාගීත්ව ගොවීන් සංඛ්‍යාව | 53,068 | 43,138 | 90,451 | 72,445 | 76,904 |
| 12 | ආයතනයේ මෙහෙයුම් පිරිවැය (සංවර්ධන රුපියලක් සඳහා) | 0.55 | 0.38 | 0.27 | 0.35 | 0.93 |
| 13 | තේ පරීක්ෂක ව්‍යාප්ති නිළධාරී: තේ ගොවී අනුපාතිකය | 1:2807 | 1:3374 | 1.2907 | 1.2909 | 1:2910 |
| 14 | අමු දළ කිලෝවක සාමාන්‍ය විකුණුම් මිල රුපියල් | 92.55 | 90.57 | 182.07 | 162.66 | 179.16 |

# පටුන


1. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සංවිධාන ව්‍යුහය හා මූලික තොරතුරු - 08

1.1. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය........................................ 09-09
1.2. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටු කටයුතු.................................................................... 10-10
1.3. සංවිධාන ව්‍යුහය හා පරිපාලනමය කටයුතු.......................................................... 11-15
1.4. ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කාර්යාලවල කාර්යමණ්ඩල තොරතුරු හා සංචාරක බංගලා, නිවාඩු නිකේතන වල තොරතුරු.............................................. 15-24
1.5. ප්‍රධාන සාරාංශය.............................................................................................. 25-27
1.6. කුඩා තේ වතු අංශයේ ආයෝජනයන් හා මෙහෙයුම් සමාලෝචනය........................ 28-28

2. ආයතනයේ මූලික කාර්යයන් - 29

2.1. ආයතනය හා කාර්යභාර්ය…........................................................................ 30-30
2.2. ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ ප්‍රතිඵලපාදක කළමනාකරණ උපායමාර්ග හා සංවර්ධනාත්මක ප්‍රතිඵල........................................................................ 30-32
2.3. 2021 - 2025 උපාය මාර්ගික සැලැස්ම.........................................……..... 32-33
2.4. ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම හා ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම……................... 33-33
2.5. දීර්ඝ කාලීන සංවර්ධනයට දායකවන සේවක ක්‍රියාකාරකම්……............................ 33-33

3. සංවර්ධන ක්‍රියාකාරකම් -34

3.1. තේ නැවත වගාව.......................................................................................... 35-42
3.2. තේ අලුත් වගාව........................................................................................... 43-44
3.3. භෝග පුනරුත්ථාපනය.............................................................................. …. 45-48
3.4. කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රියාකාරීත්වය................................................. 49-49
3.5. විශේෂ ව්‍යාපෘති (සංවර්ධන)…………….......................................................... 49-51
3.6. තේ ශක්ති රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය ……….......................................................... 52-52
3.7. ආසියානු සංවර්ධන බැංකු විශේෂ ණය යෝජනා ක්‍රමය........................................ 53-53

4. ව්‍යාප්ති ක්‍රියාකාරකම් -54

4.1. තේ තවාන් ක්‍රියාකාරීත්වය.............................................................................. 55-58
4.2. වගා ආදර්ශන.............................................................................................. 59-59
4.3. ආයතනික මව් වගාව..................................................................................... 59-60
4.4. ව්‍යාප්ති උපදෙස් හා පුහුණු වැඩසටහන්............................................................. 61-61
4.5. පස් සාම්පල් පරීක්ෂාව හා ඒක පුද්ගල ව්‍යාප්ති කටයුතු......................................... 62-62
4.6. අස්වැන්න හා දළු ප්‍රමිතිය වැඩි කිරීමේ කම්හල් පාදක වැඩසටහන්......................... 62-62
4.7 "දල්ලකින් වෙනසක්" තේ ඉඩම් සංවර්ධන වැඩසටහන.......................................... 63-63
4.8. "දල්ලක ආශ්චර්යය" තේ ඉඩම්සංවර්ධන වැඩසටහන.......................................... 63-63
4.9. "කාබනික තේ වගාව" ප්‍රචලිත කිරීම ................. .................. ......................... 63-63

5. ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් අංශය හා තේ ඉඩම්වල ඵලදායීතාවය -65

5.1. කුඩා තේ ඉඩම්..................................................................................... …… 66-69
5.2. කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය................................................................. 69-69
5.3. කුඩා තේ ඉඩම් වල නිෂ්පාදන සංයුතිය හා ඵලදායීතාවය..................................... 69-70
5.4. කුඩා තේ අංශයේ දායකත්වය හා ඵලදායීතාවයේ සමාලෝචනය.......................... 71-71

# පටුන


**6. කුඩා තේ ඉඩම් අංශයේ වගා පිරිවැය හා දළු මිල - 72**

6.1. ශ්‍රම පිරිවැය........................................................ 73-73
6.2. අමු දළු කිලෝග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය........................................ 73-73
6.3. 2024 වර්ෂය් පැවති දළු මිල හා ඇස්තමේන්තු ගත පිරිවැය.................................... 73-74
6.4. තේ නැවත වගා කිරීමේ පිරිවැය........................................................ 74-74
6.5. හෙක්ටයාර එකක් සඳහා වූ දිරිදීමනා අනුපාතය සහ වගා පිරිවැය.......................... 75-75

**උපලේඛන**

1. අමු තේ දළු කිලෝවක් සඳහා වන නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව 2024..................... 76-76
2. කුඩා තේ වතු අංශයේ තේ නිෂ්පාදනය........................................................ 77-77
3. තේ අපනයනය හා විදේශ විනිමය ඉපයීම්........................................................ 78-78

**7. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2024.12.31 දිනට අවසන් ගිණුම් හා විගණකාධිපති වාර්තාව........................................................ - 79**

**සංඛ්‍යා සටහන්**

1. සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු හා අනුමත කාර්යමණ්ඩලය I (2024.12.31 දිනට)........ 13-13
2. සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු හා අනුමත කාර්යමණ්ඩලය II (2024.12.31 දිනට)........... 14-14
3. වර්ෂය තුළ සිදුකරන ලද උසස් කිරීම් හා බඳවා ගැනීම්........................................ 15-15
4. පුද්ගලික අංශයේ තේ නිෂ්පාදනය සහ භාණ්ඩාගාර අරමුදල් ලැබීම් 2009 – 2024.......... 28-28
5. මෙහෙයුම් සමාලෝචනය 2009 - 2024 දක්වා........................................................ 28-28
6. ආයතනයේ අපේක්ෂිත ඵලදායීතා ඉලක්ක හා කාර්ය සාධනය........................................ 31-31
7. 2020 – 2025 උපාය මාර්ගික සැලැස්මට අනුව තේ නිෂ්පාදන ඉලක්කය සහ ප්‍රගතිය ....... 33-33
8. තේ නැවත වගාව - 2023 / 2024 වර්ෂවල භෞතික කාර්යඵලය ........................................ 38-38
9. තේ නැවත වගාව පිළිබඳ ක්‍රියාකාරීත්වය (1984-2024)........................................ 39-39
10. උඩරට හා මැදරට තේ නැවත වගාව සඳහා වන නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව 2024... 40-40
11. පහතරට තේ නැවත වගාව සඳහා වන නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව - 2024.............. 41-41
12. 2024 තේ නැවත වගාවේ අවසර පත්‍ර නිකුතුව හා පැළ සිටුවීම ........................................ 42-42
13. නැවත වගා කිරීම සඳහා සහනාධාර ලබාදීම මඟින් තේ ඉඩම්වල ඵලදායීතාවයේ බලපෑම තක්සේරු කිරීම ........................................................ 42-42
14. තේ අලුත් වගාව පිළිබඳ ක්‍රියාකාරීත්වය 1983 – 2024........................................ 44-44
15. භෝග පුනරුත්ථාපනය - 2023/2024 වර්ෂයේ භෞතික කාර්යඵලය.............................. 46-46
16. භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමයෙහි ක්‍රියාකාරීත්වය (1989-2024)............................ 48-48
17. කුඩා තේ වතු සංවර්ධන සමිති ව්‍යාප්තිය........................................................ 49-49
18. ප්‍රාදේශීය කාර්යාල 08 හරහා පොහොර බෙදා හැරීම........................................ 49-49
19. සෘජු තේ වගා (රුපියල් මිලියන 750) ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුව........................ 50-50
20. සෘජු තේ වගා (රුපියල් මිලියන 750) ව්‍යාපෘතියෙහි 2024.12.31 දිනට ප්‍රගතිය.................. 51-51
21. තේ ශක්ති රක්ෂණ ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රියාකාරීත්වය........................................ 52-52
22. ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය ණය ලබාදෙන මූල්‍ය ආයතන හා ණය නිර්දේශ ලබාදීමේ ප්‍රගතිය 2024.12.31 දිනට........................................ 53-53

# පටුන

## සංඛ්‍යා සටහන්


23. වාණිජ තේ තවාන් ක්‍රියාකාරීත්වය 2023/2024 වගා කන්නය....................................... 56-56
24. ආයතනික තේ තවාන් ක්‍රියාකාරිත්වය 2024………………………………................ 58-58
25. මව් වගා මඟින් වැඩි දියුණු කල නව ප්‍රභේද රිකිලි අතු නිකුත් කිරීම - 2024……………...... 60-60
26. ව්‍යාප්ති හා උපදේශන සේවා - ඵලදායීතා වර්ධනය
(පුහුණු වැඩසටහන් සංඛ්‍යාව හා සහභාගිත්වය 2024.12.31 දිනට)................................ 61-61
27. ඒක පුද්ගල ව්‍යාප්ති කටයුතු හා පාංශු පරීක්ෂණ සංඛ්‍යාව - 2024 ප්‍රගතිය……….............. 62-62
28. සංවර්ධනාත්මක ප්‍රතිඵල සඳහා කළමනාකරණය - ප්‍රධාන කාර්යය පාදක දර්ශක - 2024... 64-64
29. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය................ 67-67
30. 2005 සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය අනුව වර්ගීකරණය..... 68-68
31. ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය සහ කැබලි සංඛ්‍යාව අනුව වර්ගීකරණය............ 68-68
32. කුඩා තේ ඉඩම් අංශයේ තේ නිෂ්පාදනය හා නිෂ්පාදන දායකත්වය (පිහිටීම මත)
2021-2024 දක්වා……………………………………………………………….... 70-70
33. කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායීතාවය පරිපාලන දිස්ත්‍රික්ක පදනමින් - 2024…................. 71-71
34. අමු තේ දළු කිලෝ ග්‍රෑමයකට ලැබුණු සාමාන්‍ය මිල හා නිෂ්පාදන පිරිවැය..................... 73-73
35. අමු තේ දළු කිලෝ ග්‍රෑමයකට ගෙවන ලද මිල……………………………..................... 74-74
36. හෙක්ටයාර එකක තේ නැවත වගාකිරීමේ පිරිවැය ඇස්තමේන්තු 2023/2024.................. 74-74
37. හෙක්ටයාර එකක් සඳහා වූ දිරිදීමනා අනුපාතිකය සහ වගා පිරිවැය……….................... 75-75


## ප්‍රස්තාර සටහන්


1. සාමාන්‍ය ඵලදායිතාවයේ වාර්ෂික ප්‍රවණතාවය............................................................ 31-31
2. තේ නැවත වගා සහනාධාර මුදල වැඩිකිරීම.................................................................... 36-36
3. නැවත වගාව සඳහා වාර්ෂිකව අයදුම් කිරීම................................................................ 36-36
4. නැවත වගා ඉලක්කය හා කාර්යඵලය………………………………………………….... 37-37
5. තේ නැවත වගා ආධාර ගෙවීම් හි වාර්ෂික ප්‍රගතිය........................................................ 37-37
6. තේ අලුත් වගා සහනාධාර මුදල වැඩි කිරීම................................................................. 43-43
7. භෝග පුනරුත්ථාපන ආධාර ගෙවීම් හි ප්‍රගතිය……................................................ ..... 47-47
8. භෝග පුනරුත්ථාපනයේ කාර්යඵලය…..........................................................................47-47
9. ප්‍රාදේශීය වශයෙන් සමිති ව්‍යාප්තිය 2024........................................................... ..... 49-49
10. මුළු තේ ඉඩම් ප්‍රමාණයට කුඩා තේ ඉඩම් හිමියන්ගේ දායකත්වය - 2005....................... 66-66
11. මුළු තේ ඉඩම් ප්‍රමාණයට කුඩා තේ ඉඩම් හිමියන්ගේ දායකත්වය. – 2024................. ..... 66-66
12. භූමි ප්‍රමාණය අනුව කුඩා තේ ඉඩම් ව්‍යාප්තිය ..................................................... 68-68
13. කුඩා තේ වතු අංශයේ මාසික තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන (2023/2024).............. 69-69
14. කුඩා තේ වතු අංශයේ වාර්ෂික තේ නිෂ්පාදන ප්‍රවණතාවය............................................ 69-69

# පළමු පරිච්ඡේදය

## 1. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සංවිධාන ව්‍යුහය හා මූලික තොරතුරු

1.1 කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

1.2 කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටු කටයුතු

1.3 සංවිධාන ව්‍යුහය හා පරිපාලනමය කටයුතු

1.4 ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කාර්යාල වල කාර්ය මණ්ඩල තොරතුරු හා සංචාරක බංගලා, නිවාඩු නිකේතන වල තොරතුරු

1.5. ප්‍රධාන සාරාංශය

1.6. කුඩා තේ වතු අංශයේ ආයෝජනයන් හා මෙහෙයුම් සමාලෝචනය

# 1. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සංවිධාන ව්‍යුහය හා මූලික තොරතුරු

## 1.1 කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

| සාමාජිකයාගේ නම | අ.ම. තනතුර | කාර්යාලීය තනතුර | ආයතනය සහ කාර්යාලීය ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| ඩී.ජී.මහීපාල මහතා (2024/01/24 (604) සිට 2024/06/28 (609) දක්වා) | සභාපති | සභාපති | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල | 077 266 2484 |
| ඒ.එච්.එම්.එල්.අබේරත්න මහතා (2024/08/06 (610) සිට 2024.09.04 (611) දක්වා) | සභාපති | සභාපති | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල | 077 310 8998 |
| වී.ජේ.සී. නිමල් උඩුගම්පොළ මහතා (2024.10.07 දින සිට මේ දක්වා ) | සභාපති | සභාපති | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල | 077 341 9498 |
| ටී.ඒ.ඩී.ඩී.ප්‍රේමරත්න මහතා | සාමාජික | අධ්‍යක්ෂ | ව්‍යාපෘති කළමනාකරණ සහ නියාමකරණ, මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යංශය | 071 534 9119 |
| ඩබ්.එම්.ඩී.ටී.වික්‍රමසිංහ මහත්මිය | සාමාජික | අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා මෙහෙයුම්) | වැවිලි කර්මාන්ත අමාතංශය, 11 වන මහළ, සෙත්සිරිපාය, අදියර II, බත්තරමුල්ල | 071 448 4264 |
| ආචාර්ය රොෂාන් රාජදුරෙයි මහතා | සාමාජික | කළමනාකාර අධ්‍යක්ෂ | කැළණි වැලි ප්ලාන්ටේෂන්ස් (පී.එල්.සී), අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10 | 077 774 3457 |
| ආචාර්ය ඩබ්.ජිනදාස මහතා | සාමාජික | සභාපති | අඩාරදෙණිය තේ කර්මාන්ත ශාලාව, මොරවක පාර, ලේල්වල, නෙළුව | 077 790 6024 |
| තුසිත අළුත්පටබැඳිගේ මහතා (2024/08/06 (610) සිට) | සාමාජික | සභාපති | ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, තලවාකැලේ | 077 775 8125 |
| ආචාර්ය ඒ.බී. රණතුංග මහතා (2024/02/22 (605) සිට) | සාමාජික | අධ්‍යක්ෂ (වැ.බ) | ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, තලවාකැලේ | 071 850 1298 |
| ආචාර්ය එම්.එස්.අනුරුද්ධ මහතා (2024/04/25 (607) සිට) | සාමාජික | අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා තේ මණ්ඩලය, අංක 574, ගාලු පාර, කොළඹ 03 | 077 228 8216 |
| ජගත් සෙනරත් පතිරණ මහතා | සාමාජික | ගරු සභාපති, සමස්ථ ලංකා කු. තේ. සං. සමි. සංවිධානය | අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල | 071 145 1163 |
| කේ.වීරසිංහ මහතා | සාමාජික | ගරු ලේකම්, සමස්ථ ලංකා කු. තේ. සං. සමි. සංවිධානය | අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල | 077 323 3297 |
| ධම්මික සොලමන් මහතා (2024/09/04 - 611) | සාමාජික | ගරු අමාත්‍යතුමාගේ වෘත්තීය සමිති නියෝජිත | අංක 26, පරණ කැස්බෑව පාර, දෙල්කඳ, නුගේගොඩ | 077 226 0000 |

**2024 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 08ක් පවත්වා ඇත.**

## 1.2 කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුව

**2024 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් පිළිබඳ තොරතුරු**

- ✓ **ටී.ඒ.ඩී.ඩී. ප්‍රේමරත්න මහතා** - **කමිටු සභාපති**
  මුදල් අමාත්‍යාංශය
- ✓ **තරංගනී වික්‍රමසිංහ මිය** - **කමිටු සාමාජික**
  වැවිලි සහ ප්‍රජා යටතල පහසුකම් අමාත්‍යාංශය
- ✓ **ආචාර්ය ඩබ්ලිව්. ජිනදාස මහතා** - **කමිටු සාමාජික**
  තේ කම්හල් හිමියන්ගේ සංගමය
- ✓ **වී. ඩී. සීතා මහත්මිය** - **නිරීක්ෂක**
  ජාතික විගණන කාර්යාලය

**සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02ක් පවත්වා ඇති අතර අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02ක් සඳහා තොරතුරු ඉදිරිපත් කරමින් සහභාගී වී ඇත.**

### 1.2.1 විගණන හා කළමනාකරණ කමිටු කටයුතු

අභ්‍යන්තර විගණන අංශය විසින් වාර්ෂික විගණන සැලැස්මට අනුව විගණන කටයුතු සැලසුම්කර අභ්‍යන්තර පාලනයේ පවතින දුර්වලතා හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට අදාල පාර්ශව වෙත දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

එසේම විගණන හා කළමනාකරණ කමිටුව විසින් පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් අවධානය යොමුකර කටයුතු කර ඇත.


1. අභ්‍යන්තර විගණන වාර්තා මඟින් අනාවරණය කර තිබූ කරුණු සමාලෝචනයට භාජනය කිරීම සහ යෝජනා ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමට කටයුතු කිරීම.
2. විගණකාධිපති වාර්තා සමාලෝචනය කිරීම සහ එමඟින් දක්වා ඇති ඌණතාවයන් නැවත ඇති වීම වැලැක්වීමද අවශ්‍ය වූ නිවැරදි කිරීම් සිදුකිරීමට පියවර ගැනීම. (කළමනාකරණ කමිටු රැස්වීම 02)
3. විගණන විමසුම් පිළිබඳ පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම.
4. පවත්නා චක්‍රලේඛ හා රෙගුලාසි අනුව කටයුතු කරන්නේද යන්න පිළිබඳව විමර්ශනය කිරීම හා අඩුපාඩු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම.
5. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විනය තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම ප්‍රමාදවීමත්, විධිමත් විනය පරීක්ෂණ හා මූලික විමර්ශන සඳහා නිලධාරීන් පත්කිරීම ප්‍රමාදවීම පිළිබඳව විමසීම් කිරීමත්, විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පරිපාලන අංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු කාලීනව විගණන හා කළමනාකරණ කමිටුව වෙත සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීමට කටයුතු කිරීම.

## 1.3 සංවිධාන ව්‍යුහය හා පරිපාලනමය කටයුතු

### 1.3.1 ප්‍රධාන කාර්යාලය හා හන්තාන පුහුණු මධ්‍යස්ථානය


**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය**

**සංවිධාන ව්‍යුහය - ප්‍රධාන කාර්යාලය සහ හන්තාන පුහුණු මධ්‍යස්ථානය**




(DMS/1714 V-II ,2017.06.22 දිනැති ලිපියෙහි සඳහන් අනුමත කාර්ය මණ්ඩලයට අනුව සහ වගකීම් බෙදී ඇති ආකාරයට සකසා ඇත )

## 1.3.2 ප්‍රාදේශීය කාර්යාල




ජ්‍යෙෂ්ඨ කළමනාකරණ

HM 1-1

මධ්‍ය කළමනාකරණ

MM 1-1

කණිෂ්ඨ කළමනාකරණ

JM 1-1

කළමනාකරණ සහකාර (තාක්ෂණික) MA 2-3 (තේ පරීක්ෂක /ව්‍යාප්ති නිලධාරී )

පොත් තබන්නා MA 2-2

කළමනාකරණ සහකාර (තාක්ෂණික– නොවන) MA 1-2

ප්‍රාථමික ශිල්පීය (රියදුරු) PL 3

ප්‍රාථමික අර්ධ ශිල්පීය (තේ තවාන් සහායක) PL 2

ප්‍රාථමික ශිල්පීය නොවන ( කාර්යාල හා ආරක්ෂක සහායක ) PL 1

(DMS/1714 V-II ,2017.06.22 දිනැති ලිපියෙහි සඳහන් අනුමත කාර්ය මණ්ඩලයට අනුව සහ වගකීම් බෙදී ඇති ආකාරයට සකසා ඇත )

## සංඛ්‍යා සටහන් අංක - 01

## 1.3.3 සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු හා අනුමත කාර්යමණ්ඩලය

| | |
|---|---|
| **1.** | අමාත්‍යාංශය/පළාත් සභාව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය |
| **2.** | දෙපාර්තමේන්තුව/SOE නම / ආයතනය/ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය |
| **3.** | ලිපිනය - අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත,බත්තරමුල්ල. |
| **4.** | අනුමත කාර්යමණ්ඩල තොරතුරු -2024.12.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු |

| තනතුර | ශ්‍රේණිය | | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| සාමාන්‍යාධිකාරී | HM2-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන) | HM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 0 | 1 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති) | HM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| කළමනාකරු මානව සම්පත් /පාලන | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 0 | 1 |
| සහකාර සාමාන්‍යාධිකාරී (සේවා) | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1* | 1* | 0 |
| කළමනාකරු (මුදල්) | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| කළමනාකරු (සංවර්ධන) | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| කළමනාකරු (සැලසුම් හා නියමුකරණ) | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 0 | 1 |
| ප්‍රාදේශිය කළමනාකරු | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 8 | 7 | 1 |
| සහකාර කළමනාකරු (සංවර්ධන) | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| සහකාර කළමනාකරු (මුදල්) | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 2 | 2 | 0 |
| සහකාර කළමනාකරු (පාලන) | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| අභ්‍යන්තර විගණක | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| සහකාර කළමනාකරු (ව්‍යාප්ති) | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| සහකාර කළමනාකරු (පුහුණු) | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| සහකාර කළමනාකරු (සැලසුම් හා නියමුකරණ) | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාප්ති) | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 8 | 3 | 5 |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන) | MM 1-1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 6 | 6 | 0 |
| | | | **37** | **28** | 9 |
| | | | 1* | 1* | 0 |
| ගිණුම් නිළධාරී | JM 1-1 | තෘතීය මට්ටම | 8 | 8 | 0 |
| අභ්‍යන්තර විගණන නිළධාරී | JM 1-1 | තෘතීය මට්ටම | 1 | 1 | 0 |
| පරිපාලන නිළධාරී | JM 1-1 | තෘතීය මට්ටම | 9 | 7 | 2 |
| කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිළධාරී | JM 1-1 | තෘතීය මට්ටම | 26 | 16 | 10 |
| පුහුණු නිළධාරී | JM 1-1 | තෘතීය මට්ටම | 1 | 0 | 1 |
| තොරතුරු තාක්ෂණ නිළධාරී | JM 1-1 | තෘතීය මට්ටම | 1 | 0 | 1 |
| තාක්ෂණික නිළධාරී | JM 1-1 | තෘතීය මට්ටම | 1 | 0 | 1 |
| | | | 47 | 32 | 15 |
| තේ පරීක්ෂක ව්‍යාප්ති නිළධාරී | MA 2-3 | ද්විතිය මට්ටම | 144 | 119 | 25 |
| පොත් තබන්නා | MA 2-2 | ද්විතිය මට්ටම | 9 | 7 | 2 |
| කළමනාකරණ සහකාර | MA 1-2 | ද්විතිය මට්ටම | 149<br>11* | 123<br>11* | 26<br>0 |
| | | | **302** | **249** | 53 |
| | | | 11* | 11* | 0 |
| රියදුරු | PL 3 | ප්‍රාථමික මට්ටම | 26<br>2* | 23<br>2* | 3<br>0 |
| සහකාර සුපවේදී | PL 2 | ප්‍රාථමික මට්ටම | 2 | 2 | 0 |
| තවාන් සහයක/තේ තවාන් සහකාර | PL 2/MA 1-2 | ප්‍රාථමික මට්ටම | 8 | 6 | 2 |
| කාර්යාල හා ආරක්ෂක සහයක | PL 1 | ප්‍රාථමික මට්ටම | 37<br>4* | 37<br>4* | 0<br>0 |
| | | | **73** | **68** | 5 |
| | | | 6* | 6* | 0 |
| **DMS/1714 V- II හා 2017.06.22 දිනැති ලිපිය මගින් අනුමත කාර්ය මණ්ඩලය එකතුව** | | | **459** | **377** | **82** |
| **දරන්නාට පුද්ගලික වන සේ අනුමැතින් ලැබී ඇති ස්ථිර තනතුරු එකතුව (පහතින් විස්තර කර දක්වා ඇත)** | | | 18* | 18* | 0 |
| **එකතුව** | | | **477** | **395** | **82** |

* ලකුණින් දක්වා ඇත්තේ දරන්නාට පුද්ගලික වන සේ අනුමැතින් ලැබී ඇති තනතුරු වේ.

අදාල තනතුරු සඳහා පහත දක්වා ඇති ලිපි මගින් අනුමැතින් ලැබී ඇත. DMS/E4/08/5/070/1 අංක සහ 2010.04.27 දිනැති ලිපිය,DMS/1714 හා 2014.07.08 දිනැති ලිපිය,DMS/1714 V -I හා 2016.08.08 දිනැති ලිපිය, DMS/1714 V -II (T) හා 2017.05.23 දිනැති ලිපිය ,DMS/1718 හා 2023.06.14 ලිපිය

## සංඛ්‍යා සටහන් අංක 02
## 1.3.4 සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු හා අනුමත කාර්යමණ්ඩලය

1. අමාත්‍යාංශය/පළාත් සභාව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
2. දෙපාර්තමේන්තුව/SOE නම / ආයතනය/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
3. ලිපිනය - අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත,බත්තරමුල්ල.
4. අනුමත කාර්යමණ්ඩල තොරතුරු -2024.12.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු

| තනතුර | සේවා තත්වය | ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | 2025.01.01 සිට 2025.12.31 දක්වා | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | බඳවා ගැනීම | උසස්වීම | Secondments | ඉල්ලා අස්වීම | තනතුරු වල නිවාඩු | සේවක සහ කිරීම | විශ්‍රාම ගැනීම | වෙනත් |
| සාමාන්‍යාධිකාරී | ජ්‍යෙෂ්ඨ කළමණාකාර | HM2-1 | 1 | 1 | | | | | | | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන) | ජ්‍යෙෂ්ඨ කළමණාකාර | HM 1-1 | 1 | 0 | | | | 1 | | | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති) | ජ්‍යෙෂ්ඨ කළමණාකාර | HM 1-1 | 1 | 1 | | | | | | | | |
| DMS/1714 V- II හා 2017.06.22 දිනැති ලිපිය මගින් අනුමත ජ්‍යෙෂ්ඨ කළමණාකාර තනතුරු උප එකතුව | | | 3 | 2 | | | | 1 | | | | |
| කළමනාකරු මානව සම්පත් /පාලන | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 1 | 0 | | | | | | | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (සේවා) | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 1* | 1* | | | | | | | | |
| කළමනාකරු (මුදල්) | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 1 | 1 | | | | | | | | |
| කළමනාකරු (සංවර්ධන) | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 1 | 1 | | | | | | | | |
| කළමනාකරු (සැලසුම් හා නියමුකරණ) | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 1 | 0 | | | | | | | | |
| ප්‍රාදේශීය කළමනාකරු | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 8 | 7 | | | | 1 | | | | |
| සහකාර කළමනාකරු (සංවර්ධන) | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 1 | 1 | | | | | | | | |
| සහකාර කළමනාකරු (මුදල්) | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 2 | 2 | | | | | | | | |
| සහකාර කළමනාකරු (පාලන) | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 1 | 1 | | | | | | | | |
| අභ්‍යන්තර විගණක | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 1 | 1 | | | | | | | | |
| සහකාර කළමනාකරු (ව්‍යාප්ති) | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 1 | 1 | | | | | | | | |
| සහකාර කළමනාකරු (පුහුණු) | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 1 | 1 | | | | | | | | |
| සහකාර කළමනාකරු (සැලසුම් හා නියමුකරණ) | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 1 | 1 | | | | | | | | |
| සහකාර ප්‍රාදේශීය කළමනාකරු (ව්‍යාප්ති) | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 8 | 3 | | | | | | | | |
| සහකාර ප්‍රාදේශීය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන) | මධ්‍යම කළමණාකාර | MM 1-1 | 6 | 6 | | | | | | | | |
| DMS/1714 V- II හා 2017.06.22 දිනැති ලිපිය මගින් අනුමත මධ්‍යම කළමණාකාර තනතුරු උප එකතුව | | | **34** | **26** | | | | 1 | | | | |
| දරන්නාට පුද්ගලික වන සේ හා වෙනත් ආකාරයන්ට අනුමැතින් ලැබී ඇති මධ්‍යම කළමණාකාර තනතුරු උප එකතුව | | | 1* | 1* | | | | | | | | |
| ගිණුම් නිළධාරී | කණිෂ්ඨ කළමණාකාර | JM 1-1 | 8 | 8 | | | | | | | | |
| අභ්‍යන්තර විගණන නිළධාරී | කණිෂ්ඨ කළමණාකාර | JM 1-1 | 1 | 1 | | | | | | | | |
| පරිපාලන නිළධාරී | කණිෂ්ඨ කළමණාකාර | JM 1-1 | 9 | 7 | 1 | | | | | | | |
| කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිළධාරී | කණිෂ්ඨ කළමණාකාර | JM 1-1 | 26 | 16 | | | | 1 | | | | 5 |
| පුහුණු නිළධාරී | කණිෂ්ඨ කළමණාකාර | JM 1-1 | 1 | 0 | | | | | | | | |
| තොරතුරු තාක්ෂණ නිළධාරී | කණිෂ්ඨ කළමණාකාර | JM 1-1 | 1 | 0 | | | | | | | | |
| තාක්ෂණික නිළධාරී | කණිෂ්ඨ කළමණාකාර | JM 1-1 | 1 | 0 | | | | | | | | |
| DMS/1714 V- II හා 2017.06.22 දිනැති ලිපිය මගින් අනුමත කණිෂ්ඨ කළමණාකාර තනතුරු උප එකතුව | | | 47 | 32 | | | | 1 | | | | 5 |
| තේ පරීක්ෂක ව්‍යාප්ති නිළධාරී | කළමනාකරණ සහකාර(තාක්ෂණික) | MA 2-3 | 144 | 119 | | | | 1 | | | 2 | 5 |
| පොත් තබන්නා | කළමනාකරණ සහකාර(තාක්ෂණික) | MA 2-2 | 9 | 7 | | | | | | | | |
| කළමනාකරණ සහකාර | කළමනාකරණ සහකාර(තාක්ෂණික නොවන) | MA 1-2 | 149 | 123 | 3 | 2 | | 3 | | | 6 | |
| | | | 11* | 11* | | | | | | | | |
| DMS/1714 V- II හා 2017.06.22 දිනැති ලිපිය මගින් අනුමත කළමනාකරණ සහකාර තනතුරු උප එකතුව | | | **302** | **249** | 3 | 2 | | 4 | | | 8 | 5 |
| දරන්නාට පුද්ගලික වන සේ හා වෙනත් ආකාරයන්ට අනුමැතින් ලැබී ඇති කළමනාකරණ සහකාර තනතුරු උප එකතුව | | | 11* | 11* | | | | | | | | |
| රියදුරු | ප්‍රාථමික(ශිල්පීය) | PL 3 | 26 | 23 | | | | | | | | |
| | | | 2* | 2* | | | | | | | | 1* |
| සහකාර සුපවේදී | ප්‍රාථමික(අර්ධ ශිල්පීය) | PL 2 | 2 | 2 | | | | | | | | |
| තවාන් සහයක/තේ තවාන් සහකාර | ප්‍රාථමික(ශිල්පීය)/කළමනාකරණ සහකාර(තාක්ෂණික නොවන) | PL 2/MA 1-2 | 8 | 6 | | | | | | | | |
| කාර්යාල හා ආරක්ෂක සහයක | ප්‍රාථමික (ශිල්පීය නොවන) | PL 1 | 37 | 37 | | | | | | | | |
| | | | 4* | 4* | | | | | | | | |
| **DMS/1714 V- II හා 2017.06.22 දිනැති ලිපිය මගින් අනුමත ප්‍රාථමික ශ්‍රේණි තනතුරු උප එකතුව** | | | **73** | **68** | | | | | | | | 1 |
| **දරන්නාට පුද්ගලික වන සේ හා වෙනත් ආකාරයන්ට අනුමැතින් ලැබී ඇති ප්‍රාථමික ශ්‍රේණි තනතුරු උප එකතුව** | | | 6 * | 6 * | | | | | | | | |
| **DMS/1714 V- II හා 2017.06.22 දිනැති ලිපිය මගින් අනුමත කාර්ය මණ්ඩලය එකතුව** | | | **459** | **377** | 3 | 2 | 0 | 7 | 0 | 0 | 8 | 11 |
| **දරන්නාට පුද්ගලික වන සේ හා වෙනත් ආකාරයන්ට අනුමැතින් ලැබී ඇති ස්ථිර තනතුරු එකතුව (පහතින් විස්තර කර දක්වා ඇත)** | | | 18* | 18* | | | | | | | | |
| මුලු එකතුව | | | **477** | **395** | 3 | 2 | 0 | 7 | 0 | 0 | 8 | 11 |

* ලකුණින් දක්වා ඇත්තේ දරන්නාට පුද්ගලික වන සේ හා වෙනත් ආකාරයන්ට අනුමැතින් ලැබී ඇති තනතුරු වේ.

අදාල තනතුරු සඳහා පහත දක්වා ඇති ලිපි මගින් අනුමැතින් ලැබී ඇත. DMS/E4/08/5/070/1 අංක සහ 2010.04.27 දිනැති ලිපිය,DMS/1714 හා 2014.07.08 දිනැති ලිපිය,DMS/1714 V - I හා 2016.08.08 දිනැති ලිපිය,DMS/1718 හා 2023.06.14 ලිපිය

## 1.3.5 පරිපාලනමය කටයුතු

### වර්ෂය තුළ සිදුකරන ලද උසස් කිරීම් හා බඳවා ගැනීම්

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමැතිය අනුව බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන පරිදි 2024 වර්ෂයේදී පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකරන ලදි.

### සංඛ්‍යා සටහන් අංක - 03

| තනතුර | බඳවා ගැනීම් |
|---|---|
| ප්‍රාදේශීය කළමනාකරු | තනතුරු 03 |
| පරිපාලන නිලධාරි | තනතුරු 03 |
| කළමනාකරණ සහකාර | තනතුරු 15 |
| තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි | තනතුරු 01 |
| **එකතුව** | **22** |

## 1.4 විධායක කාර්යය මණ්ඩලය සහ පරිපාලන දිස්ත්‍රික්ක කාර්යාල - (2024.12.31 දිනට)

### <u>ප්‍රධාන කාර්යාලය</u>

**අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල**
**දුරකථන අංක (011-790 9020/21)**
**ෆැක්ස් :- 011-278 4925/28**
**ඊ මේල් : gmtshda@gmail.com /aetshda1@gmail.com**

සභාපති : වී.ජේ.සී.නිමල් උඩුගම්පොල මහතා
සාමාන්‍යාධිකාරී : ජේ.එම්.කේ.බී. වික්‍රමසිංහ මහතා

### ව්‍යාප්ති අංශය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති) : සමන් ප්‍රියන්ත රත්නායක මහතා
සහකාර කළමනාකරු (ව්‍යාප්ති) : ප්‍රබුද්ධ පැතුම් විජේසූරිය මහතා

### සංවර්ධන අංශය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන) : පුරප්පාඩු (ආර්.ඒ. වෛද්‍යරත්න මහතා - වැ.බ)
කළමනාකරු (සංවර්ධන) : ආර්.ඒ. වෛද්‍යරත්න මහතා
සහකාර කළමනාකරු (සංවර්ධන) : ආර්.එම්.පී.ආර්. බණ්ඩාර මහතා

### සැලසුම් හා නියමුකරණ අංශය

කළමනාකරු (සැලසුම් හා නියමුකරණ) : පුරප්පාඩු (ඩබ්.ඩී.සී. ක්‍රිෂාන්ති මහත්මිය -වැ.බ)
සහකාර කළමනාකරු (සැලසුම් හා නියමුකරණ) : ඩබ්.ඩී.සී. ක්‍රිෂාන්ති මහත්මිය
තොරතුරු තාක්ෂණ නිලධාරි : පුරප්පාඩු (ජේ.එම්.වී.එන් මදුරාවෙල මහතා- වැ.බ)

### මුදල් අංශය

කළමනාකරු (මුදල්) : පී.ආර්. ඉන්දික පෙරේරා මහතා
සහකාර කළමනාකරු (මුදල්) : ආර්.ඒ.සී.ඩී.ඩී. ජයතුංග මහත්මිය
සහකාර කළමනාකරු (මුදල්) : ආර්.ආර්.ඩබ්.ඩී. රත්නායක මහත්මිය

### මානව සම්පත් හා පාලන අංශය

කළමනාකරු (මානව සම්පත් හා පාලන) : පුරප්පාඩු
සහකාර කළමනාකරු (පාලන) : ඩී.ජී. චමිල බණ්ඩාර දිද්දෙණිය මහතා
පරිපාලන නිලධාරි : ජී.පී.පී. වික්‍රමසිංහ මහත්මිය

### අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණක : ඩබ්.ඩබ්.ජේ.එල්. ප්‍රනාන්දු මහතා
අභ්‍යන්තර විගණන නිලධාරී : ඩී. දමින්ද ප්‍රියන්ජිත් මහතා

### සේවා අංශය

සහකාර සාමාන්‍යාධිකාරී (සේවා) : අමිත පැස්කුවෙල් මහතා

### ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්කය: ගාල්ල

**වලහන්දුවවත්ත, ගාල්ල**
**දුරකථන අංක : 091-720 1126**
**ෆැක්ස් : 091-224 4382 / ඊ මේල් ; tshdaga@gmail.com**


ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානය
**වලහන්දුව, ගාල්ල**
**දුරකථන අංක : 091 720 0815**

ප්‍රාදේශීය කළමනාකරු : අයි.යූ.එච්. මොහොට්ටි මහතා
සහකාර ප්‍රාදේශීය කළමනාකරු (ව්‍යාප්ති) : පුරප්පාඩු
(එන්.එම්. විජේසිංහ මහතා- රා.ආ)
සහකාර ප්‍රාදේශීය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන) : කේ.ජී. උදුල දසන්ත මහතා

කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරි : අයි.ඩී.ඩී. කුමාර මහතා
: එච්.පී. පුෂ්පකුමාරි මිය
: එස්.සී.ඩබ්. ජයසේකර මහතා
: පුරප්පාඩු
(කේ.එස්. එස්. දහනායක මහතා-වැ.බ)

පරිපාලන නිලධාරි : එච්.පී.එල්. සංජීව පුෂ්ප කුමාර මහතා
ගිණුම් නිලධාරී : කේ.ඩබ්.ඩබ්. පෙරේරා මහත්මිය

## ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ උප කාර්යාල හා තේ පරීක්ෂක ව්‍යාප්ති කොට්ඨාශ




## මාතර ප්‍රාදේශීය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්කය : මාතර, හම්බන්තොට

**අංක 31, කාලිදාස පාර, මාතර**
**දුරකථන අංක : 041-720 0799 / 041-720 0394/96**
**ෆැක්ස් : 041-222 6487 / ඊ මේල්: tshdamt@gmail.com**

### ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානය

**මොරවක, අලපලාදෙනිය**

| | |
|---|---|
| ප්‍රාදේශීය කළමනාකරු | : පී.ඒ.එන්. පුෂ්පකුමාර මහතා |
| සහකාර ප්‍රාදේශීය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන) | : ජේ.එල්. එදිරිසූරිය මහතා |
| සහකාර ප්‍රාදේශීය කළමනාකරු (ව්‍යාප්ති) | : පුරප්පාඩු |
| කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරි | : මහින්ද බටගොඩ මහතා |
| | : පුරප්පාඩු |
| | : (ජී.එල්.එච්.බී. ලොකුහේවා මහතා-වැ.බ) |
| | : පුරප්පාඩු |
| | : (එච්.එච්.එන්. සුමනසේකර මහතා-වැ.බ) |
| පරිපාලන නිලධාරී | : පුරප්පාඩු |
| | එන්.ඒ.ටී.කේ. රත්නායක මහත්මිය -වැ.බ |
| ගිණුම් නිලධාරි | : එච්.එම්.එල්. පුෂ්ප කුමාරි මහත්මිය |

## මාතර ප්‍රාදේශීය කාර්යාලයේ උප කාර්යාල හා තේ පරීක්ෂක ව්‍යාප්ති කොට්ඨාශ

**පස්ගොඩ**

දෙයියන්දර
පස්ගොඩ
දම්පහල
ඌරුබොක්ක
බෙරලපනාතර
වරාපිටිය
කිරිලිපන

**කොටපොල**

කොළවෙනිගම
දෙනියාය
කොටපොල
මොරවක
කළුබෝවිටියාන
දෑරංගල
පිටබැද්දර

**අකුරැස්ස**

කනංකේ
අකුරැස්ස
තෙලිජ්ජවිල
තිබ්බටුවාව
කැටන්විල
කඹුරුපිටිය



## රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්කය : රත්නපුර

**අංක 1/28, නව නගරය, රත්නපුර**
**දුරකථන අංක : 045-720 1243 / 045-720 1904**
**ෆැක්ස්: 045-222 8647 / ඊ මේල්: tshdarat@gmail.com**

### ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානය

**සන්නස්ගම, රත්නපුර**
**දුරකථන අංක : 045 720 1170**

| | |
|---|---|
| ප්‍රාදේශීය කළමනාකරු | : එම්.ආර්.එන්. ධම්මික මහතා |
| සහකාර ප්‍රාදේශීය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන) | : පුරප්පාඩු |
| සහකාර ප්‍රාදේශීය කළමනාකරු (ව්‍යාප්ති) | : ආර්.ඒ.එස්.එස්. රණතුංග මහතා |
| කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරී | : එම්. ඒ. අයි. අබේසේන මහතා |
| | :එම්.එච්.එල්.ආර්. මුණසිංහ මහතා |
| | : පී.එස්.කේ. පෙරේරා මහතා |
| | : වයි.ජී. හේවාවිසෙන්ති මහත්මිය (වැ.බ) |
| පරිපාලන නිලධාරී | : ධම්මිකා වෙත්තසිංහ මහත්මිය |
| ගිණුම් නිලධාරී | : ඊ.ජී.ටී.එන්. සේරසිංහ මහතා |

## රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ උප කාර්යාල හා තේ පරීක්ෂක ව්‍යාප්ති කොට්ඨාශ

**බළංගොඩ**


වැලිගෙපොල
බලංගොඩ
ඉඹුල්පේ
ඇල්ලරාව
රාස්සගල
ඕපනායක
පින්නවල

**රක්වාන**

පැල්මඩුල්ල
පොතුපිටිය
රක්වාන
කහවත්ත
කොලොන්න
මාදම්පේ

**නිවිතිගල**

රත්නපුර
නිවිතිගල
කලවාන
අයගම
වැද්දාගල
කුකුලේගම



**කුරුවිට**

එරත්න
වේවැල්වත්ත
ඇහැලියගොඩ
ගිලීමලේ
ගල්ලෑල්ල
කිරිඇල්ල

## මහනුවර ප්‍රාදේශීය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්කය : මහනුවර, මාතලේ, කුරුණෑගල


**අංක 2/7/1, ගන්නොරුව පාර, පේරාදෙණිය, මහනුවර**
**දුරකථන අංක: 081-720 0827 / 081-720 0821**
**ෆැක්ස්, 081-238 9011/ ඊ මේල් - tshdakan@gmail.com**

### ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානය

**සූරියගොඩ, මුරුතලාව**
**දුරකථන අංක : 081 720 1921**

| | |
|---|---|
| ප්‍රාදේශීය කළමනාකරු | : එස්.සී.ඊ. නාරංගස්පිටිය මහතා |
| සහකාර ප්‍රාදේශීය කළමනාකරු (ව්‍යාප්ති) | : පුරප්පාඩු |
| සහකාර ප්‍රාදේශීය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන) | : පුරප්පාඩු |
| කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරි | : පී.ජී.පී.සී. විජේසිංහ මහතා |
| | : ඩී.එස්.ජී.ජී.එස්. ස්වර්ණතිලක මහත්මිය |
| | : එච්.එම්.ජී.පී. නිල්මිණි කුමාරි මහත්මිය |
| | : එම්.ඒ.එස්. ජයදේව මහතා |
| | : පුරප්පාඩු |
| පරිපාලන නිලධාරී | : එච්.එම්.ආර්.ජේ.බී. හේරත් මහතා |
| ගිණුම් නිලධාරී | : එම්.වී.එල්. ශ්‍යාමලී ප්‍රේමසුන්දර මහත්මිය |

## මහනුවර ප්‍රාදේශීය කාර්යාලයේ උප කාර්යාල හා තේ පරීක්ෂක ව්‍යාප්ති කොට්ඨාශ




## නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්කය : නුවරඑළිය


**නව නගරය, කොත්මලේ**
**දුරකථන අංක : 052-493 0265/ 052-493 0247**
**ෆැක්ස් : 052-225 9060 / ඊ මේල් : tshdane@gmail.com**

### ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානය

**තිස්පනේ, නව තිස්පනේ**
**දුරකථන අංක : 081 720 1950**

| | |
|---|---|
| ප්‍රාදේශීය කළමනාකරු | : ඩබ්.එච්.පී.එස්. විජේතුංග මහතා |
| සහකාර ප්‍රාදේශීය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන) | : එච්.කේ.ලලිත් කුමාර මහතා |
| සහකාර ප්‍රාදේශීය කළමනාකරු (ව්‍යාප්ති) | : එස්.පී.ඒ.පී.කේ. ජයරත්න මහතා |
| කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරි | : ඒ.ටී.ඒ. ගුණවර්ධන මහතා |
| | : කේ.එච්.එම්.ජී.එස්. කුමාරි මිය |
| | : පුරප්පාඩු |
| පරිපාලන නිලධාරී | : එම්.ජී.ඩී.ඒ. පුෂ්පකුමාරි මහත්මිය |
| ගිණුම් නිලධාරී | : ඩී.එම්.එල්. නාවලගේ මහත්මිය |

## නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ උප කාර්යාල හා තේ පරීක්ෂක ව්‍යාප්ති කොට්ඨාශ




## ඌව ප්‍රාදේශීය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්ක : බදුල්ල, මොණරාගල


**නව බදුල්ල පාර, බණ්ඩාරවෙල**
**දුරකථන අංකය : 057-720 0241/ 057-720 0081**
**ෆැක්ස් : 057- 223 2237 / ඊ මේල්: uvatshda@gmail.com**

### ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානය

**බෝගහමඩිත්ත, හාලිඇල**
**දුරකථන අංක : 055 229 4363**

| | |
|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : එච්.කේ. ලලිත් කුමාර මහතා (රාජකාරි වගකීම පවරා ඇත) |
| සහකාර ප්‍රාදේශීය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන) | : එච්.කේ. ලලිත් කුමාර මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාප්ති) | : නීල් ගුණරත්න මහතා- රා.ඉ |
| කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරි | : එච්.එම්. ප්‍රේමකුමාර මහතා |
| | : ආර්.එම්.ඒ.ඩී. රත්නායක මහතා |
| | : බී.එම්.එච්.පී. අමරසිංහ මිය |
| පරිපාලන නිලධාරී | : ආර්.ඩී.සී.කේ. රණතුංග මහත්මිය |
| ගිණුම් නිලධාරී | : ඩබ්.ඩී.එම්.එම්. අමරසිංහ මහත්මිය |

## ඌව ප්‍රාදේශීය කාර්යාලයේ උප කාර්යාල හා තේ පරීක්ෂක ව්‍යාප්ති කොට්ඨාශ




## කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්ක : කෑගල්ල, ගම්පහ


**ඊරියගොල්ල, දෙහිඕවිට**
**දුරකථන අංක : 035-720 1254 / 035-720 1243**
**ෆැක්ස්: 035-223 0163 / ඊ මේල් - tshdake@gmail.com**

### ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානය

**හිඟුල**

| | |
|---|---|
| ප්‍රාදේශීය කළමනාකරු | : එච්.තරංග ද සොයිසා මහතා |
| සහකාර ප්‍රාදේශීය කළමනාකරු | : පුරප්පාඩු |
| (ව්‍යාප්ති) | : එම්.ඒ. පියසීලි මහත්මිය -රා.ආ |
| කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරි | : පී.ජී.පී.සී. විජේසිංහ මහතා |
| | : එච්.පී.ඩී.එන්. රණසිංහ මහතා |
| පරිපාලන නිලධාරි | : පී.එල්.එල්.එස්. ගුණසේකර මහතා |
| ගිණුම් නිලධාරී | : ආර්.එම්.ජේ.බී. රත්නායක මහතා |

## කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලයේ උප කාර්යාල හා තේ පරීක්ෂක ව්‍යාප්ති කොට්ඨාශ




## කළුතර ප්‍රාදේශිය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්ක : කළුතර, කොළඹ

**දඩුගොඩයා වත්ත පාර, ඉද්දගොඩ, මතුගම**
**දුරකථන අංක : 034-720 0183 / 034-720 1630**
**ෆැක්ස් : 034-224 9690 / ඊ මේල් : tshdakalu@gmail.com**

| | |
|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : ටී.එම්.එස්.එල්. ප්‍රියදර්ශක මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාප්ති) | : පුරප්පාඩු (එච්. මද්දුහෙට්ටි මහතා- රා.ආ) |
| කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරි | : එම්.ටී. අමරුවන් මහතා |
| | : ඒ.යූ. මාන්නගේ මහතා |
| පරිපාලන නිලධාරී | : කේ.එල්.ඒ. උපේන්ද්‍රානි මහත්මිය |
| ගිණුම් නිලධාරී | : පී.ජී.අයි. සුරංගිකා මහත්මිය |


## කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ උප කාර්යාල හා තේ පරීක්ෂක ව්‍යාප්ති කොට්ඨාශ

**මීගහතැන්න**

මීගහතැන්න
ඉට්ටපාන
යට්ටපාත
පැලවත්ත
බදුරලිය
හැඩිගල්ල

**හොරණ**

කෙලින්කන්ද
හොරණ
සීතාවක
අගලවත්ත
මතුගම
මහගම
බුලත්සිංහල



## රත්නසිරි වික්‍රමනායක ජාතික පුහුණු මධ්‍යස්ථානය

**5 කණුව, මැද කොටස, උඩවෙල, හන්තාන**
**දුරකථන අංක : 081-720 1760/ 081-720 1973**
**ෆැක්ස්: 081-380 0679 / ඊ මේල් : tshdantc@gmail.com**

සහකාර කළමනාකරු (පුහුණු) : එච්.කේ.ජී.අයි.එස්.බී. හපුහින්න මහතා
පුහුණු කිරීමේ නිලධාරී : පුරප්පාඩු

## සංචාරක බංගලා හා නිවාඩු නිකේතනය

### ❖ හන්තාන සංචාරක බංගලාව හා නිවාඩු නිකේතනය

**5 කණුව, මැද කොටස, උඩවෙල, හන්තාන**
**දුරකථන අංක : 081-720 1760/ 081-720 1973**
**වට්ස්ඇප් - 074 215 3886**

බංගලාවේ කාමර ප්‍රමාණය - 05 (නවාතැන් පහසුකම් - 12)
නිවාඩු නිකේතනයේ කාමර ප්‍රමාණය-16
(නවාතැන් පහසුකම් සැපයිය හැකි ප්‍රමාණය - 46)



### ❖ ගාල්ල හිංගල්ගොඩ නිවාඩු නිකේතනය

**හිංගල්ගොඩ, හිනිදුම, ගාල්ල**
**දුරකථන අංක : 077-262 4246**
බංගලාවේ කාමර ප්‍රමාණය -03 (නවාතැන් පහසුකම් - 10)



## 1.5 ප්‍රධාන සාරාංශය

### කුඩා තේ බිම් ප්‍රමාණය

2012 වසර සිට, 1975 අංක 35 දරණ කුඩා තේ වතු සංවර්ධන පනතට අනුව අක්කර 10ට අඩු කුඩා තේ බිම් ප්‍රමාණයන් සඳහා පමණක්, ඒවායේ සංවර්ධනයට සහ ඊට අදාල සහායක සේවා සැපයීම අධිකාරිය විසින් සිදු කෙරේ.

2016 වසරේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව ආරම්භ කරනු ලැබූ තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ සංගණනය පරිදි ලියාපදිංචිකළ කුඩා තේ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 157,838කි. එම සංගණන තොරතුරු පදනම්කර 2024 වසරේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය යාවත්කාලීන කරනලද තේ වගා කළ භූමි ප්‍රමාණය හෙක්ටයාර 158,247කි.

2016 වසරේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ඉඩම් ලියාපදිංචිය පරිදි කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව 418,262කි. එය 2024 වසරේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය යාවත්කාලීන කරන ලද පරිදි කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව 418,989ක් වී ඇත.

### කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය සහ ජාතික නිෂ්පාදන දායකත්වය

2024 වර්ෂයේ ජාතික තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 262.159ක් නිෂ්පාදනය කල අතර කුඩා තේ වතු අංශයේ නිමි තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 197.154ක් සිදුකර ඇත. එනම් සමස්ථ තේ නිෂ්පාදනයෙන් 75.2%ක් කුඩා තේ වතු අංශයේ දායකත්වයෙන් නිපදවා තිබුණි. කුඩා තේ වතු අංශයෙන් මෙතෙක් වාර්තා වූ උපරිම නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 247.4ක් 2014 වර්ෂයේදී ද, ජාතික තේ නිෂ්පාදනයේ උපරිමය වූ කිලෝ ග්‍රෑම් මිලියන 340.22ක් 2013 වර්ෂයේදී ද වාර්තා වී තිබුණි.

2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී ජාතික තේ නිෂ්පාදනය 2.39%කින් වැඩි වූ අතර, කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය ද 3.4%කින් වැඩි වී ඇත. කුඩා තේ වතු අංශයේ උපරිම නිෂ්පාදනය වාර්තා වූ 2014 වර්ෂයට සාපේක්ෂව 20.3%කින් පමණ නිෂ්පාදනය 2024 වර්ෂයේදී අඩු වී තිබුණි.

ගත වූ දශකයේ දත්ත පරිදි අධිකාරියෙහි සහනාධාර සහිතව වාර්ෂික සාමාන්‍ය හෙක්ටයාර 679ක පමණ භූමි ප්‍රමාණයක් වාර්ෂිකව තේ නැවත වගාවේ වගාව සිදුකර තිබේ. ගත වූ වසර 03ක ප්‍රවණතාව අනුව වාර්ෂිකව හෙක්ටයාර 445ක පමණ සාමාන්‍ය බිම් ප්‍රමාණයක් තේ නැවත වගා කිරීමද සිදුකර ඇත.

### කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය

2024 වසරේ කුඩා තේ වතු අංශයේ සාමාන්‍ය ඵලදායීතාව පෙර වර්ෂයට සාපේක්ෂව 3.39%කින් වැඩි වී තිබේ. ඒ අනුව 2024 වසරේ සාමාන්‍ය ඵලදායීතාවය හෙක්ටයාරයකට සකස්කළ තේ (නිමි තේ) කිලෝ ග්‍රෑම් 1246කි. පහත් බිම් සඳහා සාමාන්‍ය ඵලදායීතාවය සකස්කළ තේ කිලෝ ග්‍රෑම් 1,147කි. මැදිබිම් සඳහා එය සකස්කළ තේ කිලෝ ග්‍රෑම් 1,882ක් වූ අතර, උස්බිම් සඳහා සකස් කළ තේ කිලෝ ග්‍රෑම් 1,644ක් ද විය.

### තේ නැවත වගා බිම් ප්‍රමාණය සහ නැවත වගා ප්‍රතිශතය

උපරිම ඵලදාවක් ලබමින් තේ වගා භූමි ප්‍රමාණය ස්ථායීව පවත්වා ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්තිය අනුව වසරකට 2%ක තේ භූමි ප්‍රමාණයක් නැවත වගා කල යුතුව ඇත. ඒ අනුව තේ මණ්ඩලයේ 2024 ඉඩම් ලියාපදිංචියේ දක්වා ඇති ඉඩම් ප්‍රමාණයට අනුව කුඩා තේ ඉඩම් අංශයෙන් වාර්ෂිකව තේ නැවත වගා කලයුතු භූමි ප්‍රමාණය හෙක්ටයාර 3,164ක් පමණ වේ.

### තේ නැවත වගාව

2024 වසරේ තේ නැවත වගා කිරීම හෙක්ටයාර 388 ක් ඉලක්ක කරනු ලැබූ අතර හෙක්ටයාර 412.2ක් තේ වගාව සිදුකිරීමට හැකි වී ඇත. මේ අනුව 2024 වසරේ තේ නැවත වගා ඉලක්කයට සාපේක්ෂව ප්‍රගති ප්‍රතිශතාත්මකව 106%කි.

### තේ නැවත වගාව 2024 (This Year Planting)

පෙර වර්ෂ වලදී තේ නැවත වගා කිරීම සඳහා ඉඩම් සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කර පස පුනරුත්ථාපනයද සිදුකර තේ පැළ සිටුවා නොමැති ඉඩම් හඳුනාගනිමින් එම ඉඩම්වල තේ පැළ සිටුවීම සඳහා හෙක්ටායාර 195ක් තෝරා ගනිමින් ඒ සඳහා පැළ ලබාදීම සිදුකර ඇත.

### තේ නැවත වගා සහනාධාර ලබා දීමේ බලපෑම තක්සේරු කිරීමේ සමීක්ෂණය

රාජ්‍ය සහනාධාර මත කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ සිදු කරන ලද තේ නැවත වගාව අස්වැන්න කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ නියැදි සමීක්ෂණයක් සිදු කිරීම මෙමඟින් සිදුකෙරේ.

### තේ අලුත් වගාව

මෙම සහනාධාර ක්‍රමවේදය 2024 වර්ෂයේ ක්‍රියාත්මක නොවිය.

## භෝග පුනරුත්ථාපනය

නිර්දේශිත පරිදි කප්පාදුව, පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතය සහ සෙවන පාලනය සමඟ ඒකාබද්ධව තේ ඉඩම්වල පාළු සිටුවීම මෙම වැඩසටහන මඟින් සිදුකෙරේ. ඒ අනුව 2024 වසරට තේ පැළ 2,000,000ක් පාළු සිටුවීම සඳහා ඉලක්ක කරනු ලැබූ අතර 2,013,098ක් පාළු පැළ සිටුවීම නිමකර තිබුණි. 2024 වසරේ පාළු පැළ සිටුවීම ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතියේ ප්‍රතිශතය 100.6%කි.

## කුඩා තේ වතු සංවර්ධන සමිති

ප්‍රාදේශීය සමිති සංවිධාන 8ක් සහ සමස්ත ලංකා සමිති සංවිධානයකින් යුතු කුඩා තේ වතු සංවර්ධන සමිති ජාලය 1989 වර්ෂයේ ආරම්භකර නීතිගත සංවිධාන බවට පත්කර තිබිණි. 2024 වසර අවසානය වන විට ලියාපදිංචි වූ කුඩා තේ වතු සංවර්ධන සමිති සංඛ්‍යාව 1,497කි. සාමාජික සංඛ්‍යාව 287,407කි.

## ව්‍යාප්ති හා උපදේශන සේවා

කුඩා තේ ඉඩම්වල ඵලදායිතාවය වර්ධනය කිරීම, මූලික වශයෙන් දළු ගුණාත්මය වර්ධනය කිරීම හා තේ පාදක ගොවිපළ කළමනාකරණය අරමුණු කර ගනිමින් විවිධ ව්‍යාප්ති හා උපදෙස් සේවා සැපයීම සඳහා කණ්ඩායම් ව්‍යාප්ති වැඩසටහන් 3,312ක් ඉලක්කකර තිබූ අතර එයින් 3,478ක් සිදුකර ඇති අතර එහි ප්‍රගතියේ ප්‍රතිශතය 105%ක් වේ. මෙම වැඩසටහන් සඳහා ගොවි සහභාගීත්වය 68,120ක් ඉලක්කකරනු ලැබූ අතර, සහභාගී වූ ගොවීන් සංඛ්‍යාව 76,904කි. එහි ප්‍රගතියේ ප්‍රතිශතය 112.8%කි.

ඒකපුද්ගල ව්‍යාප්ති වැඩසටහන් 24,840ක් 2024 වසරට ඉලක්කකර තිබූ අතර, ඉන් වසර අවසන්වන විට ඒක පුද්ගල ව්‍යාප්ති ගොවි හමුවීම් 25,111ක් සිදු කර ඇති අතර එය වාර්ෂික ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය 101%ක් වේ.

## වගා ආදර්ශන

සෑම සේවා කොට්ඨාශයකම අක්කර 1/2ක ඉඩමක් තෝරා ගෙන එක් තේ පරීක්ෂක ව්‍යාප්ති කොට්ඨාශයකට තේ වගා ආදර්ශන ඉඩම් 06 බැගින් ක්ෂේත්‍ර ගොවි පුහුණු පාසැල් ලෙස සංවර්ධනය කිරීමට වගා ආදර්ශන 828ක් හඳුනාගන ඇත. වගා ආදර්ශන තේ පරීක්ෂක ව්‍යාප්ති නිළධාරීන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ වගා කටයුතු සිදුකරන අතර තේ වගා ඉඩම්හි යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම සිදු කර ඇත.

## ආයතනික තේ තවාන්

ගුණාත්මක තේ පැළයක් ගොවීන්ට ලබාදීම සඳහා හන්තාන ජාතික පුහුණු මධ්‍යස්ථානයේ හා ප්‍රාදේශීය කාර්යාල හයක් ආවරණයවන පරිදි තේ පැළ තවාන් 10ක් පවත්වාගෙන ගොස් තේ පැළ 1,071,045ක් වසරතුළ නිෂ්පාදනය කරනලදී.

## මව් වගා

තේ නිෂ්පාදනය සහ ඵලදායිතාව වර්ධනය කර ගැනීම සඳහා ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ගොවීන් වෙත සැපයීම, අරමුණුකර ගාල්ල, හන්තාන, මහනුවර, නුවරඑළිය, කෑගල්ල හා ඌව යන ප්‍රාදේශීය කාර්යාලවලට අයත් ප්‍රදේශවල මව් වගා ස්ථාපනයකර ඇත.

## ආයතනික සේවක පුහුණු වැඩසටහන් පැවැත්වීම

2024 වර්ෂය තුළ දී පැවැත්වූ පුහුණු වැඩසටහන් ප්‍රමාණය 10ක් වන අතර ඒ සඳහා මුළු වියදම රුපියල් මිලියන 2.704ක් වේ.

## ආයතනික ප්‍රාග්ධනය

2024 වර්ෂයේ ආයතනික ප්‍රාග්ධනය ලෙස රු.මි. 50ක් වෙන් කර ඇති අතර එම මුදලින් අත්‍යවශ්‍ය ආයතනික ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු ආයතනික උපකරණ මිල දී ගැනීම් හා වාහන අලුත් වැඩියා කටයුතු සඳහා රු.මි. 22.014ක් වියදම් කර ඇත.

## සෘජු තේ වගාව

2023 වර්ෂයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූල්‍ය දායකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද සෘජු තේ වගා ව්‍යාපෘතිය 2024 වර්ෂයේ ද ක්‍රියාත්මක කරන ලදි.

## පොහොර බෙදා දීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා රාජ්‍ය පොහොර සමාගම යන ආයතනය එක්ව කුඩා තේ වතු හිමියන් වෙත ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ එක් පොහොර 50kgක බෑගයක් සඳහා රු.4,000ක සහනාධාර යටතේ මිශ්‍ර පොහොර ගොවීන් වෙත බෙදාදීම සිදුකර ඇත.

## අස්වැන්න හා දළු ප්‍රමිතිය වැඩි කිරීමේ කම්හල් පාදක ව්‍යාප්ති වැඩසටහන්

2024 වර්ෂයේ ව්‍යාප්ති පුහුණු වැඩසටහන් අතුරින් දළු අස්වැන්න හා දළු ප්‍රමිතිය වැඩි කිරීම සඳහා කර්මාන්තශාලා පාදක වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී.

## "දල්ලකින් වෙනසක්" ඉඩම් සංවර්ධන වැඩසටහන

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා සී.අයි.සී සමාගම සමඟ රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව වැඩසටහනක් ලෙස 2024.01.12 දින සිට ආරම්භ කරන ලද මෙම වැඩසටහන මඟින් ගාල්ල, මාතර හා රත්නපුර යන ප්‍රාදේශීය කාර්යාලවල තේ ඉඩම් 4,000ක් ආදර්ශ තේ ඉඩම් ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී.

## "දල්ලක ආශ්චර්යය" තේ ඉඩම් සංවර්ධන වැඩසටහන

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා බ්‍රවුන්ස් සමාගම සමඟ රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව වැඩසටහනක් ලෙස 2024 අගෝස්තු 01 දින ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන කළුතර, මහනුවර, නුවරඑළිය, කෑගල්ල හා ඌව යන ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශ වල තෝරා ගත් කුඩා තේ ඉඩම් හිමියන් 5,000ක ගේ ඉඩම් සංවර්ධනය කිරීමට සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.

## කාබනික තේ වගාව ප්‍රචලිත කිරීම

වැවිලි අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා JICA ආයතනය හා PARCIC යන ආයතන සමඟ ක්‍රියාත්මක පරිසර හිතකාමී තේ වගාව යටතේ කාබනික තේ වගාව ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් මාතර ප්‍රාදේශීය කාර්යාලයේ දෙනියාය ප්‍රදේශය පාදක කරගනිමින් ක්‍රියාත්මක කරන ලදී.

## තේ ගොවි හා තේ පරීක්ෂක /ව්‍යාප්ති නිලධාරී අනුපාතිකය

ඵලදායී ව්‍යාප්ති සේවාවන් සඳහා තිබිය යුතු ව්‍යාප්ති කාරක සහ ගොවි සංඛ්‍යාවේ අනුපාතිකය 1:1000ක් වුව ද, 2024 වසරේ කුඩා තේ වතු අංශයේ ක්ෂේත්‍ර නිළධාරී හා තේ ගොවි අනුපාතිකය 1:2910කි. මේ අනුව ආවරණ ගොවි සංඛ්‍යාව පහත හෙළීම සඳහා නිලධාරී සංඛ්‍යාව වැඩිකලයුතු මුත් ආයතනයේ ප්‍රතිපාදන හා පිරිවැය සීමා තත්ත්වයන් සැලකිල්ලට ගෙන එසේ වැඩි කිරීම අසීරු වේ. එබැවින් සේවා සැපයීම් කටයුතු වලදී කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානවල සහාය ලබාගැනීමට ආයතනය විසින් කටයුතු කරන ලදී.

## අමු දළු සඳහා මිල

2024 වසරේ ජාතික උච්චත්ව සාමාන්‍ය අගයන් පරිදි ශ්‍රී ලංකා තේ වෙන්දේසි වෙළඳපළ මිල ගණන් අනුව උඩරට අමු දළු තේ කිලෝ ග්‍රෑමයක් සඳහා ගෙවනු ලැබූ මිල රුපියල් 166.95කි. මැදරට අමු දළු කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 155.67ක් ද, පහත රට, අමු දළු කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 190.75ක් ද සියළු බිම් සඳහා ජාතික උච්චත්ව සාමාන්‍ය අගය අමු දළු කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 179.16ක් ද ගෙවා තිබුණි.

## හන්තාන රත්නසිරි වික්‍රමනායක ජාතික පුහුණු කිරීමේ මධ්‍යස්ථානය හා සංචාරක බංගලාව සහ නිවාඩු නිකේතනය

ආසියානු සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ 1994 වර්ෂයේ ජූලි මාසයේ දී ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් මිලදීගෙන පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමෙන් පසු 2000.08.13 වන දින විවෘත කරන ලදි. මහනුවර දිස්ත්‍රික්කයේ හන්තාන ප්‍රදේශය අක්කර 25ක භූමි ප්‍රමාණයකින් සමන්විතව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ "රත්නසිරි වික්‍රමනායක ජාතික පුහුණු කිරීමේ මධ්‍යස්ථානය" පිහිටා ඇත.

## 1.6 කුඩා තේ වතු අංශයේ ආයෝජනයන් හා මෙහෙයුම් සමාලෝචනය

### 1.6.1 ආයෝජනයන්

2024 වර්ෂයේ සංවර්ධන හා ආයතනික ප්‍රාග්ධන පිරිවැය ලෙස රුපියල් මිලියන 550ක් වෙන් වූ අතර එම රුපියල් මිලියන 550ක් සඳහා ක්‍රියාත්මක සැලැස්ම පිළියෙල කරන ලදී. පුනරාවර්ථන වියදම් ලෙස රුපියල් මිලියන 488.422ක ප්‍රතිපාදනයක් අනුමත වී ඇත.

### සංඛ්‍යා සටහන් අංක - 04
### පුද්ගලික අංශයේ තේ නිෂ්පාදනය සහ භාණ්ඩාගාර අරමුදල් ලැබීම් 2009 – 2024

| වර්ෂය | සමස්ත තේ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් මිලියන) | සමස්ත නිෂ්පාදන දායකත්වය% | | පුද්ගලික අංශය (කුඩා තේ ඉඩම් අංශය) සඳහා ප්‍රතිපාදිත මුදල (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| | | පුද්ගලික අංශය | අනෙකුත් අංශ | |
| 2009 | 291.13 | 69.3 | 24.8 | 367.80 |
| 2010 | 331.42 | 69.4 | 23.8 | 394.93 |
| 2011 | 327.53 | 69.9 | 30.1 | 391.59 |
| 2012 | 326.27 | 71.4 | 28.6 | 418.83 |
| 2013 | 340.02 | 72.2 | 27.8 | 520.14 |
| 2014 | 338.03 | 73.1 | 26.9 | 742.94 |
| 2015 | 328.96 | 72.9 | 27.1 | 969.72 |
| 2016 | 292.57 | 74.5 | 25.5 | 1,009.45 |
| 2017 | 307.72 | 75.5 | 24.5 | 784.45 |
| 2018 | 303.94 | 75 | 25 | 850.02 |
| 2019 | 300.13 | 75.21 | 24.05 | 800.00 |
| 2020 | 278.49 | 74.8 | 25.2 | 1,127.00 |
| 2021 | 299.338 | 74.56 | 25.44 | 1,400.00 |
| 2022 | 251.499 | 75.44 | 24.56 | 740.00 |
| 2023 | 256.039 | 74.47 | 25.53 | 850.00 |
| 2024 | 262.159 | 75.20 | 24.80 | 550.00 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩල තොරතුරු

## 1.6.2 මෙහෙයුම් සමාලෝචනය

2024 වසරේ ක්‍රියාකාරී සැලැසුමේ ඇතුලත් ප්‍රාග්ධන පිරිවැය ලෙස රුපියල් මිලියන 398.365ක් ද, පසුගිය වසරේ ඇති කරගත් බැදීම් සඳහා රුපියල් මිලියන 112.96ක මුදලක් ද ඇතුලුව රුපියල් මිලියන 511.325ක් සංවර්ධන කාර්යන් සඳහා වියදම්කර ඇත. වර්ෂයේ පුනරාවර්ථන වියදම රුපියල් මිලියන 477.92 වන ගෙවීම්ද ඇතුලු වර්ෂයේ සිදු කරනලද කාර්යයන්හි සමස්ථ මූල්‍ය වටිනාකම රුපියල් මිලියන 989.246 කි.

2023 වර්ෂයේ (ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් ප්‍රාග්ධන පිරිවැය ලෙස 628.518ක හා පසුගිය වසරේ ඇතිකර ගත්බැදීම් සඳහා වියදම රුපියල් මිලියන 100ක් ද ඇතුලුව) ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 728.518ක් විය. 2024 වසරේ ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 511.325කි. ඒ අනුව 2024 වසරේ ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 217.193කින් අඩු වී ඇති අතර එය 2023 වර්ෂය හා සැසඳීමේ දී 29.81%ක අඩුවීමකි.

2023 වසරේ පුනරාවර්ථන වියදම රුපියල් මිලියන 436.517ක් වූ අතර ඒ හා සැසඳීමේදී 2024 වසරේ එය රුපියල් මිලියන 41.403 ක වැඩිවීමක් ඇත. එය පසුගිය වසරට සාපේක්ෂව 9.48%කින් වැඩිවීමකි.

### සංඛ්‍යා සටහන් අංක - 05
### මෙහෙයුම් සමාලෝචනය 2009 - 2024 දක්වා

| වර්ෂය | සංවර්ධන පිරිවැය රුපියල්'000 | මෙහෙයුම් පිරිවැය රුපියල්'000 | සංවර්ධන රුපියලක් සඳහා මෙහෙයුම් පිරිවැය (ශත) |
|---|---|---|---|
| 2009 | 185,660 | 202,146 | 1.08 |
| 2010 | 189,194 | 205,385 | 1.08 |
| 2011 | 208,407 | 218,527 | 1.04 |
| 2012 | 276,324 | 233,738 | 0.85 |
| 2013 | 440,060 | 238,823 | 0.54 |
| 2014 | 345,104 | 252,774 | 0.73 |
| 2015 | 561,490 | 303,435 | 0.54 |
| 2016 | 561,868 | 314,547 | 0.56 |
| 2017 | 643,092 | 337,053 | 0.52 |
| 2018 | 632,165 | 380,054 | 0.66 |
| 2019 | 628,899 | 410,034 | 0.65 |
| 2020 | 752,760 | 421,121 | 0.55 |
| 2021 | 1,176,711 | 441,656 | 0.38 |
| 2022 | *1,671,472 | 536,517 | 0.27 |
| 2023 | *728.518 | 432.479 | 0.35 |
| 2024 | *511.325 | 477.92 | 0.93 |

මූලාශ්‍රය: කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා
*ව්‍යාපෘති පිරිවැයද ඇතුළුව සංවර්ධන පිරිවැය
* 2024 වර්ෂයේ පෙර වර්ෂයේ ඇතිකරගත් බැදීම් සඳහා වන වියදම්ද ඇතුලත් වේ.

# දෙවන පරිච්ඡේදය

## 2. ආයතනයේ මූලික කාර්යයන්

2.1 ආයතනය හා කාර්යභාර්ය

2.2 ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ ප්‍රතිඵලපාදක කළමනාකරණ උපාය මාර්ග හා සංවර්ධනාත්මක ප්‍රතිඵල

2.3 2021-2025 උපාය මාර්ගික සැලැස්ම

2.4 ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම හා ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

2.5 දීර්ඝ කාලීන සංවර්ධනයට දායකවන සේවක ක්‍රියාකාරකම්

# 2. ආයතනයේ මූලික කාර්යයන්

## 2.1 ආයතනය හා කාර්යභාරය

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරණ කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ, 1977 පෙබරවාරි මස 01 වන දින කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදී.

අනතුරුව ප්‍රධාන ප්‍රඥප්තියට සංශෝධන එකතුකර 1991 අංක 36 දරණ පනත, 1997 අංක 21 දරණ පනත, 2003 අංක 34 දරණ පනත සහ 2006 අංක 42 දරණ පනත සම්මතකර තිබේ.

### පරමාර්ථ

කුඩා තේ ඉඩම් සංවර්ධනය කිරීම, නිෂ්පාදනය වැඩි කිරීම, ඵලදායීතාවය වර්ධනය කිරීම, දළු අලෙවි කටයුතු සහ කුඩා තේ ඉඩම් හිමියන්ගේ සුභසිද්ධිය පිණිස කටයුතු කිරීම ආයතනයේ පරමාර්ථය වේ.

### පනතට අනුව අධිකාරියේ කාර්යභාරය

1. කුඩා තේ වතුවල සහ තමන්ගේම නිෂ්පාදන මාර්ග නොමැති වෙනත් තේ වතුවල ද සංවර්ධනයට අනුබල දීම හෝ සංවර්ධනය කිරීමට භාර ගැනීම.
2. එම තේ ඉඩම්වල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය තේ කර්මාන්තශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම හෝ සංවර්ධනය කිරීම.
3. මෙම තේ ඉඩම්වල හෝ එකී කර්මාන්තශාලා වල කෙරෙන නිෂ්පාදන අලෙවිය දියුණුකිරීම හෝ අලෙවි කිරීම භාරගැනීම.
4. එකී ඉඩම් හා කර්මාන්තශාලා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වියහැකි පහසුකම් සහ සේවාවන් සපයාදීම හෝ ලබාදීම සඳහා නැතහොත් එම පහසුකම් සහ සේවාවන් ලබාදීම පහසුකිරීම සඳහා ද, එම ඉඩම්වල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීමෙහි හෝ ඒවා ඇසුරුම් කිරීමෙහි යෙදී සිටින්නන්ට ව්‍යවස්ථාපිත හිමිකම් සහ පාරිශ්‍රමික ගෙවීමද ඇතුලත්ව ඔවුන්ගේ සුභසිද්ධිය සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම.
5. කුඩා තේ වතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම හා පාලනය කිරීමට සහ අධිකාරිය වෙත ලියාපදිංචිකර ඇති එවැනි සමිතිවල සාමාජිකයන්ට ආධාර ලබාදීම සහ ඒ හා සම්බන්ධ කාරණා සඳහා රීති සෑදීමට විධිවිධාන සැලසීම.
6. කුඩා තේ වතුවල ආයෝජනය ප්‍රවර්ධනය කිරීම.
7. දත්ත එකතු කිරීමට හා බෙදාහැරීමට භාරගැනීම සහ කුඩා තේ වතුවල සංවර්ධන හැකියාව දැන ගැනීම.
8. උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යාංශයට උපදෙස්දීම සහ වෙනත් අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

ඉහත සඳහන් අංක 2,3,4 හි කාර්යභාර්යන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පනතින් ඉවත්කිරීමට සහ වෙනත් කාර්යයන් ආදේශ කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පැවතුණි.

මීට අමතරව 1978 ජනවාරි 01 වන දින සිට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වරින් වර පවරනලද කාර්යයන් සහ අනෙකුත් අදාළ පහත සඳහන් සෙසු කාර්යයන් ද ඇතුලත්වන පරිදි අධිකාරිය විසින් කටයුතු කරගෙන යන ලදී.

1. පෞද්ගලික අංශයේ කළමනාකාරීත්වය යටතේ පවත්නා ඉඩම් සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් ආධාර ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම.
   a. තේ නැවත වගාව
   b. අලුත් වගාව
   c. පාළු සැපයීම
2. තේ පොහොර බෙදා හැරීම, වැවිලි ද්‍රව්‍ය, උපකරණ හා ප්‍රවාහන පහසුකම් ලබාදීම වැනි උපකාරක සේවාවන් ක්‍රියාත්මක කිරීම.
3. ව්‍යාප්ති හා උපදේශක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

## 2.2 ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ ප්‍රතිඵලපාදක කළමනාකරණ උපායමාර්ග හා සංවර්ධනාත්මක ප්‍රතිඵල

ව්‍යවස්ථාපිත අරමුණු ඉටුකිරීම පිණිස ප්‍රතිඵල පාදක කළමනාකරණ ප්‍රවේශය ආයතනික උපායමාර්ගය වේ. ඒ යටතේ 2020 වසර සිට 2025 වසර දක්වා හඳුනාගත් මධ්‍යකාලීන ප්‍රතිඵල අරමුණුකර ගෙන වාර්ෂික ක්‍රියාත්මක සැලසුම් තුලින් ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ආයතනය කටයුතුකර ඇත.
ඒ සඳහා ප්‍රධාන මිණුම් දණ්ඩ ලෙස කුඩා තේ වතු අංශයේ හෙක්ටයාරයක (නිමි තේ කිලෝග්‍රෑම්) ඵලදායීතාවය ප්‍රමුඛතම කාර්යඵල දර්ශකය ලෙස සලකා තිබේ. ඒ අනුව උස් බිම්, මැදිබිම් හා පහත් බිම් සාමාන්‍ය ඵලදායීතාවය සඳහා වාර්ෂික ඉලක්ක ක්ෂේත්‍ර කාර්යමණ්ඩලයට හඳුන්වා දීමෙන් ප්‍රතිඵල සාක්ෂාත්කර ගැනීමට ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවනු ලැබුණි. (2024 වසරට තේ භෝගය සඳහා හඳුනාගෙන ඇති ජාතික ඉලක්කය හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම් 2,307කි.) 2024 වර්ෂයේ කාර්යඵල සාර්ථකත්වය මැනීම සඳහා වූ ප්‍රධානම සංවර්ධන ඉලක්ක හා කාර්යඵල සාර්ථකත්වය පහත දක්වා ඇත. 2024 වසරේ ඵලදායීතාවය මැනීම සඳහා භාවිතාකර ඇත්තේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ඉඩම් ලියාපදිංචියට අනුව යාවත්කාලීන කරන ලද ඉඩම් තොරතුරු වේ.

## සංඛ්‍යා සටහන් අංක 06

### ආයතනයේ අපේක්ෂිත ඵලදායිතා ඉලක්ක හා කාර්ය සාධනය (හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම් වසරකට)


| ප්‍රදේශය | 2022 | | | 2023 | | | 2024 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය (කි.ග්‍රෑ) | කාර්යඵලය (කි.ග්‍රෑ) | % | ඉලක්කය (කි.ග්‍රෑ) | කාර්යඵලය (කි.ග්‍රෑ) | % | ඉලක්කය (කි.ග්‍රෑ) | කාර්යඵලය (කි.ග්‍රෑ) | % |
| පහත රට | 2,500 | 1,115 | 45% | 2,500 | 1,117 | 45% | 2,500 | 1,147 | 46% |
| මැද රට | 1,700 | 1,773 | 104% | 1,700 | 1,747 | 103% | 1,700 | 1,882 | 111% |
| ඌව | 1,600 | 1,540 | 96% | 1,600 | 1,634 | 102% | 1,600 | 1,644 | 103% |
| සාමාන්‍යය | **2,307** | **1,200** | **52%** | **2,307** | **1,205** | **52%** | **2,307** | **1,246** | **54%** |

* මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව.

* 2024 වර්ෂයේ කාර්යඵලය ගණනය කරන ලද්දේ 2016 වර්ෂයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ඉඩම් ලියාපදිංචියට අනුව. 2024 වර්ෂයේ යාවත්කාලීන කරන ලද තේ ඉඩම් ලියාපදිංචි තොරතුරු පදනම්කර ගෙනයි.

## ප්‍රස්තාර සටහන් අංක 01

### සාමාන්‍ය ඵලදායීතාවයේ වාර්ෂික ප්‍රවණතාවය (වසරකට හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම්)




* මූලාශ්‍රය- 2005 කුඩා තේ වතු ඉඩම් සංගණනය.

* 2016 වර්ෂයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ඉඩම් ලියාපදිංචියට අනුව 2023/2024 යාවත්කාලීන කරන ලද තේ ඉඩම්. ප්‍රමාණය පදනම්කර 2024 වසරේ තේ නිෂ්පාදනය 2024 වර්ෂයේද ඵලදායීතාවයව ගණනය කර ඇත.

### 2.2.1 සංවර්ධන සැලසුම්

1. වසර 03 ක දී වසරකට/ හෙක්ටයාරයකට/ සකස් කල තේ/ කිලෝ ග්‍රෑම්
   a. පහත රට 2,500 දක්වා
   b. මැද රට 1,700 දක්වා
   c. ඌව 1,600 දක්වා වැඩි කිරීම හා වාර්ෂිකව තේ ඉඩම්වලින් 10%ගේ තේ ඉඩම්වල යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරවීම.
2. වසර 3 කදී කම්හල් මට්ටමින් අමු දළු ගුණාත්මය 60% දක්වා වර්ධනය කිරීම.
3. කුඩා තේ වතු සංවර්ධන සමිති 1,497 න් 25%ක් A”ශ්‍රේණියේ සමිති ලෙස ප්‍රජා මූල සංවර්ධනය කිරීම.
4. සියළුම සේවක ක්‍රියාකාරකම් ආයතනයේ දීර්ඝ කාලීන සංවර්ධනයට දායකවන ලෙස වෘත්තීය පුහුණු ක්‍රියාවලියක් ඇතිකිරීම.
5. තේ ඉඩම්වලින් 10% අමතර ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා යොමු කරවීම.

### 2.2.2. සංවර්ධන සැලසුම් ඉටුකර ගැනීමේ උපායමාර්ග

**කෙටි කාලීන උපාය මාර්ග**

- දළු නෙළීම සම්බන්ධව පුහුණු වැඩසටහන් තුළින් තේ නිෂ්පාදනය 7%කින් වර්ධනය කිරීම
- පොහොර භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් දැනුවත්කර 8%කින් තේ අස්වැන්න වර්ධනය කිරීම
- පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් ගොවීන් දැනුවත්කර ගොවීන්ට අවශ්‍ය ඩොලමයිට් සමිති හරහා නිකුත් කිරීම තුළින් මෙන්ම නොමිලේ ඩොලමයිට් ලබාදීමෙන් 6%කින් තේ අස්වැන්න වර්ධනය කිරීම

**මධ්‍ය කාලීන උපාය මාර්ග**

- නිවැරදිව තේ කප්පාදුව සිදුකිරීමට පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් තේ නිෂ්පාදනය 6%කින් වසර තුනකදී වැඩි කිරීම
- පාළු පැළ සිටුවීම තුළින් තේ අස්වැන්න 20% කින් වසර තුනකදී වර්ධනය කිරීම
- විසිරි ජල පද්ධති සවිකිරීම මඟින් තේ නිෂ්පාදන ඵලදායිතාව වැඩි කිරීම හා ඒ සඳහා පුහුණු වැඩසටහන් සිදු කිරීම. එමඟින් තේ නිෂ්පාදනය 30% කින් වසර තුනකදී වැඩි කිරීම

**දිගු කාලීන උපාය මාර්ග**

- නැවත වගාව බිම් ප්‍රමාණය වැඩිකිරීම මඟින් දළු නිෂ්පාදනය 65%කින් වසර 5කදී වැඩි කිරීම
- අළුත් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම මඟින් තේ නිෂ්පාදනය 70%කින් වසර 5කදී වැඩි කිරීම
- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සම්බන්ධව දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් තේ නිෂ්පාදනය 5%කින් වර්ධනය කිරීම්
- සෙවන කලමනාකරණය සඳහා සෙවන පැළ නොමිලේ ලබා දීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් තේ නිෂ්පාදනය 3%කින් වසර පහකදී වැඩිකිරීම

### 2.2.3 ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ සංවර්ධන කාර්යයන්

ආයතනය ස්ථාපිත කිරීම සඳහා වූ පනතට පදනම්ව පැවති ප්‍රධාන ව්‍යවස්ථාපිත අරමුණු 4 ට අනතුරුව වර්ෂ 1997, 2003 හා 2006 යන වර්ෂවලදී පනතට එකතුකරන ලද සංශෝධන පරිදි ආයතනයෙහි ව්‍යවස්ථාපිත අරමුණු හා ඊට අදාළ සංවර්ධන කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කර ඇත.

### 2.3 2021 - 2025 උපාය මාර්ගික සැලැස්ම

තිරසාර තේ කර්මාන්තයක් ඇති කිරීම සඳහා නිෂ්පාදන වියදම් අඩුකර ගැනීම, අවම ශ්‍රමයක් උපයෝගීකර කම්කරු අවශ්‍යතා සපුරා ගැනීම, පාරම්පරික ක්‍රමයෙන් බැහැරව අස්වැන්න නෙලාගැනීම, තේ නිෂ්පාදන ආන්තිකය ඉහළ දැමීම පදනම්කර වැවිලි අමාත්‍යාංශය විසින් 2020 වසරේ සකස් කල 2021-2025 පස් අවුරුදු සැලැස්ම අනුව තේමා 05 ක් ඔස්සේ තේ වතු හිමියන්ට උපදේශන සේවා හා අනෙකුත් සේවා සැපයීම අරමුණු කර උපාය මාර්ගික සැලැස්ම පිළියෙල කර ඇත.

ප්‍රධාන සංවර්ධන අරමුණු දෙකක් අරමුණුකර එම තේමා 05 ඉටුකර ගැනීමට පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සකස්කර ඇත.

වාර්ෂික නිමි තේ නිෂ්පාදනය 2025 වන විට කිලෝ මිලියන 360 දක්වා වැඩි කිරීම.

ආයතනයේ අපේක්ෂිත දිගුකාලීන සංවර්ධන ප්‍රතිඵලය **"කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්ත්වය නංවාලීම "** ලෙස හඳුනාගෙන ඇත.

ඒ අනුව තේ ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා සකස්කල 2021-2025 පස් අවුරුදු සැලැස්මට අනුව දිගුකාලීන, කෙටිකාලීන හා මධ්‍යකාලීන උපායමාර්ග හඳුනාගෙන 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර එම ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතුකර ඇත.

ඉහත උපායමාර්ගික සැලැස්මේ ප්‍රධාන මිණුම් දණ්ඩ ලෙස 2024 වර්ෂයේ කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය නිමි තේ කිලෝ ග්‍රෑම් මිලියන 255ක් ලෙස හඳුනාගෙන ඇත. එහි ප්‍රගතිය වසර අවසන්වන විට කිලෝග්‍රෑම් මිලියන 197.154 වන අතර කාර්යඵල ප්‍රතිශතය 77%කි. ජාතික නිෂ්පාදනය නිමි තේ කිලෝග්‍රෑම් මිලියන 340ක් ලෙස හඳුනාගෙන ඇත. එහි ප්‍රගතිය වසර අවසන්වන විට කිලෝ ග්‍රෑම් මිලියන 262.159ක් වන අතර කාර්යඵල ප්‍රතිශතය 77%කි. මෙහි විස්තරාත්මක තොරතුරු සංඛ්‍යා සටහන් අංක 07හි ඉදිරිපත්කර ඇත.

### සංඛ්‍යා සටහන් අංක - 07
### 2020 – 2025 උපාය මාර්ගික සැලැස්මට අනුව තේ නිෂ්පාදන ඉලක්කය සහ ප්‍රගතිය

| විස්තරය | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|---|
| ජාතික නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් මිලියන) ඉලක්කය | 278 | 310 | 325 | 335 | 340 | 360 |
| කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් මිලියන) ඉලක්කය | 205 | 230 | 237 | 245 | 255 | 280 |
| ජාතික නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් මිලියන) ප්‍රගතිය | 278 | 299.34 | 251 | 256 | 262 | |
| කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය ප්‍රගතිය (කිලෝ ග්‍රෑම් මිලියන) | 205 | 223.2 | 189 | 190 | 197 | |
| **ප්‍රගතියේ ප්‍රතිශතය** | **100%** | **97%** | **80%** | **78%** | **77%** | |

* මූලාශ්‍රය - වැවිලි අමාත්‍යාංශයේ 5 අවුරුදු උපාය මාර්ගික සැලැස්ම.
* තේ මණ්ඩලයේ තේ නිෂ්පාදනය පිළිබඳ තොරතුරු.

## 2.4 ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම හා ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම්

2024 ක්‍රියාත්මක සැලැස්ම පහත පරිදි වේ.
ජාතික අවශ්‍යතාවය පරිදි වාර්ෂික තේ නැවත වගා අනුපාතය 2%ක මට්ටමින් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මත 2024 වසර සඳහා වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම රුපියල් මිලියන 550ක් සඳහා පිළියෙල කර ඇත.

### සංවර්ධන ක්‍රියාකාරකම්

තේ ඉඩම්වල ඵලදායීතාවය සුරක්ෂිත කිරීම හා එය අඛණ්ඩව පවත්වා ගැනීමට තේ නැවත වගාව, පාළු සිටුවීම සඳහා රුපියල් මිලියන 353.13ක්, එනම් සමස්ථ ප්‍රතිපාදන වෙන් කිරීම් වලින් 64.2%ක් වේ.

### අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම්

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සේවකයන්ගේ හා සමිති නිලධාරීන්ගේ ඵලදායීතාවය වැඩිකිරීම හා කළමනාකරණය සඳහා රුපියල් මිලියන 10.38ක් එනම් සමස්ථ වෙන්කිරීම් වලින් 1.88%ක් වෙන් කර තිබිණි.

### ව්‍යාප්ති ක්‍රියාකාරකම්

තේ කර්මාන්තයට හඳුන්වාදෙන පර්යේෂණ ක්‍රියාත්මක කිරීම, විශ්ලේෂණාත්මක ව්‍යාප්ති උපදේශන සේවා තේ ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා දැනුවත් කිරීම හා ප්‍රචාරණ කටයුතු සඳහා රුපියල් මිලියන 23.53ක් එනම් සමස්ථ වෙන්කිරීම වලින් 4.27%ක් වෙන්කර තිබුණි.

### ආයතනික ප්‍රාග්ධන ක්‍රියාකාරකම්

කුඩා තේ වතු අංශය 2024 ක්‍රියාත්මක සැලැස්ම තුලින් අරමුණු කරනු ලැබූ සංවර්ධන ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමට අමතරව ආයතනික ප්‍රාග්ධන කටයුතු සඳහා 2024 වසර සඳහා සැකසූ ක්‍රියාත්මක සැලැස්මෙන් රුපියල් මිලියන 50ක් වෙන් කර ඇති අතර එය සමස්ථ ප්‍රතිපාදනයෙන් 9%ක් වේ.

## 2.5 දීර්ඝ කාලීන සංවර්ධනයට, දායකවන සේවක ක්‍රියාකාරකම්

කාර්යමණ්ඩල පුරප්පාඩු වාර්ෂිකව 5%කට වඩා අවම මට්ටමින් පවත්වාගෙන යාම කෙටිකාලීන ප්‍රතිඵලයක් ලෙස ආයතනයේ අපේක්ෂාව වුවද, 2024 වසර අවසානය වන විට කාර්යමණ්ඩල පුරප්පාඩු ප්‍රතිශතය 17.6%ක් විය.
රාජකාරි කටයුතු සඳහා ආයතනික කාර්යමණ්ඩලයේ ධනාත්මක ආකල්ප ඇතිකර ගැනීමට ආයතනයේ විවිධ ශ්‍රේණීන් නියෝජනය වන ලෙස 2024 වසරේ දේශිය/විදේශීය පුහුණු වැඩසටහන් 10ක් සැලසුම්කල අතර මාණ්ඩලික නිළධාරීන්, කළමනාකරණ සහකරුවන්, නවක සේවකයින්, හා රියදුරන් සඳහා පුහුණු වැඩසටහන් 10 පවත්වා ඇත.

# තුන්වන පරිච්ඡේදය

## 3. සංවර්ධන ක්‍රියාකාරකම්

- 3.1 තේ නැවත වගාව
- 3.2 තේ අලුත් වගාව
- 3.3 භෝග පුනරුත්ථාපනය
- 3.4 කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රියාකාරීත්වය
- 3.5 විශේෂ ව්‍යාපෘති (සංවර්ධන)
- 3.6 තේ ශක්ති රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය
- 3.7 ආසියානු සංවර්ධන බැංකු විශේෂ ණය යෝජනා ක්‍රමය




# 3. සංවර්ධන ක්‍රියාකාරකම්

## 3.1 තේ නැවත වගාව


**වසර 03ක දී වසරකට/හෙක්ටයාරයකට/සකස් කල තේ/කිලෝග්‍රෑම් පහත රට 2,500 දක්වා ද මැදරට 1,700 දක්වාද ඌව 1,600 දක්වාද වැඩි කිරීම**

### 3.1.1 වාර්ෂිකව 2% මට්ටමින් තේ නැවත වගාව පවත්වා ගෙන යාම

කුඩා තේ ඉඩම්වල තේ නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩිකිරීම පිණිස, අඩු අස්වනු සහිත පැරණි බීජ තේ ඉඩම්වල සහ වෙනත් හේතු මත නැවත වගා කිරීමට සිදුවන ඉඩම්වල අනුමත රිකිලි තේ නැවත වගා කරවීමට අනුබලදීම සඳහා තේ නැවත වගාව ක්‍රියාත්මක කෙරේ.

නැවත වගාවේදී දැරීමට සිදුවන අධික පිරිවැය සඳහා සහන සැලසීම පිණිස තේ නැවත වගාව සඳහා ලබාදෙනු ලැබූ සහනාධාර මුදල 2015 වසරේ සිට හෙක්ටයාරයකට රුපියල් 500,000/- දක්වා වැඩි කර තිබේ. එසේ වුවද වගා පිරිවැය අධිකවීම නිසා 2025 වසර දක්වා වූ පස් අවුරුදු සැලැස්මේ ජාතික තේ නිෂ්පාදන ඉලක්කය වන කිලෝග්‍රෑම් මිලියන 360 වන ඉලක්කයට යාමට 2015 වර්ෂයේදී වැඩිකල සහනාධාර මුදල ප්‍රමාණවත් නොවන බැවින් 2021 වර්ෂයේ හෙක්ටයාරයකට රුපියල් 630,000/-ක් දක්වා සහනාධාර මුදල් වැඩි කරන ලදි. මෙහි විස්තරාත්මක තොරතුරු ප්‍රස්තාර සටහන් අංක 2හි දක්වා ඇත.

## ප්‍රස්තාර සටහන් අංක - 02





මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වගා සහනාධාර චක්‍රලේඛ අංක - 87 අනුව 2021 වර්ෂයේ වැඩි කර ඇත.

## 3.1.2 නැවත වගාව සඳහා වාර්ෂිකව අයදුම් කිරීම

ප්‍රතිපාදන සීමාව හේතුවෙන් තේ නැවත වගාවේ බිම් සැකසීම 2024 වර්ෂයේ ක්‍රියාත්මක නොවුනු අතර පෙර වර්ෂයන්හි බැඳීම් ඇතිකරගත් ගොවීන් සඳහා පස සාරවත් කිරීම I, පස සාරවත් කිරීම II, පැළ සිටුවීම හා වසරකට පසු නඩත්තුව සඳහා ක්ෂේත්‍ර කටයුතු සිදුකරන ලදි.

මෙහි සවිස්තරත්මක තොරතුරු ප්‍රස්තාර සටහන් අංක 03 මඟින් ඉදිරිපත්කර ඇත.

## ප්‍රස්තාර සටහන් අංක - 03





මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා

## කාර්යඵලය

පෙර වර්ෂයන්හි බැඳීම් ඇතිකර ගත් තේ නැවත වගාවේ වාරික 04ක් සඳහා රුපියල් මිලියන 132.83ක් වෙන්කර තිබූ අතර රුපියල් මිලියන 132.59ක් වසර අවසන් වනවිට ගෙවා තිබුණි. මෙහි ගෙවීම් විස්තර සංඛ්‍යා සටහන් අංක 08 මඟින් ද කාර්යඵලයට අදාළ විස්තර ප්‍රස්තාර සටහන් අංක 04 මඟින් දැක්වේ.


### ප්‍රස්තාර සටහන් අංක - 04




**2024 වර්ෂයේ නැවත වගාව බිම් සැකසීම ක්‍රියාකාරකම සිදු නොකරන ලදී**

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

### ප්‍රස්තාර සටහන් අංක - 05




මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ අවසාන ගිණුම්

## සංඛ්‍යා සටහන් අංක - 08
## තේ නැවත වගාව - (2023/2024 වර්ෂවල භෞතික කාර්යඵලය හෙක්ටයාර)

| අංක | වගා කටයුත්ත | වර්ෂය | පහතරට බිම් | | | | | උඩරට හා මැදරට බිම් | | | එකතුව | වාර්ෂික ඉලක්කය | පෙර වර්ෂය හා සැසඳීමේදී ප්‍රගතිය අඩු /වැඩි වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ගාල්ල | කළුතර | මාතර | රත්නපුර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | ඌව | | | |
| **1** | ලැබුණු ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව | 2023 | 258 | 144 | 455 | 345 | 111 | 183 | 165 | 212 | 1,873 | 4,620 | -72% |
| | | 2024 | - | - | - | - | - | - | - | - | - | - | - |
| **2** | නිකුත් කල අවසරපත්‍ර සංඛ්‍යාව | 2023 | 245 | 144 | 423 | 318 | 86 | 153 | 131 | 175 | 1,675 | 3,960 | -73% |
| | | 2024 | - | - | - | - | - | - | - | - | - | - | - |
| **3** | අවසර පත්‍රවලින් ආවරණ බිම් ප්‍රමාණය | 2023 | 77 | 59 | 113 | 131 | 30 | 62 | 41 | 35 | 548 | 330 | -73% |
| | | 2024 | - | - | - | - | - | - | - | - | - | - | - |
| **4** | බිම් සැකසීම | 2023 | 46 | 12 | 116 | 64 | 22 | 33 | 20 | 24 | 337 | 330 | -65% |
| | | 2024 | - | - | - | - | - | - | - | - | - | - | - |
| **5** | පස පුනරුත්ථාපනය I | 2023 | 68 | 32 | 115 | 58 | 40 | 36 | 20 | 41 | 410 | 400 | -52% |
| | | 2024 | 22.8 | 11.1 | 40.2 | 12 | 10.1 | 10.3 | 6.1 | 20.1 | 132.7 | 131 | -68% |
| **6** | පස පුනරුත්ථාපනය II | 2023 | 112 | 39 | 133 | 88 | 59 | 68 | 24 | 51 | 574 | 450 | -36% |
| | | 2024 | 29.8 | 22 | 99.8 | 54 | 23.9 | 34.6 | 13.9 | 35.1 | 313.2 | 298 | -48% |
| **7** | තේ නැවත වගා කිරීම | 2023 | 90 | 30 | 127 | 54 | 36 | 47 | 20 | 17 | 421 | 362 | -54% |
| | | 2024 | 47.1 | 26 | 103.6 | 82.3 | 35.9 | 47.2 | 23.3 | 47 | 412.2 | 388 | -8% |
| **8** | වසරකට පසු නඩත්තුව | 2023 | 82 | 33 | 160 | 72 | 40 | 34 | 30 | 20 | 471 | 240 | -37% |
| | | 2024 | 79 | 9 | 75.6 | 21.2 | 19.9 | 29.9 | 9.4 | 3.8 | 247.7 | 206 | -56% |
| **9** | ගෙවන ලද වගා ආධාර මුදල (රුපියල් මිලියන) | *2023 | 73.37 | 22.47 | 103.52 | 67.38 | 38.22 | 33.49 | 16.78 | 26.99 | 382.22 | 234.69 | -34% |
| | | *2024 | 13.51 | 8.67 | 39.04 | 24.20 | 10.69 | 15.23 | 6.78 | 14.47 | 132.59 | 132.83 | -65% |

* 2023 වර්ෂයේ 2022 වර්ෂයට අදාල විශේෂ ව්‍යාපෘති වියදම් ඇතුලත් වේ.
* 2024 වර්ෂයේ 2023 වර්ෂයට අදාල උපචිත වියදම් ඇතුලත් වේ.

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

## සංඛ්‍යා සටහන් අංක - 09

## තේ නැවත වගාව පිළිබඳ ක්‍රියාකාරීත්වය (1984 – 2024)

| වර්ෂය | නිකුත් කළ අවසර පත්‍ර ගණන | අවසර පත්‍ර ආවරණ බිම් ප්‍රමාණය (හෙක්ටයාර) | උදුරා දැමූ බිම් ප්‍රමාණය (හෙක්ටයාර) | වගාකළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර) | වාර්ෂික වියදම රුපියල් (මිලියන) | වාර්ෂික ප්‍රතිපාදන රුපියල් (මිලියන ) |
|---|---|---|---|---|---|---|
| **1984** | 2,404 | 1,317 | 466 | 340 | 11.8 | 13 |
| **1985** | 1,160 | 823 | 615 | 414 | 16.4 | 8.1 |
| **1986** | 662 | 442 | 547 | 464 | 20.3 | 16.3 |
| **1987** | 630 | 390 | 346 | 349 | 14 | 22.8 |
| **1988** | 501 | 321 | 308 | 277 | 10.3 | 18.5 |
| **1989** | 758 | 455 | 246 | 330 | 18.9 | 17.4 |
| **1990** | 4,827 | 2,439 | 478 | 362 | 19.2 | 22.59 |
| **1991** | 3,109 | 1,423 | 581 | 304 | 20.49 | 33.91 |
| **1992** | 1,348 | 526 | 662 | 409 | 20.33 | 27 |
| **1993** | 3,699 | 1,147 | 507 | 516 | 29.79 | 32.24 |
| **1994** | 2,627 | 906 | 770 | 553 | 31.62 | 60.46 |
| **1995** | 3,465 | 1,267 | 1,390 | 533 | 38 | 41.75 |
| **1996** | 4,475 | 1,319 | 724 | 508 | 31.05 | 43.41 |
| **1997** | 6,235 | 1,580 | 923 | 435 | 40.32 | 68.91 |
| **1998** | 5,507 | 1,586 | 674 | 635 | 65.64 | 61.69 |
| **1999** | 3,660 | 955 | 861 | 767 | 88.82 | 77.95 |
| **2000** | 6,930 | 1,796 | 722 | 519 | 72.68 | 92.84 |
| **2001** | 7,093 | 1,952 | 841 | 574 | 77.76 | 98.85 |
| **2002** | 9,983 | 2,565 | 991 | 736 | 99.17 | 106.57 |
| **2003** | 11,928 | 2,892 | 1,179 | 765 | 122.82 | 150.11 |
| **2004** | 10,618 | 2,621 | 1,398 | 891 | 188.1 | 179.07 |
| **2005** | 9,291 | 2,127 | 1,306 | 1,058 | 174.83 | 182.13 |
| **2006** | 6,755 | 1,578 | 927 | 1,001 | 183.34 | 181.9 |
| **2007** | 5,274 | 1,030 | 1,008 | 1,024 | 172.89 | 214.75 |
| **2008** | 6,945 | 1,337 | 1,128 | 881 | 194.59 | 190.59 |
| **2009** | 6,493 | 1,610 | 925 | 777 | 178.17 | 190.17 |
| **2010** | 7,781 | 1,895 | 1,015 | 847 | 177.85 | 153 |
| **2011** | 8,033 | 2,170 | 947 | 772 | 187.64 | 156.26 |
| **2012** | 11,889 | 2,647 | 1,087 | 889 | 226.83 | 300.17 |
| **2013** | 13,802 | 2,928 | 1,188 | 1,165 | 351.87 | 236.75 |
| **2014** | 10,134 | 2,540 | 810 | 720 | 258.09 | 391.75 |
| **2015** | 9,006 | 2,278 | 1,173 | 806 | 420.07 | 464.69 |
| **2016** | 11,076 | 2,597 | 1,356 | 733 | 487.87 | 546 |
| **2017** | 12,945 | 3,053 | 899 | 748 | 460.59 | 466.1 |
| **2018** | 5,624 | 1,480 | 909 | 1,027 | 422.69 | 443.1 |
| **2019** | 3,308 | 2,751 | 376 | 639 | 298.31 | 303.72 |
| **2020** | 4,408 | 1,215 | 682 | 649 | 300.4 | 340.5 |
| **2021** | 11,478 | 3,306 | 1310 | 849 | 493.77 | 567.5 |
| **2022** | 6,300 | 2,022 | 960 | 912 | *577.794 | 580.96 |
| **2023** | 1,675 | 548 | 337 | 422 | *382.223 | 234.69 |
| **2024** | - | - | - | 412.2 | *132.59 | 132.83 |

* 2022 වර්ෂයේ ක්‍රියාත්මක විශේෂ ව්‍යාපෘතින් හි වියදම්ද ඇතුලත්ව ප්‍රගතිය දක්වා ඇත.
* 2023 වර්ෂයේ 2022 වර්ෂයට අදාල විශේෂ ව්‍යාපෘති වියදම් ඇතුලත් වේ.
* 2024 වර්ෂයේ 2023 වර්ෂයට අදාල උපදිත වියදම් ඇතුලත් වේ.

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා

## සංඛ්‍යා සටහන් අංක - 10

## උඩරට හා මැදරට තේ නැවත වගාව සඳහා වන නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව - 2024

### (උදුරා දැමීමේ සිට දළු නෙලීමේ අවධිය දක්වා) හෙක්ටයාරයකට/රුපියල් දෛනික වැටුප රුපියල් 2,000.00

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය | වියදම | උදුරා දැමීම පලමු වසර | | | පස පුනරුත්ථාපනය දෙවන වසර | | | තේ වගා කිරීම තෙවන වසර | | | පලමු වසර නඩත්තුව හතරවන වසර | | | දෙවන වසර නඩත්තුව පස්වන වසර | | | මුළු පිරිවැය | | | මුළු පිරිවැය ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ශ්‍රම ඒකක | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම ඒකක | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම ඒකක | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම ඒකක | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම ඒකක | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම ඒකක | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | |
| 1 | පරණ තේ උදුරා දැමීම සහ ශුද්ධ කිරීම. (50% පැළ පැවති ඉඩමක දිනකට පඳුරු 40 බැගින්) | | | 132 | | 264,000 | | | | | | | | | | | | | 132 | | 264,000 | 5 |
| 2 | මුල්ලු කිරීම, මට්ටම් කිරීම සහ මුල් ඉවත් කිරීම. | | | 200 | | 400,000 | | | | | | | | | | | | | 200 | | 400,000 | 7 |
| 3 | බෑවුම් සකස් කිරීම, කාණු දැමීම, පේලි සකස් කිරීම. | | | 100 | | 200,000 | 40 | | 80,000 | 10 | | 20,000 | 5 | | 10,000 | 5 | | 10,000 | 160 | | 320,000 | 6 |
| 4 | ඩොලමයිට් දැමීම (කි.ග්‍රෑ 1 ක් රු. 20.00 බැගින්) | 3,952 | 79,040 | 2 | 79,040 | 83,040 | | | | | | | | | | | | | 2 | 79,040 | 83,040 | 1 |
| 5 | ගෝතමාලා පැළ කිරීම (රිකිලි 500 බැගින් දිනකට) | | | 54 | | 108,000 | | | | | | | | | | | | | 54 | | 108,000 | 2 |
| 6 | තෘණ සඳහා පොහොර දැමීම. (කි.ග්‍රෑ 1ක් රු.200.00 බැගින් කි.ග්‍රෑ. 989 කට) | 1,350 | 270,000 | 4 | 74,000 | 82,000 | 4 | 124,000 | 132,000 | 1 | 60,000 | 62,000 | | | | | | | 9 | 258,000 | 276,000 | 5 |
| 7 | තෘණ කැපීම (වසරකට ශ්‍රම ඒකක 1 බැගින්) | | | 14 | | 28,000 | 56 | | 112,000 | | | | | | | | | | 70 | | 140,000 | 2 |
| 8 | වල් පැළ නෙලීම (වසරකට ශ්‍රම ඒකක 10 බැගින්) | | | 30 | | 60,000 | 20 | | 40,000 | 100 | | 200,000 | 120 | | 240,000 | 120 | | 240,000 | 390 | | 780,000 | 14 |
| 9 | සෙවන ගස් වගා කිරීම (ඇකේෂියා හා ඩැඩැප්ස් 750 ක් සඳහා රිකිලි 1 කට රු. 3.00 බැගින්) සහ ඩොලමයිට් කි.ග්‍රෑ. 370 ක් සඳහා රිකිලි 1 කට රු.20.00 බැගින් | 750 | 22,400 | 6 | 22,400 | 34,400 | 1 | 242 | 2,242 | | | | | | | | | | 7 | 22,642 | 36,642 | 1 |
| 10 | උස් සෙවන වගා කිරීම. (ග්‍රැවිලියා 100 ක් රු. 55.00 බැගින් සහ ඩොලමයිට් කි.ග්‍රෑ, 100 | 100 | 10,440 | 4 | 10,440 | 18,440 | 1 | 108 | 2,108 | | | | | | | | | | 5 | 10,548 | 20,548 | 0 |
| 11 | තෘණ උදුරා දැමීම. | | | | | | | | | 20 | | 40,000 | | | | | | | 20 | | 40,000 | 1 |
| 12 | වලවල් හෑරීම, ලණු ඇදීම, කූඤ්ඤ ගැසීම. | | | | | | | | | 180 | | 360,000 | | | | | | | 180 | | 360,000 | 6 |
| 13 | තේ වගා කිරීම (පැළයක් රු.45.00 බැගින්) | 12,500 | 562,500 | | | | | | | 60 | 562,500 | 682,500 | | | | | | | 60 | 562,500 | 682,500 | 12 |
| 14 | සෙවන ගස් පාලනය කිරීම. (වසරකට දෙවර බැගින්) | | | | | | 6 | | 12,000 | 12 | | 24,000 | 15 | | 30,000 | 15 | | 30,000 | 48 | | 96,000 | 2 |
| 15 | බුබුළු අංගමාරය මර්ධනය කිරීම. (කොපර් ඔක්සයිඩ් ග්‍රෑ. 280 - 420 ක්. වාර 1 රු. 3000.00 ) | 3 | 24,000 | | | | | | | 40 | 24,000 | 24,000 | 40 | 24,000 | 24,000 | 40 | 14,000 | 14,000 | 120 | 62,000 | 302,000 | 5 |
| 16 | දළු නෙලන තත්වයට තේ පඳුරු හැඩ ගැස්වීම. | | | | | | | | | | | | 12 | | 24,000 | 15 | | 30,000 | 27 | | 54,000 | 1 |
| 17 | වසුන් යෙදීම. | | | | | | | | | 100 | | 200,000 | 75 | | 150,000 | | | | 175 | | 350,000 | 6 |
| 18 | තේ පොහොර යෙදීම. (ටී. 200 තෙවන වසර) | 1,300 | 208,000 | | | | | | | 20 | 208,000 | 308,000 | 20 | 384,000 | 484,000 | | | | 40 | 592,000 | 672,000 | 12 |
| 19 | සිව්වන වසර | 2,500 | 400,000 | | | | | | | 60 | | 120,000 | 60 | | 120,000 | 32 | | 64,000 | 152 | | 304,000 | 5 |
| 20 | ටී. 750 පස්වන වසර | 1,800 | 306,000 | | | | | | | | | | | | | | 297,500 | 357,500 | | 297,500 | 297,500 | 5 |
| 21 | පාළු සැපයුම් | 2,000 | 25 | | | | | | | | | | 12 | 11,250 | 35,250 | 6 | 11,250 | 23,250 | 18 | 22,500 | 58,500 | 1 |
| 22 | වටපණු උවදුර මර්ධනය කිරීම.(වෙලම් රසායනිකය පැලයකට මිලි ලීටර් 40 බැගින් | | 40,000 | | | | | | | 4 | 40,000 | 48,000 | | | | | | | 4 | 40,000 | 48,000 | 1 |
| 23 | කෘමි උවදුරු මර්ධනය හා උපකරණ සඳහා (මුල්ලු කිරීම, මට්ටම් කිරීම සහ මුල් ඉවත් කිරීම) | | | | 5,000 | 5,000 | | 5,000 | 5,000 | | 5,000 | 5,000 | | 5,000 | 5,000 | | 5,000 | 5,000 | | 3,000 | 25,000 | 0 |
| | එකතුව | | | 546 | 190,880 | 1,282,880 | 128 | 129,350 | 385,350 | 607 | 899,500 | 2,113,500 | 359 | 424,250 | 1,142,250 | 233 | 327,750 | 793,750 | 1,873 | 1,949,730 | 5,717,730 | 100 |

පිරිවැය ඇස්තමේනතුව තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශයන්ට අනුකූල වන අතර අමුද්‍රව්‍ය පිරිවැය අන්තර්ගත කර ඇත

| | | |
|---|---|---|
| Dolomite | 20000 | 20 |
| U 625 | 200000 | 200 |
| T 750 | 170000 | 170 |
| T 200 | 160000 | 160 |

## සංඛ්‍යා සටහන් අංක - 11 පහතරට තේ නැවත වගාව සඳහා වන නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව 2024

### (උදුරා දැමීමේ සිට දළු නෙලීමේ අවධිය දක්වා) හෙක්ටයාරයකට/රුපියල් දෛනික වැටුප රුපියල් 2,000.00

| අනු අංකය | විස් තරය | ප්‍රමාණය | වියදම | උදුරා දැමීම පළමු වසර | | | පස පුනරුත්ථාපනය දෙවන වසර | | | තේ වගා කිරීම තෙවන වසර | | | පළමු වසර නඩත්තුව හතරවන වසර | | | දෙවන වසර නඩත්තුව පස්වන වසර | | | මුළු පිරිවැය | | | මුළු පිරිවැය ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ශ්‍රම ඒකක | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම ඒකක | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම ඒකක | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම ඒකක | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම ඒකක | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම ඒකක | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | |
| 1 | පරණ තේ උදුරා දැමීම සහ ශුද්ධ කිරීම (50% පැළ පැවති ඉඩමක දිනකට පඳුරු 40 බැගින්) | | | 104 | | 208000 | | | | | | | | | | | | | 104 | | 208000 | 3.95 |
| 2 | මුල්ලු කිරීම, මට්ටම් කිරීම සහ මුල් ඉවත් කිරීම. | | | 125 | | 250000 | | | | | | | | | | | | | 125 | | 250000 | 4.75 |
| 3 | බෑවුම් සකස් කිරීම, කාණු දැමීම, පේලි සකස් කිරීම. | | | 100 | | 200000 | 40 | | 80000 | 10 | | 20000 | 5 | | 10000 | 5 | | 10000 | 160 | | 320000 | 6.08 |
| 4 | ඩොලමයිට් දැමීම (කි.ග්‍රෑ. 1 ක් සඳහා රු.9.00 බැගින්) | 1976 | 39520 | 2 | 39520 | 43520 | | | | | | | | | | | | | 2 | 39520 | 43520 | 0.83 |
| 5 | ගෝතමාලා පැළ කිරීම (රිකිලි 500 බැගින් දිනකට) | | | 54 | | 108000 | | | | | | | | | | | | | 54 | | 108000 | 2.05 |
| 6 | තෘණ සඳහා පොහොර දැමීම. (කි.ග්‍රෑ. 1 ක් රු. 300 බැගින් කි.ග්‍රෑ. 989 කට) | 1610 | 322000 | 4 | 74000 | 82000 | 4 | 186000 | 194000 | 1 | 62000 | 64000 | | | | | | | 9 | 322000 | 340000 | 6.46 |
| 7 | තෘණ කැපීම (වසරකට ශ්‍රම ඒකක 1 බැගින්) | | | 14 | | 28000 | 56 | | 112000 | | | | | | | | | | 70 | | 140000 | 2.66 |
| 8 | වල් පැළ නෙලීම (වසරකට ශ්‍රම ඒකක 10 බැගින්) | | | 30 | | 60000 | 20 | | 40000 | 100 | | 200000 | 120 | | 240000 | 120 | | 240000 | 390 | | 780000 | 14.82 |
| 9 | සෙවන ගස් වගා කිරීම (ඇකේෂියා හා ඩැඩැප්ස් 100 ක් සඳහා) සහ ඩොලමයිට් කි.ග්‍රෑ. 150 ක් සඳහා රිකිලි 1 කට රු. 3.00 බැගින්) | 300 | 8300 | 8 | 8300 | 24300 | 1 | 830 | 2830 | | | | | | | | | | 9 | 9130 | 27130 | 0.52 |
| 10 | උස් සෙවන ගස් වගා කිරීම. (ග්‍රැවිලියා 100 ක් රු. 55.00 බැගින් සහ ඩොලමයිට් කි.ග්‍රෑ. 100) | 100 | 10440 | 6 | 10440 | 22440 | 1 | 5220 | 7220 | | | | | | | | | | 7 | 15660 | 29660 | 0.56 |
| 11 | තෘණ උදුරා දැමීම. | | | | | | | | | 20 | | 40000 | | | | | | | 20 | | 40000 | 0.76 |
| 12 | වලවල් හෑරීම, ලණු ඇදීම, කූඤ්ඤ සැගැසීම. | | | | | | | | | 180 | | 360000 | | | | | | | 180 | | 360000 | 6.84 |
| 13 | තේ වගා කිරීම (පැළයක් රු. 35.00 බැගින්) | 12500 | 437500 | | | | | | | 60 | 437500 | 557500 | | | | | | | 60 | 437500 | 557500 | 10.59 |
| 14 | සෙවන ගස් පාලනය කිරීම. (වසරකට දෙවර බැගින්) | | | | | | 6 | | 12000 | 12 | | 24000 | 15 | | 30000 | 15 | | 30000 | 48 | | 96000 | 1.82 |
| 15 | බුබුළු අංගමාරය මර්ධනය කිරීම. (කොපර් ඔක්සයිඩ් ග්‍රෑ. 280 - 420 ක්. වාර 1 රු. 3000.00 ) | 4 | 12000 | | | | | | | 20 | 12000 | 52000 | 20 | 12000 | 52000 | 20 | 12000 | 52000 | 60 | 36000 | 156000 | 2.96 |
| 16 | දළු නෙලන තත්වයට පත් කිරීම සුදුසු පරිදි හැඩගැස්වීම. | | | | | | | | | | | | 12 | | 24000 | 15 | | 30000 | 27 | | 54000 | 1.03 |
| 17 | වසුන් යෙදීම. | | | | | | | | | 100 | | 200000 | 75 | | 150000 | | | | 175 | | 350000 | 6.65 |
| 18 | තේ පොහොර යෙදීම. | 1200 | 187000 | | | | | | | 20 | 187000 | 227000 | 20 | 383800 | 423800 | | | | 40 | 570800 | 650800 | 12.37 |
| | සිවවන වසර | 2430 | 383800 | | | | | | | 60 | | 120000 | 60 | | 120000 | 32 | | 64000 | 152 | | 304000 | 5.78 |
| | ටී. 750 පස් වන වසර | 1750 | 297500 | | | | | | | | | | | | | | 297500 | 297500 | | 297500 | 297500 | 5.65 |
| 19 | පාළු සැපයුම් | 2000 | 25 | | | | | | | | | | 12 | 15000 | 39000 | 12 | 15000 | 39000 | 24 | 30000 | 78000 | 1.48 |
| 20 | වටපණු උවදුර මර්ධනය කිරීම.(වෙලම් රසායනිකය පැලයකට මිලි ලීටර් 40 බැගින් | 1 | 40000 | | | | | | | 4 | 40000 | 48000 | | | | | | | 4 | 40000 | 48000 | 0.91 |
| 21 | කෘමි උවදුරු මර්ධනය කිරීම හා උපකරණ සඳහා (මුල්ලු කිරීම, මට්ටම් කිරීම සහ මුල් ඉවත් කිරීම) | | | | 5000 | 5000 | | 5000 | 5000 | | 5000 | 5000 | | 5000 | 5000 | | 5000 | 5000 | | 25000 | 25000 | 0.48 |
| | එකතුව | | | 447 | 137,260 | 1,031,260 | 128 | 197,050 | 453,050 | 587 | 743,500 | 1,917,500 | 339 | 415,800 | 1,093,800 | 219 | 329,500 | 767,500 | 1,720 | 1,823,110 | 5,263,110 | 100 |

| | | | |
|---|---|---|---|
| * | පිරිවැය ඇස් තමේනතුව තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශයන්ට අනුකූල වන අතර අමුද්‍රව්‍ය පිරිවැය හා ප්‍රවාහන පිරිවැය ද අන්තර්ගත කර ඇත. | | |
| | **Dolomite** | **20000** | **20** |
| | **U 625** | **200000** | **200** |
| | **T 750** | **170000** | **170** |
| | **T 200** | **160000** | **160** |




## 3.1.3 තේ නැවත වගාව 2024 (This Year Planting)

පෙර වර්ෂ වලදී තේ නැවත වගා කිරීම සඳහා ඉඩම් සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කර පස පුනරුත්ථාපනයද සිදුකර තේ පැළ සිටුවා නොමැති ඉඩම් හඳුනාගනිමින් එම ඉඩම්වල තේ පැළ සිටුවීම සඳහා හෙක්ටායාර 195ක් තෝරා ගනිමින් ඒ සඳහා පැළ ලබාදීම සිදුකර ඇත. 2024.12.31 දිනට හෙක්ටයාර 190.24ක ප්‍රගතියක් අත්කරගෙන ඇත. මේ සඳහා වෙන් කල මුදල රු.මි. 105.3ක් වන අතර රු.මි. 103.795ක් ගෙවා ඇත.

### සංඛ්‍යා සටහන් අංක -12 (2024 තේ නැවත වගාවේ අවසර පත්‍ර නිකුතුව හා පැළ සිටුවීම)

| අංකය | වගා කටයුත්ත | පහත් බිම් | | | | | උස් / මැදි බිම් | | | එකතුව | වාර්ෂික ඉලක්කය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගාල්ල | කළුතර | මාතර | රත්නපුර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | ඌව | | |
| 1 | ලැබුණු ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව | 363 | 113 | 249 | 129 | 71 | 58 | 51 | 74 | 1,108 | 1,170 |
| 2 | නිකුත් කල අවසරපත්‍ර සංඛ්‍යාව | 356 | 113 | 249 | 126 | 70 | 58 | 51 | 90 | 1,113 | 1,170 |
| 4 | තේ නැවත වගා කිරීම (2024) | 43.86 | 26.95 | 40.26 | 29.92 | 21.77 | 9.04 | 8.31 | 10.13 | 190.24 | 195.00 |
| 5 | ගෙවන ලද වගා ආධාර මුදල (රුපියල් මිලියන) | 23.14 | 14.97 | 22.45 | 16.87 | 11.42 | 4.97 | 4.60 | 5.38 | 103.795 | 105.30 |

## 3.1.4 නැවත වගා කිරීම සඳහා සහනාධාර ලබාදීම මඟින් තේ ඉඩම්වල ඵලදායීතාවයේ බලපෑම තක්සේරු කිරීමේ සමීක්ෂණය (2014 සිට 2018 දක්වා)

රාජ්‍ය සහනාධාර මත කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ සිදු කරන ලද තේ නැවත වගාව අස්වැන්න කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ නියැදි සමීක්ෂණයක් සිදු කිරීම කාලෝචිත බව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් අවධාරණය කර ඇත.

ඒ අනුව සෑම තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරි කොට්ඨාශයකම 2014 - 2018 කාලය තුල තේ නැවත වගා කරන ලද ඉඩම්වලින් තෝරා ගත් ඉඩම් 5 ක එක් එක් මාස වලදී නෙලන ලද දළු අස්වැන්න පිළිබඳ සමීක්ෂණයක් කරන ලදී.

ඒ අනුව තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරි කොට්ඨාශ 140ක ඉඩම් 2,786ක නියැදි සමීක්ෂණය කරන ලදී.

### සංඛ්‍යා සටහන් අංක -13
### නැවත වගා කිරීම සඳහා සහනාධාර ලබාදීම මඟින් තේ ඉඩම්වල ඵලදායීතාවයේ බලපෑම තක්සේරු කිරීම

| වර්ෂය | ගාල්ල | කළුතර | මාතර | රත්නපුර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | ඌව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2014 | 100 | 40 | 95 | 89 | 54 | 65 | 52 | 55 | **550** |
| 2015 | 102 | 40 | 107 | 91 | 63 | 51 | 57 | 62 | **573** |
| 2016 | 108 | 38 | 125 | 88 | 65 | 52 | 57 | 50 | **583** |
| 2017 | 112 | 40 | 90 | 60 | 61 | 53 | 57 | 66 | **539** |
| 2018 | 116 | 40 | 88 | 61 | 64 | 62 | 58 | 67 | **556** |
| එකතුව | **538** | **198** | **505** | **389** | **307** | **283** | **281** | **300** | **2801** |





## 3.2 තේ අලුත් වගාව

ප්‍රතිපත්තිමය තීරණමත 2003 වර්ෂයේ සිට අත්හිටවනු ලැබූ තේ අලුත් වගා ආධාර ක්‍රමය 2010 වර්ෂයේ සිට නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතුකර ඇත. ඒ අනුව විකල්ප භෝග හා ආදායම් මාර්ග නොමැති ප්‍රදේශ සඳහා සීමිත ප්‍රතිපාදන යටතේ තේ අලුත් වගාව කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරන ලදී.

තේ අලුත් වගාව සඳහා අවසරපත්‍ර නිකුත් කරනු ලැබූ උපරිම බිම් ප්‍රමාණය අක්කර 01කි. 2015.01.01 දින සිට අලුත් වගා සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල හෙක්ටයාර එකකට රුපියල් 400,000/- දක්වා වැඩිකර තිබේ. 2021 වසරේ දී එම මුදල රුපියල් 500,000ක් දක්වා වැඩිකරන ලදී.

නමුත් ප්‍රතිපාදන සීමාව මත 2024 වර්ෂයේ අලුත් වගා ක්‍රමවේදය ක්‍රියාත්මක නොවීය.

### ප්‍රස්තාර සටහන් අංක - 06




මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා

## සංඛ්‍යා සටහන් අංක - 14

## තේ අලුත් වගාව පිළිබඳ ක්‍රියාකාරීත්වය 1983 - 2024

| වර්ෂය | නිකුත් කළ අවසර පත්‍ර ගණන | අවසර පත්‍ර ආවරණ බිම් ප්‍රමාණය (හෙක්ටයාර) | උදුරා දැමූ බිම් ප්‍රමාණය (හෙක්ටයාර) | වගාකළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර) | වාර්ෂික වියදම (රුපියල් මිලියන) | වාර්ෂික ප්‍රතිපාදන (රුපියල් මිලියන) |
|---|---|---|---|---|---|---|
| 1983 | 2,757 | 866 | 393 | 264 | 2.7 | 4 |
| 1984 | 7,754 | 2,667 | 461 | 279 | 2.4 | 3.2 |
| 1985 | 7,754 | 1,764 | 857 | 599 | 9.5 | 6.3 |
| 1986 | 4,999 | 1,982 | 1,586 | 1,430 | 30.5 | 9.3 |
| 1987 | 3,939 | 1,375 | 1,218 | 1,183 | 26.5 | 13.5 |
| 1988 | 3,737 | 1,323 | 814 | 878 | 19.7 | 29.7 |
| 1989 | 4,532 | 1,837 | 1,013 | 1,011 | 34.9 | 34.2 |
| 1990 | 12,680 | 3,937 | 1,676 | 1,647 | 44.6 | 39.9 |
| 1991 | 3,785 | 1,120 | 2,088 | 1,843 | 57.8 | 42 |
| 1992 | 10,533 | 4,163 | 1,954 | 1,948 | 52.2 | 58 |
| 1993 | 12,318 | 2,720 | 1,753 | 1,622 | 51.57 | 50.57 |
| 1994 | 8,106 | 1,803 | 2,339 | 1,661 | 50.95 | 66.5 |
| 1995 | 5,822 | 134 | 2,407 | 1,237 | 44.52 | 49.8 |
| 1996 | 2,176 | 378 | 486 | 450 | 20.91 | 18.78 |
| 1997 | 3,797 | 576 | 340 | 293 | 14.08 | 9.08 |
| 1998 | 4,284 | 632 | 315 | 381 | 23.82 | 13.5 |
| 1999 | 6,694 | 952 | 484 | 405 | 13.04 | 12.24 |
| 2000 | 3,674 | 671 | 433 | 256 | 7.36 | 9.03 |
| 2001 | 6,353 | 1,084 | 419 | 399 | 15.58 | 11.91 |
| 2002 | 12,338 | 2,542 | 567 | 562 | 30.62 | 20.86 |
| *2003 | - | 654 | 647 | 642 | 27.95 | 24.94 |
| 2004 | - | - | - | 12 | 3.25 | 7.94 |
| 2005 | - | - | 1.42 | 8 | 0.3 | 2.42 |
| 2006 | - | - | 0.33 | 0.83 | 0.042 | 0.37 |
| 2011 | 430 | 45 | 28.14 | 28.38 | 1.18 | 2.08 |
| 2012 | 2,990 | 517 | 260 | 239 | 23.2 | 24 |
| 2013 | 2,872 | 543 | 258 | 263 | 42.41 | 3.6 |
| 2014 | 5,315 | 1,034 | 426 | 401 | 66.98 | 51.5 |
| 2015 | 4,239 | 846 | 475 | 479 | 128.12 | 128.88 |
| 2016 | 458 | 75 | 103 | 109 | 46.72 | 49.77 |
| 2017 | 2,324 | 349 | 211 | 202 | 63.71 | 71.12 |
| 2018 | 3,899 | 681 | 443 | 435 | 12.168 | 117 |
| 2019 | 2,887 | 567 | 29 | 295 | 91.69 | 92 |
| 2020 | 3,304 | 661 | 422 | 424 | 123.4 | 117 |
| 2021 | 4,968 | 1,076 | 681 | 678 | 238.56 | 237.3 |
| 2022 | 3,212 | 694 | 414 | 408 | *169.513 | 168.89 |
| 2023 | 181 | 36 | 44 | 47 | *82.02 | 23.38 |
| 2024 | - | - | - | - | - | - |

* 2003 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ආධාර ක්‍රමය ක්‍රියාත්මක නොවිය.
* 2022 වර්ෂයේ ක්‍රියාත්මක විශේෂ ව්‍යාපෘතින් හි වියදම්ද ඇතුලත්ව ප්‍රගතිය දක්වා ඇත.
* 2023 වර්ෂයේ 2022 වර්ෂයට අදාල විශේෂ ව්‍යාපෘති වියදම් ඇතුලත් වේ.

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව.




## 3.3 හෝග පුනරුත්ථාපනය

ඒකක ඵලදායීතාවය වර්ධනය කිරීම අරමුණුකර දළු නෙලන රිකිලි තේ ඉඩම්වල නිර්දේශිත කප්පාදුව කිරීමෙන් පාළු සම්පූර්ණ කිරීම, පස සංරක්ෂණ ක්‍රම (කාණු පද්ධති /ගල් වැටි පිළිසකර කිරීම හා සෙවන පාලනය කිරීම) ඇතුළු අනෙකුත් වගා පිළිවෙත් ඒකාබද්ධව සිදුකිරීම (කප්පාදුව, වල්පැළ නෙලීම) වෙනුවෙන් හෝග පුනරුත්ථාපනය යටතේ දිරි දීමනා ගෙවනු ලැබේ.

ඉදිරි වර්ෂ 10ක කාලයක් තුළ සාර්ථක ලෙස තේ වගාව පවත්වාගෙන යාහැකි ඉඩම් මෙම ක්‍රමය සඳහා නිර්දේශ කරනු ලබන අතර, තේ ඉඩම් කප්පාදු අවස්ථාවට එළඹ තිබීම හෝ වගාවේ වයස අවුරුදු 04 ඉක්මවා තිබීම, ආධාර ලබා ගැනීම සඳහා සුදුසුකම් වේ.

මෙම ක්‍රමය යටතේ, තැනින් තැන ඒකරාශී වූ හෝ විසිරී තනි තනිව පවතින පාළු සපයා දළු නෙලන තේ වගාව පුනරුත්ථාපනය කිරීමේ පදනම මත අක්කරයකට පැළ 1,000ක උපරිමයකට යටත්ව වාරික 2 කදී ආධාර ගෙවීම කරනු ලැබේ. 2019.01.01 දිනට පසුව නිකුත්කරන අවසරපත්‍ර සඳහා පමණක් පාළු පැළයක් සඳහා පළමු වාරිකය රුපියල් 75.00ක් දක්වා වැඩිකර තේ ඉඩම් හිමියෙකුට වසරකට දැනට දෙන උපරිම බිම් ප්‍රමාණය අක්කර 01 (හෙක්ටයාර 0.4047) සිට අක්කර 02 (හෙක්ටයාර 0.8094) දක්වා වැඩි කර ඇත.

මෙම හෝග පුනරුත්ථාපන ක්‍රමය යටතේ ආධාර ලබාගැනීමට පාළු පැළ සිටුවන ස්ථානයේ “මානා” තෘණ අවම වශයෙන් වසර 1 1/2ක් නඩත්තුකර තිබීම හෝ පැළ සිටුවන අවස්ථාවේදී එක් වලකට කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 02ක් යෙදිම නිර්දේශකර ඇත. මෙන්ම ඉදිරි වසර හතරක් (04)ක් ගතවනතුරු නැවත ආධාර ඉල්ලුම් කළ නොහැකිය.

2024 වර්ෂයේ පාළු පැළයක් සඳහා රු.55.00ක වාරිකයක් තේ ඉඩම් හිමියෙකුට ලබා දීමට කටයුතු කරන ලදි.


## සංඛ්‍යා සටහන් අංක - 15
## භෝග පුනරුත්ථාපනය - (2023/2024 වර්ෂයේ භෞතික කාර්යඵලය හෙක්ටයාර)

| අංකය | කාර්යය | වර්ෂය | පහතරට බිම් | | | | | උඩරට හා මැදරට බිම් | | | එකතුව | ඉලක්ක | පෙර වර්ෂය හා සැසඳීමේදී ප්‍රගතිය අඩු /වැඩි වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ගාල්ල | කළුතර | මාතර | රත්නපුර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | ඌව | | | |
| 1 | ලැබුණු ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව | 2023 | 82 | 107 | 36 | 221 | 55 | 353 | 120 | 38 | 1,012 | 5000 | -85% |
| | | 2024 | 839 | 680 | 927 | 641 | 546 | 981 | 423 | 950 | 5987 | 1,120 | 10.87% |
| 2 | නිකුත් කල අවසර පත්‍ර සංඛ්‍යාව | 2023 | 69 | 107 | 23 | 196 | 26 | 288 | 56 | 10 | 775 | 2,000 | -87% |
| | | 2024 | 838 | 683 | 923 | 614 | 539 | 928 | 394 | 1038 | 5957 | 960 | 24% |
| 3 | ඉලක්කගත පැළ සංඛ්‍යාව | 2023 | 48,679 | 11,150 | 24,349 | 48,091 | 6,738 | 25,993 | 16,500 | 18,500 | 200,000 | 200,000 | -92% |
| | | 2024 | 250,000 | 192,000 | 280,000 | 280,000 | 212,000 | 326,000 | 125,000 | 335,000 | 2,000,000 | 2,000,000 | 900% |
| 4 | පළමු වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව | 2023 | 48,589 | 11,315 | 24,609 | 49,441 | 8,621 | 28,985 | 16,906 | 18,145 | 206,611 | 200,000 | -92% |
| | භෝගපුනරුත්ථාපනය 2024 (පැළ සංඛ්‍යාව) | *2024 | 251,502 | 192,000 | 280,121 | 278,598 | 212,093 | 326,000 | 126,164 | 346,620 | 2,013,098 | 2,000,000 | 874% |
| 5 | දෙවන වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව | 2023 | 159,781 | 38,788 | 122,992 | 115,940 | 43,604 | 101,812 | 31,244 | 44,525 | 658,686 | 320,000 | -75% |
| | | 2024 | 62,041 | 10,941 | 15,246 | 20,352 | 14,424 | 47,354 | 7,967 | 40,156 | 218,481 | 200,000 | -70% |
| 6 | ගෙවන ලද ආධාර මුදල (රුපියල් මිලියන) | 2023 | 19.74 | 6.74 | 23.05 | 24.83 | 4.36 | 13.98 | 9.48 | 9.20 | 111.38 | 23.00 | -56% |
| | | *2024 | 14.99 | 10.83 | 15.76 | 15.92 | 12.02 | 19.10 | 7.02 | 19.36 | 115.00 | 115.00 | 3% |

* 2024 වර්ෂයේ 2023 වර්ෂයට අදාල උපචිත වියදම් ඇතුලත් වේ.
* 2024 වර්ෂයේ පාළු සිටවූ පැළ සඳහා පළමු වාරිකය හා දෙවන වාරිකය එකවර ගෙවා ඇත.

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව.

## ප්‍රස්තාර සටහන් අංක - 07




මූලාශ්‍රය - කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා


## කාර්යඵලය

2024 වර්ෂයේ භෝග පුනරුත්ථාපනය සඳහා 5,987 දෙනෙකු අයදුම්කර තිබුණි. මෙම ප්‍රමාණයෙන් 5,957 දෙනෙකු සඳහා අවසරපත්‍ර නිකුත් කරන ලදි. 2023 වසරට සාපේක්ෂව ඉල්ලුම්පත්‍ර ලද සංඛ්‍යාව 491%කින් වැඩි වී ඇති අතර නිකුත්කරනු ලැබූ අවසරපත්‍ර සංඛ්‍යාව 668%කින්ද වැඩි වී තිබුණි.

වර්ෂය තුළ පළමු වාරිකය ගෙවනු ලැබූ පැළ සංඛ්‍යාව 2,013,098කි. මෙය ඉලක්කගත පැළ සංඛ්‍යාව වූ පැළ 2,000,000න් 100.6% ප්‍රගතියකි. පෙර වර්ෂයට සාපේක්ෂව පළමු වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව 874%කින් වැඩි වී තිබේ. දෙවන වාරිකය වන වසරකට පසු නඩත්තුව ඉලක්කගත පැළ සංඛ්‍යාව 200,00කි. එහි ප්‍රගතිය පැළ 218,481ක් වන අතර එය ඉලක්කගත ප්‍රමාණයට සාපේක්ෂව 109%ක ප්‍රගතියකි. පෙර වර්ෂයට සාපේක්ෂව දෙවන වාරිකය වෙනුවෙන් ගෙවූ පැළ සංඛ්‍යාව 5.7%කින් වැඩි වී ඇත.

2024 වර්ෂයේදී භෝග පුනරුත්ථාපනය සඳහා රුපියල් මිලියන 115.00ක් ගෙවා ඇත. මෙහි ගෙවීම් විස්තර සංඛ්‍යා සටහන් අංක 16 මඟින් ද කාර්යඵලයට අදාළ විස්තර ප්‍රස්තාර සටහන් අංක 08 මඟින් ද දැක්වේ.

## ප්‍රස්තාර සටහන් අංක - 08




මූලාශ්‍රය -කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා

## සංඛ්‍යා සටහන් අංක - 16
## පොහොර පුනරුත්ථාපන ආධාර ක්‍රමයෙහි ක්‍රියාකාරීත්වය 1989 - 2024

| වර්ෂය | අවසර පත්‍ර නිකුත් කර ඇති පැළ ගණන | පළමු වාරිකය ගෙවන ලද පැළ ගණන | දෙවන වාරිකය ගෙවන ලද පැළ ගණන | ගෙවන ලද මුලු ආධාර මුදල (රුපියල් මිලියන) | වාර්ෂික ප්‍රතිපාදන (රුපියල් මිලියන) |
|---|---|---|---|---|---|
| 1989 | 3,903,899 | 4,257,670 | 3,377,046 | 13.3 | 19.6 |
| 1990 | 3,847,466 | 2,986,998 | 2,975,849 | 9.32 | 7.2 |
| 1991 | | 1,029,987 | 3,528,586 | 8.95 | 9.04 |
| 1992 | | 235,404 | 1,148,371 | 2.49 | 5 |
| 1993 | | 6,607 | 1,658 | 0.3 | |
| 1994 | | 16,432 | 46,030 | 0.12 | |
| 1995 | | 20,298 | 7,073 | 0.46 | 2.45 |
| *1996 | | 13,278 | 3,181 | 1.19 | 15.2 |
| **1996 | 5,600,900 | 3,867,981 | | | |
| **1997 | 6,965,923 | 5,301,839 | | 9.03 | 12 |
| 1998 | | 1,707,845 | | 4.14 | 15.02 |
| *1999 | | | 14,012 | 8.2 | 11.16 |
| **1999 | 617,120 | 2,454,895 | 1,846,445 | | |
| 2000 | 2,713,972 | 812,174 | 389,248 | 3.68 | 11.54 |
| 2001 | 1,412,860 | 1,078,708 | 209,534 | 5.68 | 11.54 |
| 2002 | 4,031,727 | 2,522,872 | 486,948 | 11.22 | 10.38 |
| 2003 | 3,012,892 | 1,636,901 | 380,013 | 9.38 | 12 |
| 2004 | 2,303,061 | 1,489,167 | 593,906 | 14.46 | 12.99 |
| 2005 | 1,566,327 | 1,242,648 | 776,661 | 8.11 | 12.37 |
| 2006 | 972,913 | 520,610 | 540,819 | 7.79 | 8.58 |
| 2007 | 1,092,856 | 516,471 | 308,325 | 4.13 | 6 |
| 2008 | 836,729 | 519,607 | 404,331 | 4.84 | 3 |
| 2009 | 995,822 | 431,699 | 232,217 | 3.25 | 3.59 |
| 2010 | 769,104 | 424,227 | 254,715 | 3.58 | 5 |
| 2011 | 1,379,734 | 504,322 | 182,401 | 6.32 | 9.24 |
| 2012 | 1,902,051 | 766,991 | 345,152 | 14.35 | 8.66 |
| 2013 | 1,060,634 | 497,592 | 420,611 | 11.24 | 6 |
| 2014 | 776,271 | 271,015 | 232,034 | 5.91 | 17.5 |
| 2015 | 754,170 | 308,950 | 199,923 | 6.43 | 6 |
| 2016 | 981,075 | 367,876 | 246,339 | 7.8 | 10.48 |
| 2017 | 1,290,408 | 564,145 | 297,068 | 11.7 | 17.29 |
| 2018 | 1,648,390 | 797,530 | 442,296 | 15.69 | 2 |
| 2019 | 4,699,796 | 1,921,568 | 465,084 | 138.99 | 190.09 |
| 2020 | 4,000,609 | 2,137,450 | 1,605,865 | 187.86 | 190.59 |
| 2021 | 4,737,358 | 3,324,024 | 1,876,058 | 293.47 | 275 |
| 2022 | 3,341,919 | 2,431,266 | 2,667,466 | 251.364 | 337.5 |
| 2023 | 466,338 | 206,611 | 658,686 | *111.38 | 23.00 |
| 2024 | 11,987,500 | 2,013,098 | 218,481 | *115.00 | 115.00 |

** සමිති මඟින් පාළු සැපයීමේ ක්‍රමය
* 2022 වර්ෂයේ පොහොර පුනරුත්ථාපනය යටතේ අදියර I අයවැය කථාව මගින් වෙන් වූ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ විශේෂ ව්‍යාපෘතින් හි වියදම් ද ඇතුලත් වේ.
* 2023 වර්ෂයේ 2022 වර්ෂයට අදාල විශේෂ ව්‍යාපෘති වියදම් ඇතුලත් වේ.
* 2024 වර්ෂයේ 2023 වර්ෂයට අදාල උපචිත වියදම් ඇතුලත් වේ.
මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා

## 3.4 කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රියාකාරීත්වය

### ප්‍රජා මූල සංවිධාන 50%කින් ඉහළ නැංවීම


### "වසර 03ක් තුළ ප්‍රජා මූලික සංවිධාන 50%කින් ශක්තිමත් කිරීම"

1989 වර්ෂයේ අග භාගයේදී ආරම්භ කරනු ලැබූ කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රමය නීතිගත සංවිධාන බවට පත්කිරීම සඳහා 1991 අංක 36 දරණ පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරණ කුඩා තේ වතු සංවර්ධන පනතෙහි 15 වන වගන්තියේ 2 වන උප වගන්තියේ (ඔ ඕ) ඡේදය යටතේ පැවරී ඇති බලතල අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් අංක 878/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් 1995 අංක 01 දරණ කුඩා තේ වතු සංවර්ධන සමිති රීති ප්‍රකාශයට පත්කර තිබේ.

දිස්ත්‍රික් සංවිධාන 08කින් සහ සමස්ත ලංකා සමිති සංවිධානයකින් යුතුව පොදු ව්‍යවස්ථා මාලාවක් යටතේ සමිති පද්ධතිය ක්‍රියාත්මක වේ. 2024 වසර අවසානය වනවිට කුඩා තේ වතු සංවර්ධන සමිති 1,497ක් ලියාපදිංචිවී තිබූ අතර, එයට අයත් සාමාජිකයන් සංඛ්‍යාව 287,407ක් වේ. ඒ අනුව 2023 වසරට සාපේක්ෂව 2024 වර්ෂයේ සාමාජිකයන් සංඛ්‍යාව 4.6%කින් අඩු වී තිබුණි.

### ප්‍රස්තාර සටහන් අංක - 09

ප්‍රාදේශීය වශයෙන් සමිති ව්‍යාප්තිය - 2024




මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

කුඩා තේ වතු සංවර්ධන සමිති වඩාත් සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ශක්තිය ලබාදීම සඳහා 2024 වසරේදී සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණයවන පරිදි විවිධ වැඩසටහන් 12ක් ඉලක්කය වශයෙන් සැලසුම් කර එයින් වැඩසටහන් 12ම සම්පූර්ණ කර ඇත. සමස්ත වශයෙන් ප්‍රජා මූලික සංවිධාන ශක්තිමත්කිරීම සඳහා ආයතනය විසින් රුපියල් මිලියන 1.8ක් 2024 වසරේ වැයකර තිබුණි.

### සංඛ්‍යා සටහන් අංක - 17

### කුඩා තේ වතු සංවර්ධන සමිති ව්‍යාප්තිය

| ප්‍රාදේශිය කාර්යාලය | සමිති සංඛ්‍යාව | | සාමාජිකයන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 2023 | 2024 | 2023 | 2024 |
| ගාල්ල | 219 | 219 | 43,714 | 33,336 |
| මාතර සහ හම්බන්තොට | 192 | 192 | 54,263 | 52,496 |
| කළුතර | 119 | 120 | 23,464 | 29,552 |
| කෑගල්ල | 150 | 151 | 29,589 | 30,534 |
| මහනුවර සහ මාතලේ | 227 | 227 | 22,306 | 22,306 |
| නුවරඑළිය | 127 | 127 | 14,137 | 10,421 |
| රත්නපුරය | 291 | 294 | 88,893 | 89,028 |
| ඌව (බදුල්ල සහ මොණරාගල) | 167 | 167 | 24,340 | 19,734 |
| එකතුව | **1,492** | **1,497** | **300,706** | **287,407** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා

## 3.5 විශේෂ ව්‍යාපෘති (සංවර්ධන)

### 3.5.1 කුඩා තේ වතු හිමියන් වෙත මිශ්‍ර පොහොර බෙදාදීම 2024.12.31 දිනට

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා රාජ්‍ය පොහොර සමාගම යන ආයතනය එක්ව කුඩා තේ වතු හිමියන් වෙත ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ එක් පොහොර (50kgක) බෑගයක් සඳහා රු.4,000 ක සහනාධාර යටතේ මිශ්‍ර පොහොර මෙ.ටො. 10,000 ක ප්‍රමාණයක් බෙදාදීම සඳහා ගිවිසුම්ගත වී ඇති අතර 2024.12.31 දින (සංඛ්‍යා සටහන් අංක -18) සඳහන් පොහොර ප්‍රමාණයක් ගොවීන් වෙත ලබාදී ඇත.

### සංඛ්‍යා සටහන් අංක -18 (ප්‍රාදේශීය කාර්යාල 08 හරහා පොහොර බෙදා හැරීම)

| ප්‍රාදේශීය කාර්යාලය | T- 200 (කි.ග්‍රෑම් 50) | T-65 (කි.ග්‍රෑම් 50) | T-750 (කි.ග්‍රෑම් 50) | U-709 (කි.ග්‍රෑම් 50) | U-834 (කි.ග්‍රෑම් 50) | එකතුව |
|---|---|---|---|---|---|---|
| ගාල්ල | 3,117 | 139 | 14,826 | 11,939 | 3,639 | **33,660** |
| කළුතර | 1,606 | 42 | 7,999 | 9,829 | 1,949 | **21,425** |
| මහනුවර | 901 | 282 | 765 | 9,645 | 3,722 | **15,315** |
| කෑගල්ල | 1,017 | 37 | 1,200 | 7,092 | 1,749 | **11,095** |
| මාතර | 1,869 | 80 | 10,391 | 16,342 | 2,559 | **31,241** |
| නුවරඑළිය | 436 | 70 | 605 | 5,422 | 448 | **6,981** |
| රත්නපුර | 1,662 | 388 | 3,642 | 23,604 | 3,150 | **32,446** |
| ඌව | 1,004 | 206 | 483 | 9,422 | 14,984 | **26,099** |
| එකතුව | **11,612** | **1,244** | **39,911** | **93,295** | **32,200** | **178,262** |

## 3.5.2 සෘජු තේ වගාව (රුපියල් මිලියන 750)

2023 වර්ෂයේ ක්‍රියාත්මක සෘජු තේ වගා ව්‍යාපෘතිය තේ වගාවේ නැවත වගා කිරීමේ ක්‍රියාවලියේ ඇති අඩුපාඩු මගහරවා ගැනීම ඉලක්ක කර ගනිමින් තේ පර්යේෂණායතනයේ නිර්දේශ වලට අනුකූල වනසේ ආරම්භ කරන ලදී. ඒ අනුව කොම්පෝස්ට් යොදා, ඒ මත සෘජුව තේ පැළ සිටුවීම සඳහා තේ වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක 08 ආවරණය කරමින් හෙක්ටයාර 750ක භූමි ප්‍රමාණයක් සෘජු තේ වගා කිරීමට සැලසුම් කරන ලදී. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින් පුහුණු කර ඇති යාන්ත්‍රික ශ්‍රම බලකාය මඟින් වලවල් හෑරීම ද, පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කොම්පෝස්ට් නිෂ්පාදන ආයතන මඟින් ලංසු කැඳවා කොම්පෝස්ට් මිලදී ගැනීම ද, අධිකාරියේ ලියාපදිංචි තේ පැළ තවාන් මඟින් තේ පැළ මිලදී ගැනීමද සිදුකරන ලදි.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් තේ ඉඩම් වල ඵලදායීතාවය වැඩි කිරීම මඟින් තේ වගා කරුවන්ගේ ආදායම ඉහළ නැංවීමටත්, තේ වගාකරුවන් යහපත් කෘෂිකාර්මික පුරුදු භාවිතයට හුරු කිරීමත් අපේක්ෂා කල අතර මෙම ව්‍යාපෘතියේ 2024.12.31 දිනට වලවල් හෑරීමේ ප්‍රගතිය හෙක්ටයාර 742.50 (වලවල් 9,281,250) වන කොම්පොස්ට් ලබාදී ඇති ප්‍රමාණය හෙක්ටයාර 617.14 (කි.ග්‍රෑම්. 7,432,058)කි. එසේම පැළ සිටුවා ඇති ප්‍රමාණය හෙක්ටායාර 549.3 (6,718,596)ක් වේ.

2024.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය සංඛ්‍යා සටහන් අංක 20 මඟින් දැක්වේ.

### සංඛ්‍යා සටහන් අංක - 19
### සෘජු තේ වගා (රුපියල් මිලියන 750) ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුව

| ක්‍රියාකාරකම | ව්‍යාපෘතිය සඳහා වන මුළු වියදම (රු.මි.) |
|---|---|
| i. භූමිය පිළියෙල කිරීම (වලවල් හෑරීම) | 187.50 |
| ii. කොම්පෝස්ට්යෙදීම (එක් වලක් සඳහා කිලෝග්‍රෑම් 01) | 187.50 |
| iii. තේ පැළ සඳහා | 375.00 |
| **එකතුව** | **750.00** |



## සංඛ්‍යා සටහන් අංක - 20
## සෞඛ්‍ය තේ වගා (රුපියල් මිලියන 750) ව්‍යාපෘතියෙහි 2024.12.31 දිනට ප්‍රගතිය

| ප්‍රාදේශීය කාර්යාලය | | ඉල්ලුම් පත්‍ර ලැබීම් | | අවසර පත්‍ර නිකුත් කිරීම | | වලවල් හැරීම ( බිම් සැකසීම) | | | | | | | කොම්පෝස්ට් යෙදීම | | | | | | | පැළ සිටුවීම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගණන | හෙක් ගණන | ගණන | හෙක් ගණන | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) | (%) | ඉලක්කය (වලවල් ගණන) | ප්‍රගතිය (වලවල් ගණන) | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | ඉලක්කය (කි.ග්‍රෑ) | ප්‍රගතිය (හෙක්) | ප්‍රගතිය (කි.ග්‍රෑ) | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | ඉලක්කය (පැළ ගණන) | ප්‍රගතිය (හෙක්) | ප්‍රගතිය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
| 1 | ගාල්ල | 2382 | 392.41 | 2099 | 327.67 | 205.5 | 104.51 | 51% | 2,568,750 | 1,265,561 | 51.38 | 25.22 | 2,568,750 | 131.1 | 1,568,277 | 51.38 | 31.02 | 2568750 | 114.16 | 1383722 | 89.91 | 48.43 |
| ගෙවීම් >>> | | | | | | | 63.8 | 31% | | 766,949 | | 21.01 | | 89.61 | 1,072,457 | | 24.46 | | 88.69 | 1074719 | | 37.80 |
| 2 | මාතර | 1580 | 312.08 | 1555 | 269.77 | 146 | 190.02 | 130% | 1,825,000 | 2,344,892 | 36.5 | 47.02 | 1,825,000 | 131.12 | 1,645,809 | 36.5 | 31.67 | 1825000 | 121.37 | 1504356 | 63.88 | 52.65 |
| ගෙවීම් >>> | | | | | | | 124.27 | 85% | | 1,537,834 | | 30.97 | | 84.82 | 1044495 | | 24.21 | | 96.09 | 1191211 | | 41.53 |
| 3 | රත්නපුර | 1051 | 301.84 | 964 | 249 | 148 | 184.3 | 125% | 1,850,000 | 2,280,076 | 37 | 45.66 | 1,850,000 | 107.21 | 1,272,316 | 37 | 25.45 | 1850000 | 91.2 | 1119236 | 64.75 | 39.17 |
| ගෙවීම් >>> | | | | | | | 123.97 | 84% | | 1,532,358 | | 30.70 | | 66.62 | 785599 | | 17.89 | | 64.04 | 783968 | | 28.23 |
| 4 | මහනුවර | 404 | 108.59 | 371 | 81.1 | 47 | 54.33 | 116% | 587,500 | 673,738 | 11.75 | 13.47 | 587,500 | 58 | 655,452 | 11.75 | 12.93 | 587500 | 56.41 | 673738 | 20.56 | 23.58 |
| ගෙවීම් >>> | | | | | | | 49.48 | 105% | | 613,832 | | 12.38 | | 37.76 | 451,484 | | 10.98 | | 43.72 | 518270 | | 18.17 |
| 5 | නුවරඑළිය | 300 | 119.47 | 206 | 42.24 | 21 | 20.54 | 98% | 262,500 | 248,404 | 5.25 | 4.97 | 262,500 | 20.62 | 248,404 | 5.25 | 4.97 | 262500 | 19.5 | 234891 | 9.19 | 8.22 |
| ගෙවීම් >>> | | | | | | | 20.54 | 98% | | 248,404 | | 4.70 | | 14.47 | 173,727 | | 3.80 | | 16 | 193323 | | 6.81 |
| 6 | ඌව | 460 | 200.42 | 357 | 64.71 | 45 | 49.98 | 111% | 562,500 | 609,959 | 11.25 | 12.2 | 562,500 | 49.34 | 614,947 | 11.25 | 12.3 | 562500 | 50.16 | 603081 | 19.69 | 21.11 |
| ගෙවීම් >>> | | | | | | | 49.53 | 110% | | 604,299 | | 12.07 | | 39.9 | 501621 | | 11.26 | | 50.07 | 601951 | | 20.91 |
| 7 | කළුතර | 463 | 115.54 | 446 | 105.02 | 65 | 62.91 | 97% | 812,500 | 776,169 | 16.25 | 15.52 | 812,500 | 33.64 | 404,983 | 16.25 | 7.33 | 812500 | 32.27 | 398455 | 28.44 | 13.95 |
| ගෙවීම් >>> | | | | | | | 32.26 | 50% | | 398,260 | | 7.85 | | 24.67 | 303473 | | 6.70 | | 29.95 | 369841 | | 13.14 |
| 8 | කෑගල්ල | 798 | 186.38 | 607 | 119.82 | 65 | 97.28 | 150% | 812,500 | 1,213,454 | 16.25 | 24.27 | 812,500 | 86.11 | 1,021,870 | 16.25 | 16.66 | 812500 | 64.22 | 801067 | 28.44 | 28.04 |
| ගෙවීම් >>> | | | | | | | 85.11 | 131% | | 1,061,420 | | 21.39 | | 38.71 | 449467 | | 9.76 | | 53.17 | 663176 | | 23.39 |
| **එකතුව** | | **7438** | **1736.7** | **6605** | **1259.33** | **742.5** | **763.87** | **102.90%** | **9,281,250** | **9,412,253** | **185.63** | **188.33** | **9,281,250** | **617.14** | **7,432,058** | **185.63** | **142.33** | **9,281,250** | **549.29** | **6,718,546** | **324.86** | **235.15** |
| ගෙවීම් >>> | | | | | | | **548.96** | **73.9** | | **6,763,356** | | **141.068** | | **396.56** | **4,782,323** | | **109.06** | | **441.73** | **5,396,459** | | **189.98** |

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා

## 3.6 තේ ශක්ති රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය

2000 අංක 47 දරණ පනතින් ආරම්භ වූ තේ ශක්ති අරමුදල් සුභසාධන අංශය 2016.08.09 දින ගන්නා ලද අමාත්‍යංශ මණ්ඩල තීරණයට අනුව 2016.10.01 සිට කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත අනුයුක්ත කරන ලදි.

තේ ශක්ති රක්ෂණ ක්‍රමයට දායක වී ඇති කුඩා තේ වතු හිමියන් වෙත පහත සඳහන් රක්ෂණ ආවරණ යටතේ ඔවුන්ගේ ඉල්ලීම මත රක්ෂණ ප්‍රතිලාභ ලබා දීම ක්‍රියාත්මකව ඇත.

1. හදිසි අනතුරු මරණ (අවුරුදු 70 අඩු/ අවුරුදු 70ට වැඩි වැඩිහිටි දීමනා)
2. හදිසි අනතුරු පූර්ණ/අර්ධ බෙලහීනතාවය
3. ස්වාභාවික මරණ (අවුරුදු 70ට අඩු/අවුරුදු 70ට වැඩි වැඩිහිටි දීමනා)
4. අංශභාග රෝගය (පූර්ණ/ අර්ධ බෙලහීනතා)
5. හෘදවත්, වකුගඩු, මොළයේ ශල්‍ය කර්ම (රජයේ රෝහල/ පුද්ගලික රෝහල)

ඒ අනුව 2024 වර්ෂයේදී සාමාජිකයින් 210 දෙනෙකු සඳහා රක්ෂණ ප්‍රතිලාභ රුපියල් මිලියන 3.6ක මුදලක් ගෙවීම්කර ඇත. එම තොරතුරු සංඛ්‍යා සටහන් අංක 21 මගින් ඉදිරිපත්කර ඇත.

### සංඛ්‍යා සටහන් අංක - 21

### තේ ශක්ති රක්ෂණ ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රියාකාරීත්වය

2024 වර්ෂයේ තේ ශක්ති ප්‍රතිලාභ ගෙවීම් සඳහා ලද මුදල් ගෙවීම් කිරීම සඳහා මුදල් අංශයට යොමු කල ආකාරය

| ප්‍රාදේශීය කාර්යාලය | ස්වාභාවික මරණ | | හදිසි අනතුරු මරණ | | වැඩිහිටි දීමනා ස්වාභාවික මරණ | | සැත්කම් | | අංශභාග | | හදිසි අනතුරු පූර්ණ හා අර්ධ | | මුළු ගෙවීම් ගණන | ගෙවීම් කර ඇති මුදල රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | [illegible] | මුදල(රු) 25,000.00 | [illegible] | මුදල(රු) 100,00.00 | [illegible] | මුදල(රු) 5,000.00 | [illegible] | මුදල(රු) 200,000.00 | [illegible] | මුදල(රු) | [illegible] | මුදල(රු) | | |
| රත්නපුර | 21 | 525,000.00 | 1 | 10,000.00 | 44 | 220,000.00 | 1 | 200,000.00 | | | | | 67 | 955,000.00 |
| නුවරඑළිය | 7 | 175,000.00 | | | 6 | 30,000.00 | | | | | | | 13 | 205,000.00 |
| කෑගල්ල | 5 | 125,000.00 | | | 4 | 20,000.00 | | | | | 1 | 100,000.00 | 10 | 245,000.00 |
| ඌව | 7 | 175,000.00 | | | 8 | 40,000.00 | | | | | 1 | 100,000.00 | 16 | 315,000.00 |
| ගාල්ල | 11 | 275,000.00 | | | 33 | 165,000.00 | 2 | 400,000.00 | 2 | 100,000.00 | | | 48 | 940,000.00 |
| මාතර | 8 | 200,000.00 | | | 22 | 110,000.00 | 1 | 200,000.00 | | | | | 31 | 510,000.00 |
| මහනුවර | 5 | 125,000.00 | | | 16 | 80,000.00 | | | | | 2 | 200,000.00 | 23 | 405,000.00 |
| කළුතර | 1 | 25,000.00 | | | 1 | 5,000.00 | | | | | | | 2 | 30,000.00 |
| **එකතුව** | **65** | **1,625,000.00** | **1** | **10,000.00** | **134** | **670,000.00** | **4** | **800,000.00** | **2** | **100,000.00** | **4** | **400,000.00** | **210** | **3,605,000.00** |


### 2024.01.01 සිට 2024.12.31 දක්වා

- ❖ වයස අවුරුදු 18 - 70 අතර ස්වාභාවික මරණ 65ක් සඳහා රු.162,5000.00ක මුදලක් ගෙවීම් කිරීමට මුදල් අංශයට යොමු කලා.
- ❖ වයස අවුරුදු 70ට වැඩි ස්වාභාවික මරණ 134ක් සඳහා රු.670,000.00ක මුදලක් ගෙවීම් කිරීමට මුදල් අංශයට යොමු කලා.
- ❖ වයස අවුරුදු 70ට වැඩි හදිසි අනතුරු මරණ 01ක් සඳහා ගෙවීම් රු.10,000.00ක මුදලක් ගෙවීම් කිරීමට මුදල් අංශයට යොමු කලා.
- ❖ අංශභාග රෝගීන් 02 සඳහා රු.100,000.00ක මුදලක් ගෙවීම් කිරීමට මුදල් අංශයට යොමු කලා.
- ❖ වයස අවුරුදු 18-70 අතර සැත්කම් 04ක් සඳහා රු.800,000.00ක මුදලක් ගෙවීම් කිරීමට මුදල් අංශයට යොමු කලා.
- ❖ වයස අවුරුදු 18-70 අතර අකර්මන්‍යවීම් 04ක් සඳහා රු.400,000.00ක මුදලක් ගෙවීම් කිරීමට මුදල් අංශයට යොමු කලා.
- ❖ 2024.01.01 සිට 2024.12.31 දක්වා අමාත්‍යාංශය මගින් ප්‍රතිලාභීන් 210ක් සඳහා රු. 3,605,000.00ක මුදලක් ලැබී ගෙවීම් කිරීම සඳහා මුදල් අංශයට යොමු කරන ලදී.

## 3.7 ආසියානු සංවර්ධන බැංකු විශේෂ ණය යෝජනා ක්‍රමය

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සවිබල ගැන්වීම යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වේ.


කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සවිබල ගැන්වීම උදෙසා ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය තුලින්, කුඩා තේ වතු අංශයේ නිෂ්පාදන වර්ධනය කිරීමටත් කුඩා තේ වතු ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ දැමීමත් අරමුණ වේ. මේ සඳහා මූල්‍ය ආයතන 14ක් හරහා ණය පහසුකම් ලබාදීමට කටයුතුකර ඇත.




### සංඛ්‍යා සටහන් අංක - 22

### ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය ණය ලබාදෙන මූල්‍ය ආයතන හා ණය නිර්දේශ ලබාදීමේ ප්‍රගතිය 2024.12.31 දිනට

| බැංකුවේ නම | ප්‍රතිලාභීන් ගණන | ප්‍රතිලාභීන්ට අදාලව ගෙවා ඇති මුළු මුදල (රු.මි.) |
|---|---|---|
| ලංකා බැංකුව | 225 | 212.18 |
| කොමර්ෂල් බංකුව | 83 | 124.76 |
| ඩී.එෆ්.සී.සී බැංකුව | 20 | 35.92 |
| හැටන් නැෂනල් බැංකුව | 42 | 41.91 |
| ජාතික සංවර්ධන බැංකුව | 1 | 1.60 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 4 | 20.50 |
| පැන් ඒෂියා බැංකුව | 7 | 5.76 |
| මහජන බැංකුව | 99 | 124.89 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 230 | 199.69 |
| සම්පත් බැංකුව | 12 | 23.07 |
| සණස සංවර්ධන බැංකුව | 28 | 28.52 |
| සෙලාන් බැංකුව | 52 | 85.53 |
| යූනියන් බැංකුව කොළඹ | 8 | 16.45 |
| යූනියන් බැංකුව | 3 | 9.30 |
| **එකතුව** | **814** | **930.08** |



# සිව් වන පරිච්ඡේදය

## 4. ව්‍යාපෘති ක්‍රියාකාරකම්

- 4.1 තේ තවාන් ක්‍රියාකාරීත්වය
- 4.2 වගා ආදර්ශන
- 4.3. ආයතනික මව් වගාව
- 4.4 ව්‍යාපෘති උපදෙස් හා පුහුණු වැඩසටහන්
- 4.5 පස් සාම්පල් පරීක්ෂාව හා ඒක පුද්ගල ව්‍යාපෘති කටයුතු
- 4.6 අස්වැන්න හා දළු ප්‍රමිතිය වැඩි කිරීමේ කම්හල් පාදක ව්‍යාපෘති වැඩසටහන්
- 4.7 "දල්ලකින් වෙනසක්" ඉඩම් සංවර්ධන වැඩසටහන
- 4.8 "දල්ලක ආශ්චර්යය" තේ ඉඩම් සංවර්ධන වැඩසටහන
- 4.9 "කාබනික තේ වගාව" ප්‍රචලිත කිරීම

# 4. ව්‍යාප්ති ක්‍රියාකාරකම්

**"ගුණාත්මයෙන් යුතු තේ පැළ සැපයීමෙන් කෙටි කාලයක් තුළ තේ ඉඩම් වල ඵලදායිතාව වැඩි කර ගැනීම "**

## 4.1 තේ තවාන් ක්‍රියාකාරීත්වය

### 4.1.1 වාණිජ තේ තවාන්

තේ නිෂ්පාදන ඵලදායීතාවය වැඩිකිරීම අරමුණුකර උසස් ගුණාත්මක පැළ කුඩා තේ වතු හිමියන් වෙත ලබාගැනීමට පහසු කරවීම සඳහා ගුණාත්මක බවින් යුත් වාණිජ තේ තවාන් ආයතනයේ ලියාපදිංචි තේ තවාන් වශයෙන් පවත්වාගෙනයාම, අධීක්ෂණය කිරීම හා නියාමනය මෙහිදී සිදුකරනු ලැබේ.

ඒ අනුව වසර 2023/2024 සඳහා ප්‍රාදේශිය කාර්යාල මඟින් වාණිජ තේ තවාන් 1,141ක් ලියාපදිංචි කරන ලදී. එම පැළ තවාන් වලින් තවාන් 673ක පළමු පරීක්ෂණය මඟින් පැළ මිලියන 19.9ක් සඳහා ද තවාන් 494ක පැළ මිලියන 12.3ක් සඳහා දෙවන පරීක්ෂණයෙන් පසු තවාන් 41ක පැළ මිලියන 0.96ක් සඳහා තෙවන පරීක්ෂණය ද සිදුකර ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය නිර්දේශ ලබා දී තිබුණි.
මේ පිළිබඳ තොරතුරු සංඛ්‍යා සටහන් අංක 23හි දැක්වේ.








## සංඛ්‍යා සටහන් අංක -23

## වාණිජ තේ තවාන් ක්‍රියාකාරීත්වය 2024 වගා කන්නය

| ප්‍රාදේශීය කාර්යාලය | අවසරපත් නිකුත් කිරීම | | පළමු පරීක්ෂණය (CN – 04) | | දෙවන පරීක්ෂණය (CN – 05) | | තෙවන පරීක්ෂණය (CN – 06) | |
|---|---|---|---|---|---|---|---|---|
| | තවාන් ගණන | පැළ ධාරිතාවය | ක්‍රියාකාරි තවාන් ගණන | සිටවූ පැළ ගණන | ක්‍රියාකාරි තවාන් ගණන | සිටවූ පැළ ගණන | තවාන් ගණන | සහතික කල පැළ ගණන |
| ගාල්ල | 246 | 9,845,800 | 153 | 3,590,220 | 115 | 1,783,628 | 6 | 33,000 |
| මාතර | 321 | 9,179,000 | 171 | 2,742,620 | 139 | 1,894,634 | | |
| කළුතර | 39 | 3,915,000 | 23 | 1,415,000 | 14 | 1,162,800 | 5 | 85,100 |
| රත්නපුර | 90 | 9,824,000 | 40 | 2,823,325 | 29 | 2,035,690 | | |
| කෑගල්ල | 38 | 2,355,000 | 27 | 856,620 | 6 | 175,120 | | |
| මහනුවර | 153 | 6,969,000 | 92 | 3,010,225 | 51 | 2,065,200 | 30 | 847,500 |
| නුවරඑළිය | 55 | 1,860,000 | 29 | 965,000 | 22 | 810,125 | | |
| ඌව | 199 | 5,656,500 | 138 | 4,519,817 | 118 | 2,385,700 | | |
| **එකතුව** | **1,141** | **49,604,300** | **673** | **19,922,827** | **494** | **12,312,897** | **41** | **965,600** |

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව



## 4.1.2 ආයතනික තේ තවාන්

කුඩා තේ වතු හිමියන්ට අවශ්‍ය තේ පැළ මිලදී ගැනීමේදී, වෙළඳපල මිලගණන් පාලනයකර ස්ථායීව පවත්වා ගැනීම, ගුණාත්මකභාවයෙන් යුතු තේ පැළයක් ලබාදීම, ගොවීන්ට ආදර්ශ තවාන් ලෙස පවත්වා ගැනීම අරමුණුකර ආයතනික තේ තවාන් ආරම්භකර ඇත. එසේම කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම්වල සිටුවීම සඳහා ඉතා ඉහළ ප්‍රමිතියකින්යුතු වැඩිදියුණු කරනලද ප්‍රබේද (රිකිලි අතු) භාවිතයෙන් ගුණාත්මක භාවයෙන් යුතු පැළ නිෂ්පාදනය සහතිකකරනු වස් ආයතනික තවාන් 10ක් පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව 2023/2024 නිරිතදිග හා ඊසානදිග වගා කන්න සඳහා තවාන් 10ක් මඟින් තේ පැළ 1,095,000 නිෂ්පාදනය සඳහා රිකිලි සිටුවන ලදී.

2024.01.01 තොග තත්වය, අලෙවි කරනු ලැබූ සමස්ථ පැළ සංඛ්‍යාව හා තවාන් මට්ටමින් පැළයක අලෙවි මිල ඇතුළු විස්තර සංඛ්‍යා සටහන් අංක 24 හි දක්වා ඇත.

**ආයතනික තේ තවාන් (ඉලක්කගත පැළ ගණන - 1,465,000)**

| වලහන්දූව පැළ | හන්තාන පැළ | හිගුල පැළ | හැඩිගල්ල පැළ | වෝගන් පැළ | තිස්පනේ පැළ | රහතුන්ගොඩ පැළ | නෙල්ලි ගොල්ල පැළ | වැවකැලේ පැළ | මාවරල පැළ |
|---|---|---|---|---|---|---|---|---|---|
| 150,000 | 200,000 | 200,000 | 90,000 | 175,000 | 200,000 | 200,000 | 100,000 | 50,000 | 100,000 |





## සංඛ්‍යා සටහන් අංක - 24
## ආයතනික තේ තවාන් ක්‍රියාකාරිත්වය - 2024 (රුපියල්)

| විස්තරය | | හන්තාන | රහතුන්ගොඩ | වලහන්දුව | හිඟුල | හැඩිගල්ල | වෝගන් | තිස්පනේ | මාවරල | නෙල්ලිගොල්ල | වැවකැලේ | සූරියගොඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2024.01.01දිනට තොග තත්වය | පැළ ගණන | 98,395 | 72,650 | 16,389 | 88,054 | 25,111 | 72,061 | 81,443 | 57,515 | 60,947 | 21,474 | 3,831 | **597,870** |
| | වටිනාකම (රු) | 3,020,660 | 3,051,333 | 672,483 | 2,493,069 | 1,423,781 | 2,340,129 | 5,658,334 | 2,768,188 | 3,165,923 | 425,829 | 183,053 | **25,202,782** |
| වර්ෂයතුල පැළ කරන ලද | පැළ ගණන | 112,750 | 182,950 | 91,280 | 153,812 | 92,500 | 163,500 | 135,597 | 100,150 | 77,114 | 26,750 | 875 | **1,137,278** |
| | වටිනාකම (රු) | 4,103,848 | 3,879,589 | 3,335,520 | 4,881,647 | 2,673,461 | 4,313,223 | 4,118,718 | 2,383,773 | 3,589,934 | 684,799 | 46,783 | **34,011,294** |
| මැරුණු පැල ගණන | පැළ ගණන | 23,053 | 130,836 | 6,896 | 5,193 | 8,004 | 13,534 | 64,587 | 28,702 | 19,007 | 15,463 | - | **315,275** |
| 2024.12.31 දිනට තොග තත්වය | පැළ ගණන | 65,716 | 80,163 | 25,485 | 132,761 | 61,598 | 132,764 | 82,853 | 79,892 | 72,002 | 12,442 | 1,405 | **747,081** |
| | වටිනාකම (රු) | 3,373,189 | 2,946,604 | 1,035,027 | 4,227,433 | 2,423,617 | 3,962,478 | 5,389,670 | 2,199,352 | 4,487,443 | 489,715 | 70,784 | **30,605,312** |
| විකුණුම් පිරිවැය | පැළ ගණන | 122,376 | 44,601 | 75,288 | 103,912 | 48,009 | 89,263 | 69,600 | 49,052 | 47,052 | 20,319 | 3,301 | **672,773** |
| | වටිනාකම (රු) | 3,751,320 | 3,984,467 | 2,972,976 | 3,147,282 | 1,673,625 | 2,690,873 | 4,387,382 | 2,952,609 | 2,268,414 | 620,913 | 159,052 | **28,608,913** |
| පැළයක නිෂ්පාදන වියදම (ඇස්තමේන්තුගත) | රුපියල් | **30.65** | **89.34** | **39.49** | **30.29** | **34.86** | **30.15** | **63.04** | **60.19** | **48.21** | **30.56** | **48.18** | **42.52** |
| අලෙවි කල පැළ | පැළ ගණන | 122,376 | 44,601 | 75,288 | 103,912 | 48,009 | 89,263 | 69,600 | 49,052 | 47,052 | 20,319 | 3,301 | **672,773** |
| | වටිනාකම (රු) | 5,056,560 | 2,147,910 | 3,049,500 | 4,323,230 | 1,960,435 | 3,672,815 | 4,751,670 | 2,141,690 | 2,170,390 | 788,485 | 320,625 | **30,383,310** |
| අලෙවිය මත පැළයක පිරිවැය | රුපියල් | **41.32** | **48.16** | **40.50** | **41.60** | **40.83** | **41.15** | **68.27** | **43.66** | **46.13** | **38.81** | **97.13** | **45.16** |
| **ලාභය / පාඩුව** | රුපියල් | **1,305,240** | **(1,836,557)** | **76,524** | **1,175,948** | **286,810** | **981,942** | **364,288** | **(810,919)** | **(98,024)** | **167,572** | **161,573** | **1,774,397** |

* මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ අවසාන ගිණුම් වාර්තාව (සෙවන පැළ ලාභය මෙහි ඇතුලත් කර නොමැත.)

**“තෝරාගත් ආදර්ශන තේ ඉඩම්වල යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීමෙන් වැඩි අස්වැන්නක් ලබා ගැනීම”**

## 4.2 වගා ආදර්ශන

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල අටම ආවරණය වන පරිදි සෑම තේ පරීක්ෂක ව්‍යාප්ති කොට්ඨාශයක (අවම අක්කර ½ක) වගා ආදර්ශන 06 බැගින් ආදර්ශ වගා 828ක් ස්ථාපනයකර ඇත.

ඒ අනුව එහි යහපත් කෘෂිකාර්මික පිළිවෙත් වන පාංශු සංරක්ෂණය, සෙවන වගාව, නිසිකලට කප්පාදුව, නිවැරදි දළු නෙලීම, නිවැරදි පොහොර භාවිතය, ජල සම්පාදන ක්‍රම වැනි යහපත් කෘෂි කාර්මික පිළිවෙත් අනුගමනය කලයුතු අතර එය කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පූර්ණ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලබයි.



**අක්කර 1/2 වගා ආදර්ශන භූමි**
**828**

| මහනුවර | ඌව | නුවරඑළිය | ගාල්ල | මාතර | කළුතර | රත්නපුර | කෑගල්ල |
|---|---|---|---|---|---|---|---|
| 96 | 96 | 72 | 138 | 120 | 78 | 150 | 78 |

## 4.3 ආයතනික මව් වගාව


තේ නිෂ්පාදන ඵලදායීතාව වර්ධනය කරගැනීම සඳහා ගුණාත්මක බවින් යුත් රෝපණ ද්‍රව්‍ය කුඩා තේ වතු හිමියන්ට ලබාගැනීමට පහසුකම් සලසාදීම, මව් වගාව පවත්වාගෙන යාමේ අරමුණ වේ. උසස් තත්වයේ රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීමෙන් කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම්වල නව තේ ප්‍රභේද ප්‍රචලිත කිරීම තුලින් ඔවුන්ගේ අදායම් මට්ටම ඉහළ නැංවීමත්, දේශගුණික විපර්යාස හමුවේ වගාවේ සුරක්ෂිතභාවය ආරක්ෂාකර ගැනීමත් මෙමඟින් සිදුවේ.

වැඩි දියුණු කල ප්‍රභේද සහිත ගුණාත්මක බවින් යුතු මව් වගාවන් අයතනය විසින් පවත්වා ගනිමින් කුඩා තේ වතු හිමියන්ට, වාණිජ තේ තවාන්කරුවන්ට සහ ආයතනයේ තේ තවාන් සඳහා අතු 139,317 සැපයීමට කටයුතු කරන ලදී. මින් කුඩා තේ වතු හිමියන්ට රිකිළි අතු 6.42%ක්, වාණිජ තවාන්කරුවන්ට 21.49%ක්, ආයතනික තේ තවාන් සඳහා 70.87%ක් ලෙස නිකුත් කරන ලදී. මේ පිළිබඳ විස්තර සංඛ්‍යා සටහන් අංක 25හි දක්වා ඇත.









## සංඛ්‍යා සටහන් අංක - 25

## මව් වගා මඟින් වැඩි දියුණු කල නව ප්‍රභේද රිකිලි අතු නිකුත් කිරීම -2024

| දිස්ත්‍රික්කය | ස්ථානය | ඉලක්කය | වාණිජ තවාන් | % | කුඩා තේ වතු හිමියන් | % | සමිති හා අනෙකුත් | % | ආයතනික තවාන් | % | මුළු නිෂ්පාදනය | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගාල්ල | වලහන්දුව | 92,500 | - | - | 2,950 | 13.20% | 1,700 | 7.61% | 17,700 | 79.19% | 22,350 | 16.04% |
| හන්තාන | හන්තාන | 80,000 | - | - | - | - | - | - | 24,500 | 100% | 24,500 | 17.59% |
| කළුතර | හැඩිගල්ල සහ වෝගන් | 30,000 | 6,120 | 100% | - | - | - | - | - | - | 6,120 | 4.39% |
| මහනුවර | නෙල්ලිගොල්ල සහ සූරියගොඩ | 45,500 | 7,200 | 34% | 1,500 | 7.14% | - | - | 12,305 | 58.58% | 21,005 | 15.08% |
| නුවරඑළිය | රහතුන්ගොඩ සහ තිස්පනේ | 65,000 | - | - | - | - | - | - | 43,722 | 100% | 43,722 | 31.38% |
| ඌව | බණ්ඩාරවෙල සහ හාලි ඇල | 34,000 | 16,620 | 77% | 4,500 | 20.81% | - | - | 500 | 2.31% | 21,620 | 15.52% |
| **මුළු එකතුව** | | **347,000** | **29,940** | **21.49%** | **8,950** | **6.42%** | **1,700** | **1.22%** | **98,727** | **70.87%** | **139,317** | **100%** |

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

## 4.4 ව්‍යාප්ති උපදෙස් හා පුහුණු වැඩසටහන්

සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාප්ති හා පුහුණු උපදෙස් වැඩසටහන් 3,312ක් සැලසුම්කරන ලදී. එම වැඩසටහන් සඳහා ඉලක්කගත සහභාගීත්ව ගොවීන් සංඛ්‍යාව 68,120කි. ඒ සඳහා වෙන් කල මුදල රුපියල් මිලියන 8.00ක් වන අතර වියදම් කල මුදල රුපියල් මිලියන 4.852කි.

ව්‍යාප්ති හා පුහුණු උපදෙස් වැඩසටහන් පිළිබඳ ප්‍රගතියේ සවිස්තර තොරතුරු සංඛ්‍යා සටහන් අංක 26හි දක්වා ඇත.





### සංඛ්‍යා සටහන් අංක - 26

### ව්‍යාප්ති හා උපදේශන සේවා - ඵලදායීතා වර්ධනය (පුහුණු වැඩසටහන් සංඛ්‍යාව හා සහභාගිත්වය)

| අංකය | ක්‍රියාකාරකම | ඒකකය | ගාල්ල | | මාතර | | කළුතර | | රත්නපුර | | කෑගල්ල | | මහනුවර | | නුවරඑළිය | | ඌව | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| 5.11.1 | දළු ගුණත්වය හා දළු ප්‍රමාණය වැඩිකිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | වැඩසටහන් ගණන | 276 | 306 | 240 | 294 | 156 | 180 | 300 | 451 | 156 | 233 | 192 | 246 | 144 | 153 | 192 | 223 | **1,656** | **2,086** |
| | | ගොවි සහභාගීත්වය | 5,520 | 7,262 | 4,800 | 5,577 | 3,120 | 4,045 | 6,000 | 9,162 | 3,120 | 5,283 | 5,720 | 6,387 | 2,880 | 4,681 | 3,840 | 5,036 | **35,000** | **47,433** |
| 5.11.2 | බලපත්‍රලාභීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | වැඩසටහන් ගණන | 138 | 137 | 120 | 104 | 78 | 84 | 150 | 66 | 78 | 91 | 96 | 78 | 72 | 63 | 96 | 84 | **828** | **707** |
| | | ගොවි සහභාගීත්වය | 2,760 | 2,699 | 2,400 | 1,687 | 1,560 | 1,915 | 3,000 | 1,349 | 1,560 | 2,204 | 1,920 | 1,707 | 1,440 | 1,326 | 1,920 | 1,860 | **16,560** | **14,747** |
| 5.11.3 | යාන්ත්‍රිකරණ හා විසිරි ජල පද්ධති ස්ථාපිත කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | වැඩසටහන් ගණන | 138 | 142 | 120 | 126 | 78 | 97 | 150 | 34 | 78 | 86 | 96 | 94 | 72 | 28 | 96 | 78 | **828** | **685** |
| | | ගොවි සහභාගීත්වය | 2,760 | 3,003 | 2,400 | 1,933 | 1,560 | 2,601 | 3,000 | 886 | 1,560 | 1,688 | 1,920 | 2,031 | 1,440 | 754 | 1,920 | 1,828 | **16,560** | **14,724** |
| **එකතුව** | | **වැඩසටහන් ගණන** | **552** | **585** | **480** | **524** | **312** | **361** | **600** | **551** | **312** | **410** | **384** | **418** | **288** | **244** | **384** | **385** | **3,312** | **3,478** |
| | | **ගොවි සහභාගීත්වය** | **11,040** | **12,964** | **9,600** | **9,197** | **6,240** | **8,561** | **12,000** | **11,397** | **6,240** | **9,175** | **9,560** | **10,125** | **5,760** | **6,761** | **7,680** | **8,724** | **68,120** | **76,904** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

## 4.5 පස් සාම්පල් පරීක්ෂාව හා ඒක පුද්ගල ව්‍යාප්ති කටයුතු

### පස් සාම්පල් පරීක්ෂාව

කුඩා තේ ඉඩම්වල නිෂ්පාදනය හා ඵලදායීතාවය වර්ධනය කර ගැනීමට අදාළව තේ ඉඩම්වල පාංශු ආම්ලිකතාව තේ වගාවට සුදුසු පරාසයෙන් පවත්වා ගතයුතු බැවින්, ඒ සඳහා වාර්ෂිකව පාංශු ආම්ලිකතාව පරීක්ෂාව සඳහා පස් සාම්පල 41,400 ඉලක්කකර තිබූ අතර වර්ෂය තුළ පස් සාම්පල 29,954ක් (72%) පරීක්ෂාකර තිබුණි.



### ඒක පුද්ගල ව්‍යාප්ති කටයුතු

සෑම තේ පරීක්ෂක /ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශයකින්ම ගොවීන් 30 දෙනෙකු බැගින් තෝරා ගෙන වසරකට වාර 6ක් එම ඉඩම පරීක්ෂා කර උපදෙස් ලබා දීම සිදු කෙරුණි. ඒ අනුව ඒක පුද්ගල හමුවීම් 25,111 වාරයක් තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරීගේ සෘජු අධීක්ෂණය සිදුකර ඇත.

මෙමගින් යහපත් කෘෂි කාර්මික පිළිවෙත් අනුගමනය කිරීමට හා ඵලදායීතාවය වැඩිකර, ගොවීන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමට අවශ්‍ය උපදෙස් සෘජුවම ඉඩමට ගොස් ලබා දීම සිදුකරනු ලබයි. මේ පිළිබඳ තොරතුරු සංඛ්‍යා සටහන් අංක 27 මගින් දැක්වේ.

### සංඛ්‍යා සටහන් අංක - 27
### ඒක පුද්ගල ව්‍යාප්ති කටයුතු හා පාංශු පරීක්ෂණ සංඛ්‍යාව - 2024 ප්‍රගතිය

| ප්‍රාදේශීය කාර්යාලය | | ගාල්ල | මාතර | කළුතර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | රත්නපුර | ඌව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පාංශු පරීක්ෂාව | ඉලක්කය | 6,900 | 6,000 | 3,900 | 3,900 | 4,800 | 3,600 | 7,500 | 4,800 | **41,400** |
| | ප්‍රගතිය | 5,216 | 1,884 | 1,956 | 2,926 | 3,900 | 3,610 | 7,458 | 3,004 | **29,954** |
| ඒක පුද්ගල හමුවීම් | ඉලක්කය | 4,140 | 3,600 | 2,340 | 2,340 | 2,880 | 2,160 | 4,500 | 2,880 | **24,840** |
| | ප්‍රගතිය | 4,729 | 3,674 | 2,838 | 3,020 | 2,493 | 1,618 | 4,180 | 2,559 | **25,111** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

## 4.6 අස්වැන්න හා දළු ප්‍රමිතිය වැඩි කිරීමේ කම්හල් පාදක ව්‍යාප්ති වැඩසටහන්

2024 වර්ෂයේ ව්‍යාප්ති පුහුණු වැඩසටහන් අතුරින් දළු අස්වැන්න හා දළු ප්‍රමිතිය වැඩි කිරීම සඳහා කර්මාන්තශාලා පාදක වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී එක් එක් කලාප තේ සංවර්ධන ව්‍යාප්ති කාර්යාල පදනම් කරගනිමින් කර්මාන්තශාලා තෝරා ගැනීමට ලක් කල අතර, එම කර්මාන්තශාලාවට දළු සපයන කුඩා තේ වතු හිමියන් වෙත ක්ෂේත්‍ර පුහුණු වැඩසටහනක් හා ඉන් අනතුරුව දැනුවත් කිරීමේ වැඩසටහනක් ලෙස මෙම වැඩසටහන් මාලාව ක්‍රියාත්මක කරන ලදී.

මෙහිදී දළු නෙළීම, කප්පාදුව, සෙවන කළමනාකරණය, පාංශු පෝෂක කළමනාකරණය හා පාංශු සංරක්ෂණය යන ප්‍රධාන යහපත් කෘෂි පිළිවෙත් පිළිබඳ දැනුවත් කිරීම් සිදුකරන ලද අතර, මෙයින් දළු නෙළීම හා කප්පාදුව පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලදී. දළු නෙළීමේදී නිවැරදි දළු රවුම පවත්වාගැනීම, නිවැරදිව දල්ල නෙලා ගැනීම, මේරූ වංගි, මුඩිච්චි ඉවත් කිරීම, අරිම්බු ඉතුරු කිරීම හා නඩත්තු පත්‍ර තලය පවත්වාගෙන යාම පිළිබඳ අවධානය යොමු කරන ලදී. කප්පාදුවේදී පාංශු pH පරීක්ෂා කිරීම හා ඒ අනුව ඩොලමයිට් යොදීම, සනීපාරක්ෂක කප්පාදුවක් සිදු කිරීම, හා කප්පාදුවෙන් පසු හුණු දියර ආලේප කිරීම ආදී ක්‍රියාපිළිවෙත් පිළිබඳ අවධානය යොමු කරන ලදී.

මෙහිදී කර්මාන්තශාලා පාලනාධිකාරිය, තේ දළු එකතු කරන්නන්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය යන පාර්ශවකරුවන්ද සම්බන්ධ වෙමින් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ප්‍රාදේශීය කාර්යාල 08හි ඉලක්කගත වැඩසටහන් ප්‍රමාණ 312ක් වූ අතර, ප්‍රගතිය 208ක් විය. මෙම වැඩසටහන වඩාත් සංවිධානාත්මකව හා ඉලක්කගතව දළු ප්‍රමිතිය 70%ක් දක්වා ඉහළට ගෙන යාම සඳහා විශේෂ ව්‍යාපෘතියක් 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරඇත. මේ සඳහා ජංගම යෙදවුමකින් තොරතුරු ඇතුලත් කිරීමටත්, විශ්ලේෂණය කිරීමටත් සැලසුම් කර ඇත.

## 4.7 "දල්ලකින් වෙනසක්" ඉඩම් සංවර්ධන වැඩසටහන

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා සී.අයි.සී සමාගම සමඟ රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව වැඩසටහනක් ලෙස 2024.01.12 දින සිට ආරම්භ කරන ලද මෙම වැඩසටහන මඟින් ගාල්ල, මාතර හා රත්නපුර යන ප්‍රාදේශීය කාර්යාලවල තේ ඉඩම් 4,000ක් ආදර්ශ තේ ඉඩම් ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය අවශ්‍ය තාක්ෂණික සහයෝගය දක්වනු ලැබේ.

මෙහිදී ඉඩම් තෝරා ගැනීමටත් එම ඉඩම් හිමියන් 20 බැගින් කාණ්ඩ ගතකර එක් එක් කණ්ඩායමකට ගොවි නායකයෙකු පත්කර ගොවි පොකුරු (Clusters) නිර්මාණය කරන ලදී. ඒ අනුව මෙම වැඩසටහන ගාල්ල ගොවි පොකුරු 75ක්, මාතර 50ක් හා රත්නපුර 75ක් ලෙස කණ්ඩායම් කර ක්‍රියාත්මක කරනු ලැබේ.

ඒ අනුව සෑම ඉඩමක්ම යහපත් කෘෂි පිළිවෙත් වලට අනුකූලව පවතින තත්ත්වය පිළිබඳව මූලික සමීක්ෂණයක් /අධ්‍යනයක් (Baseline Study) සිදුකර එම තොරතුරු පරිගණක පද්ධතියකට යොමුකර විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව ඉඩම් හිමියන්ගෙන් 60%ක ප්‍රතිශතයකට තේ වගාව හා යහපත් කෘෂි පිළිවෙත් පිළිබඳ දැනුම (Knowledge) පැවැති අතර, 30%ක් පමණක් එම පිළිවෙත් අනුගමනය (Adoption) කරන බව තහවුරු කරගන්නා ලදී. එම තොරතුරු පාදක කරගනිමින් පුහුණු අවශ්‍යතා හා යෙදවුම් (ප්‍රමිතිගත තේ පැළ, උස් සෙවන පැළ ආදිය) ලබාදීමත් ඉඩම සංවර්ධනය කිරීමත් සිදුකරන ලදී.
පසුව මාස 03කට වරක් ඉඩම් ඇගයීමට ලක්කර එම තොරතුරු ජංගම යෙදවුමක් (Mobile App) මඟින් පරිගණක ගතකරන ලදී. ඉඩම් වල අවසන් ඇගයීම් කටයුතු 2025 පළමු කාර්තුව තුල අවසන් කර ඉඩම් වල ප්‍රගති විමර්ශනය කිරීමට නියමිත වේ.



## 4.8 "දල්ලක ආශ්චර්යය" තේ ඉඩම් සංවර්ධන වැඩසටහන

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා බ්‍රවුන්ස් සමාගම සමඟ රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව වැඩසටහනක් ලෙස 2024 අගෝස්තු 01 දින ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන කළුතර, මහනුවර, නුවරඑළිය, කෑගල්ල හා ඌව යන ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශ වල තෝරා ගත් කුඩා තේ ඉඩම් හිමියන් 5,000ක ගේ ඉඩම් සංවර්ධනය කිරීමට සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. මූලික වශයෙන් මහනුවර, කෑගල්ල හා ඌව යන ප්‍රාදේශීය කාර්යාල වල ආරම්භ කරන ලද මෙම වැඩසටහන "දල්ලකින් වෙනසක්" වැඩසටහනේ ආකෘතියට අනුකූලව "දල්ලකින් වෙනසක්" වැඩසටහන ක්‍රියාත්මක නොවන ප්‍රාදේශීය කාර්යාල 05 ආවරණය වන පරිදි සකස් කර ඇත. මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන්ම කර්මාන්තශාලාව පාදකව ගොවීන් තෝරා ගනිමින් සිදු කිරීම සඳහා සැලසුම් කර ඇත.
සෑම ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයකම 20 බැගින් ගොවි පොකුරු 50ක් බැගින් සකස් කර ක්‍රියාත්මක කෙරේ. පරිගණක යෙදවුමක් මඟින් ඉඩම් වල තොරතුරු ඇතුලත් කිරීම හා විශ්ලේෂණය සිදු කරයි. මෙම ව්‍යාපෘතිය 2025 වර්ෂයේද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට නියමිත වේ.

## 4.9 "කාබනික තේ වගාව" ප්‍රචලිත කිරීම

වැවිලි අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා JICA ආයතනය හා PARCIC යන ආයතන සමඟ ක්‍රියාත්මක පරිසර හිතකාමී තේ වගාව යටතේ කාබනික තේ වගාව ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් මාතර ප්‍රාදේශීය කාර්යාලයේ දෙනියාය ප්‍රදේශය පාදක කරගනිමින් ක්‍රියාක්මක කරන ලදී. මෙහිදී තෝරා ගන්නා ලද කුඩා තේ ඉඩම් 340ක් වසර 05ක කාලයක් තුල කාබනික තේ ඉඩම් ලෙස සංවිධානය කිරීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා JICA ආයතනය මූල්‍ය දායකත්වය දක්වනු ලැබේ. මේ යටතේ 2024 වර්ෂයේ තේ ඉඩම් 50ක් තෝරාගෙන එම ඉඩම් වල මූලික සමීක්ෂණයක් සිදුකර එම තොරතුරු පාදකව ඉඩම් සංවර්ධනය කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව 2025 වර්ෂයේද ක්‍රියාක්මක වේ.

## සංඛ්‍යා සටහන් අංක - 28

# සංවර්ධනාත්මක ප්‍රතිඵල සඳහා කළමනාකරණය - ප්‍රධාන කාර්යය පාදක දර්ශක - 2024

| අංකය | මධ්‍ය කාලීන ප්‍රතිඵල | කාර්යය පාදක දර්ශක | පාදක වර්ෂය 2008 | කාර්යය පාදක දර්ශක ඉලක්ක හා ප්‍රගතිය - 2024 | | විශේෂිත කරුණු |
|---|---|---|---|---|---|---|
| | | | | ඉලක්කය | ප්‍රගතිය | |
| 1 | දිගු කාලීන ප්‍රතිඵලය | I කුටුම්භ ඒකක වත්කම් වර්ධනය වීමේ ප්‍රගතිය | | | | සමාජ ආර්ථික සමීක්ෂණ |
| | කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්වය නංවාලීම | II ළමුන්ගේ ද්විතීය අධ්‍යාපන ප්‍රගතිය | | | | |
| | වසර 03 ක දී වසරකට / හෙක්ටයාර 01 කට | 1.1 දිස්ත්‍රික් මට්ටමින් හා උච්චත්ව මට්ටමින් ඒකක ඵලදායිතාවය වර්ධනය කිරීම | | | | |
| | සකස් කල තේ කිලෝ ග්‍රෑම් ප්‍රමාණය වැඩි කිරීම | | | | | |
| | පහත රට 2,500 දක්වා | | 2,085 | 2,500 | 1,147 | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සංඛ්‍යාන දත්ත |
| | මැද රට 1,700 දක්වා | | 1,050 | 1,700 | 1,882 | |
| | ඌව 1,600 දක්වා | | 1,055 | 1,600 | 1,644 | |
| | | 1.2 කුඩා තේ ඉඩම් වල නිෂ්පාදනය වර්ධනය වීම (කිලෝ ග්‍රෑම් මිලියන) | 215 | 255 | 197.154 | |
| 2 | වසර 03 ක දී කම්හල් මට්ටමින් අමු දළු ගුණාත්මය වර්ධනය කිරීම | 2.1 කම්හල් මට්ටමින් හොඳ දළු ප්‍රගතිය | 35% | | 44% | |
| 3 | වසර 03 ක් තුළ ප්‍රජා මූලික සංවිධාන වලින් 50% ශක්තිමත් කිරීම | 3.1 වත්කම් වටිනාකම් වර්ධනය වීම | NA | | | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් අංශයේ දත්ත - සමාජ ආර්ථික සමීක්ෂණ සංගණනය |
| | | 3.2 හඳුනාගත් කාර්යයන් මෙහෙයවන සමිති සංඛ්‍යාව | 100 | | 1497 | |
| | | 3.3 සාඵල්‍යතාවයන් සම්බන්ධයෙන් සාමාජික ආකල්ප | NA | | | |
| 4 | වසරක් තුළ වඩාත් සඵලදායී ලෙස ක්‍රියාත්මක වීම සඳහා ආයතනය ශක්තිමත් කිරීම | 4.1 ඉලක්ක සපුරාලීමේ ප්‍රතිශතය | | | | |
| | | **තේ නැවත වගා අධාර ක්‍රමය** | | | | |
| | | a. මූල්‍ය | 102% | 132.83 | *132.83 | |
| | | b. භෞතික | 92% | 1,023 | 1,105.7 | |
| | | 4.2 විගණන මතය | | සත්‍ය හා සාධාරණ | තත්වාගණනය කල | |
| | | 4.3 අයවැයෙන් අපගමන ප්‍රතිශතය (සංවර්ධන ප්‍රාග්ධන) | 13% | | | |
| | | 4.4 ආයතනයේ සාඵල්‍යතාවය සම්බන්ධයෙන් කාර්යය මණ්ඩලයේ ආකල්ප | NA | | | |
| 5 | වසර 03 ක් තුළ දී ඉඩම් වලින් 10% ක් අමතර ආදායම් ඉපයීමේ කටයුතු සඳහා යොමු කරවීම | 5.1 අනෙකුත් භෝග ඇති ඉඩම් වල ප්‍රතිශතය | 35% | | | සමාජ ආර්ථික සමීක්ෂණ සංගණනය |
| | | පශු පාලන ඉඩම් ඇති ප්‍රතිශතය | NA | | | |
| එකතුව | | | | | | |

# පස්වන පරිච්ඡේදය

## 5. ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් අංශය හා තේ ඉඩම්වල ඵලදායීතාවය

5.1 කුඩා තේ ඉඩම්

5.2 කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය

5.3 කුඩා තේ ඉඩම්වල නිෂ්පාදන සංයුතිය හා ඵලදායිතාවය

5.4 කුඩා තේ අංශයේ දායකත්වය හා ඵලදායිතාවයේ සමාලෝචනය

# 5. ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් අංශය හා තේ ඉඩම්වල ඵලදායීතාවය

## 5.1 කුඩා තේ ඉඩම්

තේ පාලන පනතට අනුව අක්කර 10ට අඩු තේ ඉඩම් කුඩා තේ ඉඩම් ලෙස සැලකේ. එසේ වුව ද ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ පැවති අක්කර 10 - 50 දක්වා වූ තේ ඉඩම් සඳහා සංවර්ධන කටයුතු කිරීමේ බලතල 1978 ජනවාරි මස 01 දා සිට කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පවරනලදී. ඒ අනුව පුද්ගලික අයිතිය යටතේ ඇති අක්කර 50ට අඩු සියළුම තේ ඉඩම්වල සංවර්ධනය සඳහා අදාළ සහායක සේවාවන් ආයතනය විසින් මෙතෙක් සපයා තිබුණි.

2012 වසර වන විට අක්කර 10 සිට 50 දක්වා වූ බිම් සඳහා ඉඩම් සංවර්ධන සේවා සැපයීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙතත්, ව්‍යාප්ති සේවා සැපයීම ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය වෙතත් පවරා ඇත. ඒ අනුව 2012 වර්ෂයේ සිට පනතෙහි පවතින ප්‍රතිපාදන පරිදි අක්කර 10ට අඩු තේ බිම් සඳහා පමණක් ඒවායේ සංවර්ධනයට සහ ඊට අදාළ සහායක සේවාවන් ආයතනය විසින් සපයන ලදී.


### 5.1.1 කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය

2005 කුඩා තේ වතු සංගණනය පරිදි කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය වූ හෙක්ටයාර 132,329 ද ඇතුළුව (පර්චස් 20ට අඩු භූමි සහිතව) ශ්‍රී ලංකාවේ සමස්ත තේ ඉඩම් භූමි ප්‍රමාණය හෙක්ටයාර 221,968ක් පමණ වේ. මේ අනුව ශ්‍රී ලංකාවේ සමස්ත තේ භූමි ප්‍රමාණයෙන් 59%ක් කුඩා තේ ඉඩම් අංශයට අයත් වේ. අදාල විස්තරය ප්‍රස්තාර අංක 10 මඟින් දැක්වේ.

2016 වසර අවසානයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ අධිකාරිය ඒකාබද්ධව ආරම්භකරනු ලැබූ තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන පරිදි ලියාපදිංචිකල කුඩා තේ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 157,838කි. එම තොරතුරු පදනම්කර 2024 වසරේ යාවත්කාලීන කරනලද භූමි ප්‍රමාණය හෙක්ටයාර 158,247කි. මෙහි දායකත්ව ප්‍රතිශතය ප්‍රස්තාර අංක 11න් දැක්වේ.


මෙහි සවිස්තරාත්මක තොරතුරු සංඛ්‍යා සටහන් අංක 33, 34, 35 හි දක්වා ඇත.

**ප්‍රස්තාර සටහන් අංක - 10**




මූලාශ්‍රය - කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණනය - 2005 ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව

**ප්‍රස්තාර සටහන් අංක - 11**




මූලාශ්‍රය 2016 - ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ඉඩම් පිළිබඳ ලියාපදිංචියට අනුව 2024 යාවත්කාලීන කරනලද තේ ඉඩම් පදනම්කර.

### 5.1.2 කුඩා තේ ඉඩම් හිමියෝ

2005 සංගණන පරිදි කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව 370,842කි. (පර්චස් 20ට වඩා අඩු වගාකරුවන්ද ඇතුළුව) මොවුන්ගෙන් 82%ක් තනි අයිතිය යටතේ වූ ඉඩම් හිමි කුඩා තේ වතු හිමියන් වන අතර, මෙම පිරිස සඳහා තේ වගා භූමි ප්‍රමාණයෙන් 76%ක් පමණ අයත් වේ.

2016 වසර අවසානයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ අධිකාරිය ඒකාබද්ධව ආරම්භකරනු ලැබූ තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන පරිදි කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව 418,262කි. එම තොරතුරු පදනම්කර 2024 වසර යාවත්කාලීන කරනලද කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව 418,989කි.

## 5.1.3 කුඩා තේ ඉඩම් සංඛ්‍යාව

2005 වසරේ සංගණනය පරිදි සමස්ථ කුඩා තේ ඉඩම් කැබලි සංඛ්‍යාව 397,223 සහ බිම් ප්‍රමාණය හෙක්ටයාර 132,329ක් වේ. මෙම ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 123ක් යටතේ ග්‍රාම නිලධාරී වසම් 3,692ක කුඩා තේ ඉඩම් ව්‍යාප්ත වී තිබේ.

කුඩා තේ ඉඩම් අංශයේ තේ ඉඩම් වර්ධනය සඳහා විශේෂයෙන් අමු දළු සඳහා ලැබෙන මිල ඉහළ යාම, තේ වගාව සඳහා දිරි දීමනා මුදල වැඩි කිරීම, ශ්‍රම හිඟය, විශාල ඉඩම් කැබලි කිරීම සහ විකල්ප වගා නොමැති ඉඩම් තේ වගාවට යොමුවීම යන කරුණු බලපා තිබේ.

### සංඛ්‍යා සටහන් අංක - 29

### ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | 2005 කුඩා තේ ඉඩම් සංගණන දත්ත | | 2016 - ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ඉඩම් පිළිබඳ ලියාපදිංචියට අනුව 2024 යාවත්කාලීන කරන ලද දත්ත | |
|---|---|---|---|---|
| | කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව* | හෙක්ටයාර ගණන* | කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව** | හෙක්ටයාර ගණන** |
| කොළඹ | 1,345 | 246 | 1223 | 404 |
| ගම්පහ | 319 | 2 | 277 | 100 |
| කළුතර | 48,752 | 7,823 | 43,984 | 17091 |
| මහනුවර | 31,635 | 16,058 | 29,102 | 11,409 |
| මාතලේ | 1,656 | 1,672 | 1,551 | 740 |
| නුවරඑළිය | 19,361 | 7,205 | 16,802 | 5,861 |
| ගාල්ල | 92,578 | 27,427 | 85,210 | 30,193 |
| මාතර | 73,907 | 25,417 | 65,238 | 25,733 |
| හම්බන්තොට | 2,833 | 546 | 2,542 | 1,004 |
| කුරුණෑගල | - | 180 | - | - |
| බදුල්ල | 33,093 | 9,020 | 30,151 | 9,449 |
| මොණරාගල | 600 | 199 | 572 | 293 |
| රත්නපුර | 118,444 | 30,441 | 108,476 | 43,079 |
| කෑගල්ල | 37,842 | 6,093 | 33,861 | 12,891 |
| **එකතුව** | **462,365** | **132,329** | **418,989** | **158,247** |

මූලාශ්‍රය -*ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තා - 2005
** - 2016 ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ඉඩම් පිළිබඳ ලියාපදිංචියට අනුව 2024 යාවත්කාලීන කර ඇත.

## 5.1.4 කුඩා තේ ඉඩම් වර්ගීකරණය

2016 වසරේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා ඒකාබද්ධව සිදුකළ තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන මඟින් ලබාදෙන ලද දත්ත 2021 සිට යාවත්කාලීන කිරීමට කටයුතුකර ඇත. එම යාවත්කාලීනකළ දත්ත 2024 ආයතනික සංවර්ධන සැලසුම් කටයුතු සඳහා උපයෝගී කරගන්නා ලදී. ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තා - 2005 ට අනුව කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණයෙන් අක්කර 113,190 (34.6%) අක්කර එකකට වඩා අඩු තේ ඉඩම් වන අතර, අක්කර 198,707 (60.8%) අක්කර දෙකකට වඩා අඩු තේ ඉඩම් වේ. අක්කර 10ට වැඩි තේ ඉඩම් ප්‍රමාණය අක්කර 59,731 (18.3%)කි.

පහත සංඛ්‍යා සටහන් අංක 30 පරිදි අක්කර 267,253ක් (හෙක්ටයාර 108,200) අක්කර 10ට අඩු තේ ඉඩම් වේ .

2016 වසරේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ඉඩම් ලියාපදිංචිය 2024 යාවත්කාලීනයට අනුව කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණයෙන් අක්කර 191,625 (49%)ක් අක්කර එකකට වඩා අඩු තේ ඉඩම්වන අතර, අක්කර 305,132 (78%)ක් අක්කර දෙකකට වඩා අඩු තේ ඉඩම් වේ. අක්කර 10ට වැඩි තේ ඉඩම් ප්‍රමාණය අක්කර 101,917කි. එය මුළු තේ ඉඩම් ප්‍රමාණයෙන් 21%ක් වේ. පහත සංඛ්‍යා සටහන් අංක 31 පරිදි අක්කර 390,871 (හෙක්ටයාර 158,247) අක්කර 10ට අඩු තේ ඉඩම් වේ.

## සංඛ්‍යා සටහන් අංක - 30
## 2005 සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය අනුව වර්ගීකරණය

| අක්කර | භූමි ප්‍රමාණය (අක්කර) | ප්‍රතිශතය % | ඉඩම් කැබලි සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 1ට අඩු | 113,190 | 34.6% | 297,342 | 74.9% |
| 1 - 2ට අඩු | 85,517 | 26.2% | 74,314 | 18.7% |
| 2 - 3ට අඩු | 31,882 | 9.8% | 15,101 | 3.8% |
| 3 - 5ට අඩු | 18,413 | 5.6% | 5,299 | 1.3% |
| 5 - 10ට අඩු | 18,251 | 5.6% | 2,936 | 0.7% |
| 10 සහ වැඩි | 59,731 | 18.3% | 2,231 | 0.6% |
| **එකතුව** | **326,984** | | **397,223** | |


මූලාශ්‍රය - ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තා - 2005

## සංඛ්‍යා සටහන් අංක - 31
## ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය සහ කැබලි සංඛ්‍යාව අනුව වර්ගීකරණය

| වර්ගීකරණය | භූමි ප්‍රමාණය (අක්කර) | ප්‍රතිශතය % | ඉඩම් කැබලි සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| පර්චස් 20ට අඩු | 1,083 | 0.22% | 30,742 | 7.28% |
| පර්චස් 20ට අඩු 40ට වැඩි | 10,438 | 2.12% | 44,580 | 10.56% |
| පර්චස් 40ට වැඩි 80ට අඩු | 48,447 | 9.83% | 102,931 | 24.39% |
| අක්කර 0.5ට වැඩි 1ට අඩු | 131,657 | 26.72% | 144,964 | 34.35% |
| අක්කර 1ට වැඩි 2ට අඩු | 113,507 | 23% | 71,714 | 17% |
| අක්කර 2ට වැඩි 3ට අඩු | 35,570 | 7.22% | 14,205 | 3.37% |
| අක්කර 3ට වැඩි 5ට අඩු | 25,875 | 5.25% | 6,460 | 1.53% |
| අක්කර 5ට වැඩි 10ට අඩු | 24,294 | 4.93% | 3,393 | 0.80% |
| **කුඩා තේ වතු අංශයේ එකතුව** | **390,871** | | **418,989** | |
| අක්කර 10ට වැඩි 50ට අඩු | 59,440 | 12.06% | 2,810 | 0.67% |
| අක්කර 50ට වැඩි | 42,477 | 8.62% | 255 | 0.06% |
| **සමස්ථ තේ වතු අංශයේ එකතුව** | **492,788** | | **422,054** | |

මූලාශ්‍රය- ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තා
2016 -ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ඉඩම් පිළිබඳ ලියාපදිංචියට අනුව 2024 යාවත්කාලීනකර ඇත.

## ප්‍රස්තාර සටහන් අංක - 12
## භූමි ප්‍රමාණය අනුව කුඩා තේ ඉඩම් ව්‍යාප්තිය





මූලාශ්‍රය- 2016 -ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ඉඩම් පිළිබඳ ලියාපදිංචියට අනුව 2024 යාවත්කාලීනකරන ලද දත්ත.

## 5.2 කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය

2024 වසරේ ජාතික තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 262.159කි. එය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී කිලෝ ග්‍රෑම් මිලියන 6.12කින් හෙවත් 2.39%කින් ජාතික නිෂ්පාදනය වැඩි වීමක් වී තිබේ.


එසේම 2024 වර්ෂයේ කුඩා තේ වතු අංශයේ සමස්ථ තේ නිෂ්පාදනය ද කිලෝග්‍රෑම් මිලියන 197.154කි. එය පෙර වර්ෂය හා සැසඳමේ දී 6.492කින් හෙවත් 3.40%කින් නිෂ්පාදනය වැඩි වීමක් වී තිබේ.

### ප්‍රස්තාර සටහන් අංක - 13




මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිෂ්පාදන දත්ත

### ප්‍රස්තාර සටහන් අංක - 14




මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 5.3 කුඩා තේ ඉඩම්වල නිෂ්පාදන සංයුතිය හා ඵලදායීතාවය

2024 වර්ෂයේ සමස්ත කුඩා තේ නිෂ්පාදනයෙන් පහතරට තේ නිෂ්පාදනය 78.38%ක්ද, මැදරට තේ නිෂ්පාදනය 16.1%ක්ද, උඩරට තේ නිෂ්පාදනය 5.5% වේ. (සංඛ්‍යා සටහන් අංක 32)

2023 වර්ෂය හා සසඳන කල 2024 වර්ෂයේදී කුඩා තේ ඉඩම් අංශයේ පහතරට තේ නිෂ්පාදනය 2.6%කින් ද මැදරට තේ නිෂ්පාදනය 11.23%කින්ද වැඩි වී ඇති අතර උඩරට තේ නිෂ්පාදනය 5.50%කින් අඩුවී තිබේ.

## සංඛ්‍යා සටහන් අංක - 32
## කුඩා තේ ඉඩම් අංශයේ තේ නිෂ්පාදනය හා නිෂ්පාදන දායකත්වය (පිහිටීම මත) 2021 - 2024 දක්වා

| | | වර්ෂය | උඩරට | මැදරට | පහත රට | එකතුව |
|---|---|---|---|---|---|---|
| කුඩා තේ බිම් ප්‍රමාණය | (හෙක්ටයාර) | 2005 | 5,913 | 21,403 | 89,176 | 116,492 |
| | දායක ප්‍රතිශතය | | 5% | 18% | 77% | |
| | (හෙක්ටයාර) | 2024 | 6,604 | 16,868 | 134,775 | 158,247 |
| | දායක ප්‍රතිශතය | | 4% | 11% | 85% | |
| ජාතික නිෂ්පාදනය | මෙට්‍රික් ටොන් | 2021 | 65,270 | 50,905 | 183,161 | 299,336 |
| | ප්‍රතිශතය | | 22% | 17% | 61% | |
| | මෙට්‍රික් ටොන් | 2022 | 56,320 | 40,183 | 154,994 | 251,497 |
| | ප්‍රතිශතය | | 22% | 16% | 62% | |
| | මෙට්‍රික් ටොන් | 2023 | 58,639 | 42,337 | 155,061 | 256,037 |
| | ප්‍රතිශතය | | 23% | 17% | 61% | |
| | මෙට්‍රික් ටොන් | 2024 | 55,721 | 47,621 | 158,816 | 262,158 |
| | ප්‍රතිශතය | | 21% | 18% | 61% | |
| කුඩා තේ නිෂ්පාදනය | මෙට්‍රික් ටොන් | 2021 | 12,339 | 33,631 | 177,225 | 223,195 |
| | ප්‍රතිශතය | | 6% | 15% | 79% | |
| | මෙට්‍රික් ටොන් | 2022 | 11,958 | 27,287 | 150,488 | 189,733 |
| | ප්‍රතිශතය | | 6% | 14% | 79% | |
| | මෙට්‍රික් ටොන් | 2023 | 11,490 | 28,546 | 150,625 | 190,661 |
| | ප්‍රතිශතය | | 6% | 15% | 79% | |
| | මෙට්‍රික් ටොන් | 2024 | 10,857 | 31,753 | 154,543 | 197,153 |
| | ප්‍රතිශතය | | 6% | 16% | 78% | |
| ජාතික නිෂ්පාදනයට දායකත්වය | ප්‍රතිශතය | 2021 | 19% | 66% | 97% | |
| | | 2022 | 21% | 68% | 97% | |
| | | 2023 | 20% | 67% | 97% | |
| | | 2024 | 19% | 67% | 97% | |

මූලාශ්‍රය :කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තාව 2005 - ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

* 2016වසරේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ඉඩම් ලියාපදිංචියට අනුව යාවත්කාලීන කරනලද බිම් ප්‍රමාණ තොරතුරු පදනම්කර ඵලදායීතාවය ගණනය කර ඇත.

** බිම් ප්‍රමාණය 2024 වර්ෂය වන විට.

## 5.4 කුඩා තේ අංශයේ දායකත්වය හා ඵලදායීතාවයේ සමාලෝචනය

තේ නිෂ්පාදනයට 2020, 2021, 2022, 2023 හා 2024 යන පස් වසරෙහි ජාතික නිෂ්පාදනයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනයයි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ නිෂ්පාදනය පිළිබඳ දත්ත පරිදි 2024 වසරේ කුඩා තේ ඉඩම් අංශයේ සාමාන්‍ය ඵලදායීතාවය හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම් 1,246කි. 2023 වසරේ කුඩා තේ ඉඩම් අංශයේ සාමාන්‍ය ඵලදායීතාවය හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම් 1,205කි.

හෙක්ටයාර ඵලදායීතාවය ගණනය කිරීම 2020 වසර දක්වා සිදුකර ඇත්තේ 2005 තේ ඉඩම් සංගණනයේ කුඩා තේ ඉඩම් ගණන පදනම් කරගෙනය. එසේ වුවද 2021, 2022, 2023 හා 2024 වසරේ දී එය, 2016 වසරේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ඉඩම් ලියාපදිංචියට අනුව බිම් ප්‍රමාණ තොරතුරු පදනම් කර හෙක්ටයාර ඒකක ඵලදායීතාවය ගණනය කර ඇත.

දිස්ත්‍රික්ක 14ක තේ වගා කරන අතර ප්‍රාදේශීය කාර්යාල 08ක් පමණක් ඇති බැවින් සමහර ප්‍රාදේශීය කාර්යාලවලට දිස්ත්‍රික්ක දෙකක් ඇතුලක් වන නමුත් තේ පරීක්ෂක කොට්ඨාශ මට්ටමින් ගණනයේදී එම දිස්ත්‍රික්කවල බිම් ප්‍රමාණය එකතුකර ගණනය කර ඇත.

### සංඛ්‍යා සටහන් අංක- 33
### කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායීතාවය පරිපාලන දිස්ත්‍රික්ක පදනමින් - 2024
**(නිමි තේ / කිලෝ ග්‍රෑම්)**

| පරිපාලන දිස්ත්‍රික්කය | කුඩා තේ බිම් ප්‍රමාණය (හෙක්ටයාර) ** | නිෂ්පාදනය | නිෂ්පාදනය | නිෂ්පාදනය | නිෂ්පාදනය | ඵලදායීතාව (හෙක්ටයාරයකට නිමි තේ)* |
|---|---|---|---|---|---|---|
| | | උස් බිම් | මැදි බිම් | පහත් බිම් | එකතුව | |
| බදුල්ල,මොණරාගල | 9,742 | 4,662,306 | 6,883,181 | | 11,545,487 | 1,185 |
| ගාල්ල | 30,193 | | | 36,997,637 | 36,997,637 | 1,225 |
| හම්බන්තොට | 1,004 | | | 179,576 | 179,576 | 179 |
| කළුතර | 17,091 | | | 15,514,553 | 15,514,553 | 908 |
| කොළඹ | 404 | | | 1,334,650 | 1,334,650 | 3,303 |
| මහනුවර | 11,409 | | 18,279,234 | 8,135,180 | 26,414,414 | 2,315 |
| කෑගල්ල ,ගම්පහ | 12,991 | | 14,566 | 10,231,356 | 10,245,922 | 789 |
| මාතලේ | 740 | | 553,911 | 389,044 | 942,955 | 1,275 |
| මාතර | 25,733 | | | 28,124,719 | 28,124,719 | 1,093 |
| නුවරඑළිය | 5,861 | 6,194,958 | 5,729,219 | 1,674,185 | 13,598,362 | 2,320 |
| රත්නපුර | 43,079 | | 293,393 | 51,962,770 | 52,256,163 | 1,213 |
| **එකතුව** | **158,247** | **10,857,264** | **31,753,504** | **154,543,670** | **197,154,438** | **1,246** |
| **2024 තේ මණ්ඩලයේ තේ වගා බිම් ලියාපදිංචියට අනුව බිම් ප්‍රමාණය (හෙක්ටයාර)** | | 6,604 | 16,868 | 134,775 | **158,247** | |
| **ඇස්තමේන්තු ගත සාමාන්‍ය ඵලදායීතාව/ හෙක්ටයාරයකට** | 2019 | 1,954 | 1,462 | 2,051 | 1,938 | - |
| | 2020 | 2,003 | 1,418 | 1,833 | 1,766 | - |
| | 2021 | 1,787 | 2,068 | 1,316 | 1,414 | - |
| | 2022 | 1,540 | 1,773 | 1,115 | 1,200 | - |
| | 2023 | 1,634 | 1,747 | 1,117 | 1,205 | - |
| | **2024** | **1,644** | **1,882** | **1,147** | **1,246** | **-** |

මූලාශ්‍රය2016 - -ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ඉඩම් පිළිබඳ ලියාපදිංචියට අනුව 2024 යාවත්කාලීනකරන ලද දත්ත.

* ඵලදායීතවය ගණනය කිරීම සඳහා පර්චස් 20ට අඩු භූමි ප්‍රමාණයන් අත්හැර ගණනය කර ඇත.

* පරිපාලන දිස්ත්‍රික් පදනමට පරිබාහිරව කම්හල් වලට අමු දළු මිලදී ගැනීම මත සමහර දිස්ත්‍රික්ක වල නිෂ්පාදන දත්ත යථානුරූපී නොවේ.

** පර්චස් 20ට අඩු භූමි ප්‍රමාණයද සහිතද දක්වා ඇත.

# හයවන පරිච්ඡේදය

## 6. කුඩා තේ ඉඩම් අංශයේ වගා පිරිවැය හා දළු මිල

6.1 ශ්‍රම පිරිවැය

6.2 අමු දළු කිලෝග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය

6.3 2024 වර්ෂයේ පැවති දළු මිල හා ඇස්තමේන්තු ගත පිරිවැය

6.4 තේ නැවත වගා කිරීමේ පිරිවැය

6.5 හෙක්ටයාර එකක් සඳහා වූ දිරි දීමනා අනුපාතිකය සහ වගා පිරිවැය

# 6. කුඩා තේ ඉඩම් අංශයේ වගා පිරිවැය හා දළු මිල

## 6.1 ශ්‍රම පිරිවැය

කුඩා තේ ඉඩම් අංශයෙහි තත්ත්වයන් පිළිබඳ ක්ෂේත්‍ර මට්ටමින් ලබාගන්නා වාර්ෂික තොරතුරු අනුව ශ්‍රම පිරිවැය වැඩි වීමට හේතුව කුඩා තේ ඉඩම් අංශයේ දළු නෙලීම, කප්පාදුව, වල්පැළ නෙලීම ආදිය සඳහා ශ්‍රමික හිඟයද දෛනික වේතන මට්ටම සලකා බැලීමේදී පඩි පාලක සභා ආඥා පනතට අනුව ගෙවීමට නියමිත වේතන මට්ටමට වඩා වැඩි මුදලක් ගෙවනු ලැබීම බව අනාවරණයවන කරුණු වේ.

ඒ අනුව සංවිධානාත්මක නොවන කුඩා තේ ඉඩම් අංශයේ දෛනික කම්කරු වේතන මට්ටම සංවිධානාත්මක කුඩා තේ ඉඩම් අංශයේ වේතන මට්ටමට වඩා වැඩි අගයක් ශ්‍රමයේ මිල වශයෙන් වාර්තා වී තිබුණි.

එමෙන්ම දළු නෙලීම සඳහා ශ්‍රමිකයන්ට ගෙවීම් කිරීමේදී නෙලන ලද දළු කිලෝ ග්‍රෑම් ප්‍රමාණය මත වැටුප් ගෙවීම, දෛනිකව නෙලූ දළු ප්‍රමාණයේ සාමාන්‍යය ඉක්මවන විට කිලෝ ග්‍රෑමයකට අමතර මිලක් ගෙවීම වැනි අවස්ථාද ඇත. කප්පාදුව වැනි පුහුණු ශ්‍රමික කාර්යයන් සඳහා දළු නෙලීමේ දෛනික කුලියට වඩා ඉහළ දෛනික කුලියක් ගෙවනු ලබන බවද වාර්තා වී තිබේ.

## 6.2 අමු දළු කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ දත්ත පරිදි පිහිටීම මත කොළඹ තේ වෙන්දේසියේ ලද මිල පරිදි ගණනය කරනු ලැබූ අමු දළු කිලෝ ග්‍රෑමයක ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැය සහ දළු කිලෝග්‍රෑමයකට ගෙවන සාමාන්‍ය මිල සංඛ්‍යා සටහන් අංක 34 මඟින් දැක්වේ.

2023 වර්ෂය හා සසඳන විට 2024 දී දළු කිලෝ ග්‍රෑමයක් සඳහා ගෙවා ඇති සාමාන්‍ය මිල රුපියල් 16.50කින් එනම් 10.14%කින් ඉහළ ගොස් තිබුණි. නිෂ්පාදන පිරිවැය රුපියල් 137.09ක් දක්වා වැඩි වී තිබේ.

**සංඛ්‍යා සටහන් අංක - 34**
**අමු තේ දළු කිලෝ ග්‍රෑමයකට ලැබුණු සාමාන්‍ය මිල හා නිෂ්පාදන පිරිවැය**

| වර්ෂය | ගෙවන සාමාන්‍ය මිල (කිලෝ ග්‍රෑමයකට රුපියල්) | සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය (කිලෝ ග්‍රෑමයකට රුපියල්) |
|---|---|---|
| 2008 | 45.45 | 36.24 |
| 2009 | 52.71 | 37.24 |
| 2010 | 54.11 | 38.56 |
| 2011 | 52.63 | 44.43 |
| 2012 | 57.27 | 49.5 |
| 2013 | 64.99 | 51.4 |
| 2014 | 67.54 | 54.54 |
| 2015 | 58.8 | 55.08 |
| 2016 | 68.53 | 64.52 |
| 2017 | 90.69 | 71.65 |
| 2018 | 85.48 | 71.86 |
| 2019 | 80.15 | 56.28 |
| 2020 | 92.55 | 59.94 |
| 2021 | 90.57 | 65.2 |
| 2022 | 182.07 | 136.33 |
| 2023 | 162.66 | 136.09 |
| 2024 | 179.16 | 137.09 |

මූලාශය - ශ්‍රී ලංකා තේ මණ්ඩල දත්ත

## 6.3 2024 වර්ෂයේ පැවැති දළු මිල හා ඇස්තමේන්තුගත පිරිවැය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ දත්ත පරිදි සියළුම උච්චත්වයන් සඳහා නිමි තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල 2023 වර්ෂයට වඩා 2024 වසරේදී පහළ ගොස් තිබුණි. 2023 වර්ෂයට සාපේක්ෂව උඩරට අමු තේ දළු කිලෝග්‍රෑමයකට ගෙවනලද මිල 6.44%ක්ද, මැදරට සඳහා ගෙවනු ලැබූ මිල 5.15% දක්වා ද, පහතරට බිම් සඳහා ගෙවනු ලැබූ මිල රුපියල් 4.17%කින් ද 2024 වර්ෂයේ ඉහළ ගොස් තිබුණි. සමස්ත සාමාන්‍ය දළු කිලෝග්‍රෑමයකට ගෙවූ මිල 2023 වසරේ රුපියල් 162.66 සිට රුපියල් 179.16 දක්වා, 2024 වසරේ ඉහළ ගොස් තිබුණි. එහි තවදුරටත් විස්තර සංඛ්‍යා සටහන් අංක 35 මඟින් නිරූපනය කර ඇත.

## සංඛ්‍යා සටහන් අංක- 35
## අමු තේ දළු කිලෝ ග්‍රෑමයකට ගෙවන ලද මිල

| උච්චතාවය අනුව අමු තේ දළු | 2021 වර්ෂය (රුපියල්) | 2022 වර්ෂය (රුපියල්) | 2023 වර්ෂය (රුපියල්) | 2024 වර්ෂය (රුපියල්) | මිල වෙනස්වූ ප්‍රමාණය (රුපියල්) 2023 සාපේක්ෂව |
|---|---|---|---|---|---|
| උඩරට | 87.47 | 163.36 | 156.84 | 166.95 | 12.19 |
| මැදිබිම් | 80.77 | 151.58 | 148.04 | 155.67 | 9.64 |
| පහත් බිම් | 94.44 | 196.70 | 183.11 | 190.75 | 8.84 |
| සමස්ත සාමාන්‍ය මිල දළු කිලෝ ග්‍රෑමයකට | 90.57 | 182.07 | 162.66 | 179.16 | 9.64 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ දත්ත

## 6.4 තේ නැවත වගා කිරීමේ පිරිවැය

ශ්‍රම ඌණතාවය මත තේ නැවත වගා කිරීම සඳහා දැරිය යුතුවන කම්කරු පිරිවැය ඉහළ මට්ටමක පැවතීම, පොහොර සඳහා මූල්‍ය සහනාධාර ප්‍රමාණය ඉවත් කිරීම, රසායනික පොහොර ආනයනය සීමාකිරීම නිසා වෙළඳපලේ පොහොර මිල අධික වීම, වගා පිරිවැය ඉහළ යාමට විශේෂයෙන් බලපා ඇත. මුළු පිරිවැයෙන් 80%ක ප්‍රමාණයක් ශ්‍රම පිරිවැය වශයෙන් දැරීමට සිදුව ඇත. හෙක්ටයාර එකක තේ නැවත වගාකිරීමේ පිරිවැය ඇස්තමේන්තුව පහත සංඛ්‍යා සටහන් අංක 36න් අනාවරණය වේ.

## සංඛ්‍යා සටහන් අංක- 36

## හෙක්ටයාර එකක තේ නැවත වගාකිරීමේ පිරිවැය ඇස්තමේන්තුව - 2023/2024 (රුපියල්) (උදුරා දැමීමේ සිට දළු නෙලීම අවධිය දක්වා)

| කාර්යය | 2023 | | 2024 | |
|---|---|---|---|---|
| | උඩරට හා මැදරට බිම් (රුපියල්) | උඩරට හා මැදරට බිම් (රුපියල්) | උඩරට හා මැදරට බිම් (රුපියල්) | පහතරට බිම් (රුපියල්) |
| උදුරා දැමීම (පළමු වසර) | 983,871 | 816,237 | 1,282,880 | 1,031,260 |
| පස පුනරුත්ථාපනය (දෙවන වසර) | 383,350 | 480,285 | 385,350 | 453,050 |
| තේ වගා කිරීම (තෙවන වසර) | 1,897,000 | 1,823,000 | 2,113.500 | 1,917,500 |
| පළමු වසර නඩත්තුව (සිව්වන වසර) | 1,298,750 | 1,264,500 | 1,142,250 | 1,093,800 |
| දෙවන වසර නඩත්තුව (පස්වන වසර) | 904,750 | 885,500 | 793,750 | 767,500 |
| එකතුව | **5,467,721** | **5,269,522** | **5,717,730** | **5,263,110** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

## 6.5 හෙක්ටයාර එකක් සඳහා වූ දිරිදීමනා අනුපාතිකය සහ වගා පිරිවැය

2024 වසර තුළදී පැවැති වගා දිරිදීමනාව හා වගා පිරිවැය ප්‍රමාණයන් සලකා බලනවිට වගා වියදමින් ආසන්න වශයෙන් 12%ක් පමණ නැවත වගා දිරිදීමනා මුදලින් ආවරණයකර ගැනීමට හැකි වී තිබූ බව පහත සංඛ්‍යා සටහන් අංක 37 මගින් පැහැදිලි වේ.

### සංඛ්‍යා සටහන් අංක- 37
### හෙක්ටයාර එකක් සඳහා වූ දිරිදීමනා අනුපාතිකය සහ වගා පිරිවැය

| වර්ෂය | * වගා පිරිවැය (රුපියල්) | | වගා ආධාර අනුපාතිකය | | වගා පිරිවැයෙන් ආවරණ ප්‍රතිශතය (%) | |
|---|---|---|---|---|---|---|
| | උඩරට හා මැදරට බිම් | පහතරට බිම් | උඩරට හා මැදරට බිම් | පහතරට බිම් | උඩරට හා මැදරට බිම් | පහතරට බිම් |
| 1997 | 361,643 | 327,769 | 67,000 | 57,000 | 18% | 17% |
| 1998 | 411,564 | 347,456 | *110000 | *100000 | 27% | 29% |
| 1999 | 445,504 | 377,068 | 110,000 | 100,000 | 25% | 27% |
| 2000 | 485,894 | 396,186 | 110,000 | 100,000 | 23% | 25% |
| 2001 | 550,744 | 513,866 | 110,000 | 100,000 | 20% | 19% |
| 2002 | 653,463 | 589,916 | 110,000 | 100,000 | 17% | 17% |
| 2003 | 712,815 | 643,451 | 160,000 | 150,000 | 22% | 23% |
| 2004 | 796,315 | 717,351 | 160,000 | 150,000 | 20% | 20% |
| 2005 | 1,026,322 | 1,009,427 | 160,000 | 150,000 | 16% | 15% |
| 2006 | 1,031,377 | 1,024,287 | 200,000 | 190,000 | 19% | 19% |
| 2007 | 1,148,177 | 1,125,494 | 200,000 | 190,000 | 17% | 17% |
| 2008 | 1,458,989 | 1,420,360 | 200,000 | 190,000 | 14% | 13% |
| 2009 | 1,516,332 | 1,452,292 | 200,000 | 190,000 | 13% | 13% |
| 2010 | 1,704,051 | 1,625,290 | 200,000 | 190,000 | 12% | 12% |
| 2011 | 1,836,280 | 1,724,904 | 250,000 | 240,000 | 14% | 14% |
| 2012 | 1,836,280 | 1,724,904 | 300,000 | 300,000 | 16% | 17% |
| 2013 | 1,929,930 | 1,810,904 | 350,000 | 350,000 | 18% | 19% |
| 2014 | 1,929,930 | 1,810,904 | 350,000 | 350,000 | 18% | 19% |
| 2015 | 2,304,530 | 2,154,904 | 500,000 | 500,000 | 22% | 23% |
| 2016 | 2,823,735 | 2,648,442 | 500,000 | 500,000 | 18% | 19% |
| 2017 | 3,393,454 | 3,177,175 | 500,000 | 500,000 | 15% | 16% |
| 2018 | 3,441,019 | 3,222,744 | 500,000 | 500,000 | 15% | 16% |
| 2019 | 3,471,171 | 3,224,282 | 500,000 | 500,000 | 14% | 15% |
| 2020 | 3,520,931 | 3,268,212 | 500,000 | 500,000 | 14% | 15% |
| 2021 | 3,525,561 | 3,280, 562 | 630,000 | 630,000 | 17% | 19% |
| 2022 | 5,410,561 | 5,167,162 | 630,000 | 630,000 | 11.6% | 12% |
| 2023 | 5,467,721 | 5,269,522 | 630,000 | 630,000 | 12% | 12% |
| 2024 | 5,717,730 | 5,263,110 | 630,000 | 630,000 | 11% | 12% |

මූලාශ්‍රය :තේ පර්යේෂණායතනයේ තොරතුරු පදනම්කර.

## උප ලේඛන අංක - 01

## අමු තේ දළු කිලෝවක් සඳහා වන නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව 2024

**(පහත රට වසරකට/ හෙක්ටයාරයකට/ අමු දළු කිලෝග්‍රෑම් 5,185 (සකස් කල තේ කිලෝග්‍රෑම් 1,115 බැගින්)**

| අනු අංකය | ක්‍රියාකාරීත්වය | කටයුතු කිරීමේ වාර ගණන | ශ්‍රම ඒකක | අමු ද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | % |
|---|---|---|---|---|---|---|
| 1 | දළු නෙලීම (එක් අයෙකුට දිනකට කිලෝග්‍රෑම් 25 බැගින් ) | වාර 45 බැගින් 1/2 ශ්‍රමය | 207 | | 186651 | 26.8% |
| 2 | වල්පැළ මර්ධනය | මාසයකට කම්කරුවන් 10 බැගින් | 58 | | 68150 | 10% |
| 3 | පොහොර මිශ්‍රණය හා යෙදීම් | | | | | |
| | i පරිනත තේ පොහොර මිශ්‍රණ දැමීම | කම්කරුවන් 8 බැගින් ( වාර 2 -4 දක්වා) | 24 | 296400 | 324600 | 47% |
| | ii ඩොලමයිට් දැමීම | කම්කරුවන් 4 බැගින් ( වාර 2 චක්‍රයට) | 2 | 6003 | 8353 | 1.2% |
| | iii සින්ක් සල්ෆේට් දැමීම | කම්කරුවන් 5 බැගින් ( වාර 2 බැගින් ) | 5 | 3300 | 9175 | 1.3% |
| 4 | සෙවන ගස් පාලනය | කම්කරුවන් 5 බැගින් (වාර 2 බැගින්) | 10 | | 11750 | 1.7% |
| 5 | කප්පාදු කිරීම | කම්කරුවන් 30-40 බැගින් ( වාර 2 චක්‍රයට) | 20 | | 30000 | 4.3% |
| 6 | පාසි ආදිය ඉවත් කිරීම | කම්කරුවන් 12-20 බැගින් | 6 | | 7050 | 1.01% |
| 7 | මට්ටම් කැඩීම | කම්කරුවන් 12-20 බැගින් ( වාර 2 චක්‍රයට) | 6 | | 7050 | 1.01% |
| 8 | කාණු කැපීම | කම්කරුවන් 36 බැගින් ( වාර 2 චක්‍රයට) | 18 | | 21150 | 3.0% |
| 9 | පාළු සැපයීම | කම්කරුවන් 16/ හා පැළ 375ක් සඳහා | 8 | 13125 | 22525 | 3.2% |
| | | | 364 | 318828 | 696454 | |
| අමු දළු කිලෝවක් සඳහා සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය | | | **134.09** | | | |
| | ප්‍රවාහන වියදම ( රුපියල්) | | 3.00 | | | |
| | **නිෂ්පාදන පිරිවැය ( රුපියල්)** | | **137.09** | | | |
| * | පහත් බිම් සඳහා වසර 2ක කාල චක්‍රය උපයෝගී කරගෙන ඇත. | | | | | |
| * | පොහොර මිශ්‍රණ හා ප්‍රමාණවත් තේ පර්යේෂණායතන නිර්දේශ වලට අනුව වන අතර මිල ගණන් වර්ෂයේ පැවති මිල ගණන් වේ. | | | | | |
| * | රිකිළි තේ පැලයක මිල රු. 45.00 | | | | | |
| * | ප්‍රවාහන පිරිවැය අමුද්‍රව්‍ය පිරිවැයට ඇතුළත් කර ඇත. | | | | | |
| | | | රුපියල් | | | |
| * | කම්කරු දෛනික වේතනය | | 2,000.00 | | | |
| * | කප්පාදුව සඳහා දෛනික වේතනය | | 3,000.00 | | | |
| * | ඩොලමයිට් මෙ. ටො. 1 | | 20,000.00 | | | |
| * | සින්ක් සල්ෆේට් කි. ග්‍රෑ . 01 | | 250.00 | | | |
| * | UT-397/VPLC/U709/UT752 මෙ.ටො.1 | | 170,000.00 | | | |
| * | දළු නෙලීම | | 1,500.00 | | | |

## උප ලේඛන අංක - 02

## කුඩා තේ වතු අංශයේ තේ නිෂ්පාදනය
## 1984 - 2024 දක්වා (කිලෝග්‍රෑම් මිලියන)

| වර්ෂය | ජාතික නිෂ්පාදනය | කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය | | ජාතික නිෂ්පාදනයට දායකත්වය % |
|---|---|---|---|---|
| | | නිෂ්පාදනය | වර්ධන ප්‍රතිශතය | |
| **1984** | 208.05 | 77.4 | 6.9 | 37.2 |
| **1985** | 214.09 | 82 | 120.4 | 38.3 |
| **1986** | 211.27 | 83 | 1.2 | 39.3 |
| **1987** | 213.32 | 91.1 | 9.75 | 42.7 |
| **1988** | 226.95 | 100.2 | 9.99 | 44.2 |
| **1989** | 206.98 | 92.2 | -8.98 | 44.5 |
| **1990** | 223.16 | 113.7 | 23.3 | 48.7 |
| **1991** | 240.74 | 121.1 | 6.51 | 50.3 |
| **1992** | 178.86 | 94.9 | -21.63 | 53 |
| **1993** | 231.87 | 125.3 | 32.02 | 54 |
| **1994** | 242.21 | 139.8 | 11.57 | 57.7 |
| **1995** | 245.96 | 140 | 0.14 | 56.9 |
| **1996** | 258.42 | 147.8 | 5.57 | 57.2 |
| **1997** | 276.86 | 149.3 | 1.01 | 53.9 |
| **1998** | 280.05 | 165.9 | 11.12 | 59.2 |
| **1999** | 283.76 | 164 | -1.11 | 57.8 |
| **2000** | 305.84 | 183.7 | 12.01 | 60 |
| **2001** | 295.09 | 183.4 | -0.06 | 62.1 |
| **2002** | 310.03 | 189.5 | 3.33 | 61.1 |
| **2003** | 303.23 | 187.9 | -0.84 | 61.9 |
| **2004** | 308.08 | 203 | 8.04 | 65.9 |
| **2005** | 317.19 | 205.8 | 2.95 | 64.9 |
| **2006** | 310.82 | 212.4 | 3.2 | 68.3 |
| **2007** | 304.61 | 205.7 | -3.1 | 67.5 |
| **2008** | 318.69 | 214.8 | 4.4 | 67.4 |
| **2009** | 291.13 | 201.9 | -6 | 69.3 |
| **2010** | 331.42 | 230.1 | 13.98 | 69.4 |
| **2011** | 327.53 | 229 | -0.48 | 69.9 |
| **2012** | 326.27 | 233.1 | 1.78 | 71.4 |
| **2013** | 340.22 | 245.4 | 5.3 | 72.2 |
| **2014** | 338.03 | 247.4 | 0.8 | 73.1 |
| **2015** | 328.96 | 239.86 | -3 | 72.9 |
| **2016** | 292.57 | 218.06 | -9 | 74.5 |
| **2017** | 307.72 | 232.42 | 6.6 | 75.5 |
| **2018** | 303.94 | 228.05 | -1.9 | 75 |
| **2019** | 300.13 | 225.73 | -1.02 | 75.2 |
| **2020** | 278.49 | 205.67 | -8.08 | 73.8 |
| **2021** | 299.33 | 223.2 | 8.52 | 74.6 |
| **2022** | 251.44 | 189.73 | -14.99 | 75.4 |
| **2023** | 256.03 | 190.66 | 0.005 | 74.4 |
| **2024** | 262.15 | 197.15 | 3.4 | 75.2 |

මූලාශ්‍රය :ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිෂ්පාදන දත්ත.

## උප ලේඛන අංක - 03

## තේ අපනයනය හා විදේශ විනිමය ඉපයීම්
## 1996 – 2024

| වර්ෂය | **අපනයනය කල ප්‍රමාණය (කිලෝග්‍රෑම් මිලියන) | *අපනයනය ඉපයීම් ප්‍රමාණය (රුපියල් මිලියන) | මුළු අපනයන ඉපයීම් වලට දායක ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| **1996** | 244 | 34,068 | 15.02 |
| **1997** | 269 | 42,533 | 15.51 |
| **1998** | 272 | 50,280 | 16.19 |
| **1999** | 269 | 43,728 | 13.44 |
| **2000** | 288 | 53,133 | 12.06 |
| **2001** | 294 | 61,602 | 14.31 |
| **2002** | 291 | 63,105 | 14 |
| **2003** | 298 | 65,937 | 13.3 |
| **2004** | 300 | 74,890 | 12.08 |
| **2005** | 309 | 81,480 | 12.7 |
| **2006** | ***315 | ***86,337 | 12.8 |
| **2007** | ***294 | ***106,217 | 13.2 |
| **2008** | 320 | 137,585 | 15.6 |
| **2009** | 280 | 136,183 | 16.7 |
| **2010** | 315 | 155,608 | 16.6 |
| **2011** | 323 | 164,869 | 14.1 |
| **2012** | 320 | 180,430 | 14.48 |
| **2013** | 319.6 | 199,446 | 14.8 |
| **2014** | 327.3 | 212,588 | 14.6 |
| **2015** | 306.9 | 182,054 | 12.8 |
| **2016** | 288.7 | 184,778 | 12.3 |
| **2017** | 288.9 | 233,338 | 13.5 |
| **2018** | 282.4 | 231,750 | 12 |
| **2019** | 292.65 | 240,636 | 13.41 |
| **2020** | 265.56 | 230,170 | 12.35 |
| **2021** | 285.871 | 263,353 | 12.5 |
| **2022** | 250.171 | 411,054 | 10 |
| **2023** | 241.91 | 428,291 | 10.9 |
| **2024** | 245.78 | 433,473 | 11.2 |

* ප්‍රති අපනයන ඉපයීම් සහිතව
** ආනයනික තේ ද ඇතුළුව
***ප්‍රති අපනයන ඉපයීම් රහිත
මූලාශ්‍රය :- ශ්‍රී ලංකා තේ මණ්ඩල ප්‍රගති වාර්තාව 2024
ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව

# හත්වන පරිච්ඡේදය

## 7. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2024.12.31 දිනට අවසන් ගිණුම් හා විගණකාධිපති වාර්තාව

- **7.1** කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2024.12.31 දිනට අවසන් ගිණුම්
- **7.2** මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්
- **7.3** විගණකාධිපති වාර්තාව

## 9.අවසාන ගිණුම්

### කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

2024 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

| | සටහන් අංකය | 2024 | | 2023 | |
|---|---|---|---|---|---|
| <u>වත්කම්</u> | | | | | |
| <u>ජංගම වත්කම්</u> | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 278,798,703 | | 298,661,215 | |
| ලැබිය යුතු දෑ | 2 | 125,796,898 | | 126,601,072 | |
| තොගය | 3 | 63,221,906 | | 71,929,699 | |
| පූර්ව ගෙවීම් | 4 | 758,165 | | 466,831 | |
| සිදු කරමින් පවතින වැඩ | 5 | 17,420,401.28 | | | |
| | | | 485,996,074 | | 497,658,817 |
| <u>ජංගම නොවන වත්කම්</u> | | | | | |
| ආයෝජන (ස්ථාවර තැන්පතු) | 6 | | 25,010,240 | | 23,127,357 |
| වෙනත් මූල්‍ය වත්කම් | 7 | | 4,918,777 | | 4,947,105 |
| දේපළ, පිරියත හා උපකරණ | 8 | 1,049,787,625 | | 927,167,806 | |
| අඩුකළා - සමුච්චිත ක්ෂය වීම් | | (314,932,731) | <u>734,854,894</u> | (251,072,778) | <u>676,095,028</u> |
| මුළු වත්කම් | | | **1,250,779,985** | | **1,201,828,307** |
| <u>වගකීම්</u> | | | | | |
| <u>ජංගම වගකීම්</u> | | | | | |
| ගෙවිය යුතු | 9 | 113,560,830 | 165,109,445 | | |
| උපචිත වියදම් | 10 | 27,933,035 | | 133,123,256 | |
| | | | 141,493,865 | | 298,232,701 |
| <u>ජංගම නොවන වගකීම්</u> | | | | | |
| <u>සේවක ප්‍රතිලාභ(පාරිතෝෂික)</u> | 11 | | <u>198,650,839</u> | | <u>176,451,793</u> |
| මුළු වගකීම් | | | **<u>340,144,705</u>** | | **<u>474,684,494</u>** |
| ශුද්ධ වත්කම් | | | **<u>910,635,281</u>** | | **<u>727,143,813</u>** |
| රජය විසින් ලබා දුන් ප්‍රදානය | | - | | 322,890,842 | |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 233,189,932 | | 232,935,807 | |
| සමුච්චිත අතිරික්තය/(ඌණතා) | | 677,445,348 | <u>910,635,281</u> | 171,317,164 | <u>727,143,813</u> |
| මුළු ශුද්ධ හිමිකම/සම කොටස් | | **<u>910,635,281</u>** | | | **<u>727,143,813</u>** |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම කළමණාකාරිත්වය සතු වේ. මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කර අත්සන් තබා ඇත.

සභාපති අධ්‍යක්ෂක සාමාන්‍යාධිකාරි මූල්‍ය කළමනාකරු

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි. 03 සිට 05 පිටුවල දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත වේ.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

**2024 දෙසැම්බර් 31** වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශකර ඇත)

| | පත්‍ර අංකය | | **2,024** | | **2023** |
|---|---|---|---|---|---|
| රජයේ ප්‍රදාන | 1 | | | | |
| සංවර්ධන ප්‍රාග්ධනය | | | 497,692,988 | | 735,953,071 |
| පුනරාවර්තන | | | 477,921,000 | | 428,883,397 |
| වෙනත් ආදායම් | | | | | |
| පොළී - ස්ථාවර තැන්පතු | 2 | 16,435,626 | | 12,186,390 | |
| පොළි - සත්දින කාලීන තැන්පතු | | - | | 15,058,177 | |
| සේවකයන්ට ලබා දුන් ණය මත පොළිය | | 4,054,640 | | 4,073,967 | |
| විවිධ ආදායම් | | 12,757,308 | | 9,654,025 | |
| හන්තාන වියදම ඉක්ම වූ ආදායම | 3 | 7,811,138 | | 3,661,426 | |
| තේ ක්ෂේත්‍ර හා මව් වගා අතිරික්තය /ඌණතාව | 4 | (1,273,922) | | (1,122,419) | |
| පැළ තවාන් අතිරික්තය /ඌණතාවය | 5 | 1,756,475 | 41,541,264 | 2,599,289 | 46,110,855 |
| | | | **1,017,155,252** | | **1,210,947,323** |
| සංවර්ධන වියදම් | 6 | | | | |
| සහනාධාර | | (357,622,158) | | (711,761,263) | |
| ව්‍යාප්ති වියදම් | | (22,174,597) | | (13,345,928) | |
| සමිති සංවර්ධනය | | (2,250,000) | | (1,391,260) | |
| ආයතනික සංවර්ධනය | | (5,903,157) | | (2,019,552) | |
| | | | **(387,949,912)** | | **(728,518,003)** |
| මෙහෙයුම් වියදම් | 7 | | | | |
| වැටුප්, සේ.අ., සේ.භා.අ. හා වෙනත් දීමනා | | (349,313,654) | | (306,622,098) | |
| අතිකාල හා නිවාඩු සඳහා ගෙවීම් | | (3,236,917) | | (2,830,273) | |
| ගමන් වියදම් හා යැපීම් දීමනා | | (8,753,012) | | (7,848,754) | |
| අලුත්වැඩියා හා නඩත්තුව | | (44,620,788) | | (35,529,542) | |
| සැපයුම් | | (6,986,511) | | (10,514,578) | |
| සන්නිවේදන | | (6,333,526) | | (7,764,794) | |
| වරිපනම්, බදු හා උපයෝගීතා | | (10,317,408) | | (9,758,415) | |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (34,242,343) | | (38,542,415) | |
| මුළු මෙහෙයුම් වියදම් | | | **(463,804,159)** | | **(419,410,869)** |
| මෙහෙයුම් කටයුතුවල අතිරික්තය / ඌණතාවය | | | **165,401,182** | | **63,018,451** |
| පාරිතෝෂික | | (45,478,052) | | (13,069,966) | |
| ක්ෂය වීම් හා ක්‍රමක්ෂය | | (63,315,437) | | (52,928,727) | |
| බොල් ණය ප්‍රතිපාදන/ ලියා කපා හල ණයගැතියන් | | 675,673 | | (527,354) | |
| | | | **(108,117,816)** | | **(66,526,046)** |
| අතිවිශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ අතිරික්තය / ඌණතාවය | | | **57,283,366** | | **(3,507,595)** |
| ප්‍රාග්ධන ප්‍රදාන | | | | | 21,697,932 |
| ප්‍රාග්ධන ප්‍රදාන -භාණ්ඩාගාර අරමුදල | | | 336,522,854 | | |
| ප්‍රාග්ධන ප්‍රදාන -ස්ටාර් ව්‍යාපෘතිය | | | 112,321,965 | | 161,034,051 |
| අතිවිශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ අතිරික්තය / ඌණතාවය | | | **506,128,185** | | **179,224,388** |

වරහන් තුළින් සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි

## 31/12/2024 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | (ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත) | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට අදාල මුදල් ප්‍රවාහ** | **2,024** | **2,023** |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය / ඌණතාවය | 506,128,185 | 179,224,388 |
| මුදල් නොවන ගණුදෙනු | | |
| විලම්භිත ආදායම් | - | (21,697,932) |
| ක්ෂය වීම් | 63,315,437 | 52,928,727 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 45,478,052 | 13,069,966 |
| ගෙවූ පාරිතෝෂික | (23,279,006) | (28,384,357) |
| අඩමාන ණය සඳහා වෙන්කිරීම් වැඩිවීම/අඩුවීම | (675,673) | 527,354 |
| ප්‍රාග්ධන ප්‍රදාන | (448,844,819) | (161,034,051) |
| පොලී ආදායම් | (20,490,265) | (31,318,534) |
| ගෙවිය යුතු ගෙවීම්වල වැඩිවීම /අඩුවීම | (156,738,836) | (92,210,330) |
| ප්‍රත්‍යාගණන අලාභ | | |
| දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද (ලාභ) / අලාභ | (31,924) | (45,819) |
| අනෙකුත් වත්කම්වල වැඩිවීම /අඩුවීම | (1,854,556) | (773,839) |
| ලැබිය යුතු දෑ වැඩිවීම /අඩුවීම | (17,748,619) | (19,743,057) |
| භාණ්ඩ තොග අයිතමයන්ගේ වැඩිවීම/අඩුවීම | 8,707,792 | 37,606,583 |
| මෙහෙයුම් කටයුතුවල ශුද්ධ මුදල් ප්‍රවාහ | **(46,034,232)** | **(71,850,901)** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලට අදාල මුදල් ප්‍රවාහ | | |
| දේපළ පිරියත හා උපකරණ මිල දී ගැනීම් | (9,977,183) | (29,320,702) |
| දේපළපිරියත හා උපකරණ විකිණීමෙන් ලද අදායම/ අළෙවි පිරිවැය | 255,769 | 3,232,130 |
| ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහ | **(9,721,414)** | **(26,088,572)** |
| මූල්‍ය කටයුතුවලට අදාල මුදල් ප්‍රවාහ | | |
| ලැබූ පොළිය | 22,006,997 | 40,689,232 |
| සංවර්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | | |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 254,125 | |
| රජයේ දායකත්වය | 13,632,012 | 50,106,928 |
| මූල්‍ය කටයුතු වල ශුද්ධ මුදල් ප්‍රවාහ | **35,893,134** | **90,796,160** |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | **(19,862,512)** | **(7,143,312)** |
| කාල වකවානුව ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | **298,661,215** | **305,804,527** |
| කාල වකවානුව අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ | **278,798,703** | **298,661,215** |

වරහන් තුළින් සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි

**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය**

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය**

( ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශකර ඇත))

| | පාලන අස්ථිත්වයේ හිමිකරුවන්ට අදාලවන | | | |
|---|---|---|---|---|
| විස්තරය | දායක ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිත | සමුච්චිත අතිරික්තය/ | ශුද්ධ වත්කම් / හිමිකම |
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | **294,481,845** | **232,935,807** | **(10,268,536)** | **678,183,166** |
| **පෙර වසරේ ගැලපුම්** | | | **2,361,312** | **2,361,312** |
| **2023 ජනවාරි 01 දිනට නැවත පිහිට වූ ශේෂය** | **294,481,845** | **232,935,807** | **(7,907,224)** | **519,510,428** |
| වර්ෂය සඳහා අතිරික්තය/ඌණතාවය | | | 179,224,388 | 179,224,388 |
| වර්ෂය සඳහා රජයේ ප්‍රදාන | 50,106,929 | | | 50,106,929 |
| විලම්භිත කල ආදායම | (21,697,932) | | | (21,697,932) |
| **2023/12/ 31 දිනට ශේෂය** | **322,890,842** | **232,935,807** | **171,317,164** | **727,143,813** |
| වර්ෂය සඳහා අතිරික්තය/ඌණතාවය | | | 506,128,185 | 506,128,185 |
| **දේපල ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය** | | 254,125 | | 254,125 |
| **වර්ෂය සඳහා රජයේ ප්‍රදාන** | 13,632,012 | | | 13,632,012 |
| **ස්ටාර් ව්‍යාපෘතියේ ප්‍රදාන** | 112,321,965 | | | 112,321,965 |
| ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 11ට අනුව ප්‍රාග්ධන ප්‍රධාන මුළු වටිනාකම ලාභ අලාභ ගිණුමට මාරු කර ඇත | (448,844,819) | | | |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **233,189,932** | **677,445,348** | **910,635,281** |

වරහන් තුළින් සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
සටහන අංක. 01
**මුදල් සහ බැංකු**

| **විස්තරය** | **එකතුව** |
|---|---|
| **මාර්ගස්ථ වන මුදල්** | 1,638,068 |
| අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල් | 87,584,596 |
| කැම්පතු | 189,576,039 |
| එකතුව | **278,798,703** |

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
සටහන් අංකය. 02

ලැබිය යුතු | රු.

| විස්තරය | එකතුව |
|---|---|
| **ණයගැතියන්** | |
| කාර්ය මණ්ඩල ණය ගැතියන් | 70,457 |
| ණය ගැතියන් - Mr Silva | 706,572 |
| ණය ගැතියන් - DTPC ව්‍යාපෘතිය | 527,860 |
| Starr ණය ගැතියන් | 1,302,867 |
| වර්ණ විභේදකය | 5,916,590 |
| විවිධ ණය ගැතියන් | 2,218,008 |
| තේ ශක්ති අරමුදල - පොහොර | 1,941,774 |
| T.R.I | 550,356 |
| N.I.P.M | 149,953 |
| T.S.H.S.- පොහොර | 3,896,683 |
| - ඉසින යන්ත්‍ර | 348,348 |
| - තරාදි | 31,500 |
| යෙදවුම් ණය ගැතියන් VP පැළ | 4,358,677 |
| යෙදවුම් ණය ගැතියන් පොලිතින් | 2,707,034 |
| යෙදවුම් ණය ගැතියන් රිකිලි | 48,069 |
| යෙදවුම් ණය ගැතියන් පොලිතින් /Basamid | 122,106 |
| යෙදවුම් ණය ගැතියන් - තවාන් උපකරණ | 181,481 |
| ණයගැතියෝ - දළු කූඩ / කතුරු | 124,220 |
| Tණයගැතියෝ-තේ කර්මාන්තශාලා | 440,225 |
| Ministry of Tea | 7,117,700 |
| කොම්පෝස්ට් ණය ගැතියන් | 452,030 |
| අභ්‍යන්තර ණය ගැතියන් -ප්‍රාදේශීය කාර්යාලය | 653,700 |
| උප එකතුව | 33,866,208 |
| **ණය සහ අත්තිකාරම්** | |
| ආපදා ණය | 40,848,514 |
| නිවාස ණය | 46,349,408 |
| යතුරුපැදි ණය | 2,036,274 |
| යතුරුපැදි ණය TI | 6,028,883 |
| නැවත උපලේඛිත වාහන ණය | 6,664,321 |
| විශේෂ වැටුප් අත්තිකාරම | 777,675 |
| උත්සව අත්තිකාරම | 171,858 |
| විවිධ අත්තිකාරම් | 320,502 |
| අත්තිකාරම (ADB/IRDP) | 136,854 |
| ණය - සහන ණය | 14,654 |
| උප එකතුව | 103,348,943 |
| **තැම්පතු සහ අත්තිකාරම්** | |
| ඉන්ධන | 643,000 |
| දුරකථන | 27,500 |
| ගෑස් සිලින්ඩර | 10,600 |
| අනෙකුත් අත්තිකාරම් | 7,823 |
| කම්කරු දෙපාර්තමේන්තුව | 408,216 |
| උප එකතුව | 1,097,139 |
| | |
| විස්තරය | එකතුව |
| **අනෙකුත් ශේෂ** | |
| STaRR ව්‍යාපෘතිය | 861,457 |
| මරණාධාර සමිතිය | 494,967 |
| විවිධ අඩුකිරීම් | 842,830 |
| T.S.H.S. සංවර්ධන අරමුදල | 53,426 |
| පොහොර දීමනාව | 236,605 |
| තේ කුඩු ආදායම් ලැබීම් | 222,013 |
| Graviliya Plant ව්‍යාපෘතිය | 41,514 |
| Ministry of tea සඳහා ප්‍රදාන කාර්යාල ලැබීම් | 925,286 |
| වෙනත් | 894,907 |
| උප එකතුව | 4,573,005 |
| **එකතුව** | **142,885,295** |
| අඩමාණ ණය වෙන්කිරිම | (17,088,397) |
| එකතුව | **(17,088,397)** |
| මුළු එකතුව | **125,796,898** |

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

සටහන් අංකය. 03

භාණ්ඩ තොග රු.

| විස්තරය | එකතුව |
|---|---|
| පැළ තොගය | 30,605,164 |
| ලිපි ද්‍රව්‍ය | 13,551,573 |
| විවිධ තොග | 8,037,796 |
| තේ පැකට් තොගය | 1,083,752 |
| පොහොර | 148,160 |
| බාසාමිඩ්/මෙතම් සෝඩියම්/ග්ලයිෆොසෙට්/තඹ | 43,839 |
| පොලිතීන් | 1,814,053 |
| පැළ තවාන් උපකරණ | 1,572,342 |
| ප්‍රකාශණ සහ සඟරා | 424,893 |
| නෙළන කතුරු/කූඩ/තරාදි | 172,484 |
| සහන පැකේජය | 154,123 |
| පුහුණු උපකරණ | 3,025 |
| සෙවන දැල් | 499,168 |
| මාර්ගස්ථ තොග | 5,106,505 |
| දියර ඉසින සහ ජල පොම්ප | 5,030 |
| එකතුව | **63,221,906** |

සටහන් අංකය. 04

පෙර ගෙවීම් රු.

| විස්තරය | එකතුව |
|---|---|
| රක්ෂණය | 53,631 |
| තවාන් | 580,028 |
| තැපැල් මුද්‍රා යන්ත්‍රණ | 124,506 |
| එකතුව | **758,165** |

සටහන් අංකය. 05

අනෙකුත් ජංගම වත්කම් රු.

| විස්තරය | එකතුව |
|---|---|
| WIP සිවිල් කටයුතු | 17,420,401 |
| එකතුව | **17,420,401** |

සටහන් අංකය. 06

ආයෝජන රු.

| විස්තරය | එකතුව |
|---|---|
| ස්ථාවර තැම්පතු - පාරිතෝෂිකය | 25,010,240 |
| එකතුව | **25,010,240** |

සටහන් අංකය. 07

අනෙකුත් මූල්‍ය වත්කම් රු.

| විස්තරය | එකතුව |
|---|---|
| අපගමණය කල පිරිවැය | 4,918,777 |
| එකතුව | **4,918,777** |

**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය**

**සටහන් අංකය. 08**

**දේපල, පිරියත හා උපකරණ**

රු.

| විස්තරය | 01.01.2024 දිනට පිරිවැය | වර්ෂය සඳහා එකතු කිරීම | මාරු කිරීම (ඇතුළතට ) | මාරු කිරීම (පිටතට) | ඉවත් කිරීම | 31.12.2024 දිනට පිරිවැය | 01.01.2024 දිනට ක්ෂයවීම | වර්ෂය සඳහා ක්ෂයවීම | මාරු කිරීම (ඇතුළතට ) | මාරු කිරීම (පිටතට) | ඉවත් කිරීම | සමුච්චිත ක්ෂයවීම | ලියාභල වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | 74,141,229 | - | - | - | - | 74,141,228.57 | - | - | - | - | - | - | 74,141,22857 |
| ගොඩනැගිලි | 588,137,497 | 6,198,467 | - | - | - | 594,335,964.07 | 88,727,468 | 11,601,216.34 | - | - | - | 100,328,683.97 | 494,007,28010 |
| මෝටර් රථ | 109,147,950 | 104,659,082 | 42,145,835 | (42,145,835) | (245,997) | 213,561,035.30 | 65,512,837 | 32,682,764.02 | 26,478,334.00 | (26,478,334.00) | - | 98,195,601.28 | 115,365,43402 |
| ව්‍යාප්ති මෝටර් රථ | 2,054,275 | 5,687,500 | - | - | (1,099,425) | 6,642,350.00 | 2,054,275 | 154,383.33 | | | (1,099,425.00) | 1,109,233.33 | 5,533,11667 |
| ගෘහ භාණ්ඩ සවි කිරීම හා කාර්යාල උපකරණ | 64,841,106 | 3,040,123 | - | - | (126,700) | 67,754,528.63 | 32,379,907.07 | 8,447,441.90 | - | - | (111,152.13) | 40,716,196.85 | 27,038,33179 |
| පරිගණක | 46,583,010 | 2,640,600 | - | - | (261,482) | 48,962,128.31 | 37,909,831.50 | 2,607,829.96 | - | - | (299,182.00) | 40,218,479.46 | 8,743,64885 |
| යන්ත්‍ර පිරියත හා උපකරණ | 37,276,482 | 12,627 | - | - | - | 37,289,109.00 | 21,101,263.03 | 7,148,910.82 | - | - | - | 28,250,173.85 | 9,038,93515 |
| පුහුණුවීම් උපකරණ | 5,231,891 | 60,750 | - | - | - | 5,292,640.54 | 3,943,933.73 | 640,717.72 | - | - | - | 4,584,651 | 707,98909 |
| හාලිඇල පාර | 514,667 | - | - | - | - | 514,666.82 | 238,685 | 10,293 | - | - | - | 248,978 | 265,68849 |
| වෙනත් | 1,293,974 | - | - | - | - | 1,293,974.00 | 1,258,853 | 21,880 | - | - | - | 1,280,733 | 13,24125 |
| **එකතුව** | **929,222,081** | **122,299,148** | **42,145,835** | **(42,145,835)** | **(1,733,604)** | **1,049,787,625** | **253,127,053** | **63,315,437** | **26,478,334** | **(26,478,334)** | **(1,509,759)** | **314,932,731** | **734,854,894** |

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

සටහන්අංක . 09

ගෙවිය යුතු

රු.

| විස්තරය | එකතුව |
|---|---|
| **ණයහිමියන්** | |
| විවිධ ණය හිමියන් | 34,692,014 |
| ණයහිමි -පොහොර | 3,826,879 |
| තේ කර්මාන්තශාලා | 215,432 |
| හන්තාන පුහුණු මධ්‍යස්ථානය | 62,109 |
| ප්‍රාදේශිය කාර්යාල ගෙවීම් | 1,706,950 |
| පැළ ණයහිමියන් | 759,569 |
| කොම්පෝස්ට් (Green force) | 312,966 |
| උප එකතුව | 41,575,919 |
| **තැම්පතු ගෙවීම්** | |
| පොහොර සඳහා ගෙවීම් | 504,983 |
| VP පැළ සඳහා තැන්පතු | 1,427,114 |
| ටෙන්ඩර් තැන්පතු | 3,802,822 |
| අනෙකුත් තැන්පතු | 1,485,302 |
| උප එකතුව | 7,220,221 |
| **අනෙකුත් ශේෂ** | |
| රැඳවුම් ගෙවීම් | 820,680 |
| හිමිකම් නොලද චෙක් | 4,269,037 |
| සුභසාධන | 676,700 |
| තවාන් අරමුදල | 550,000 |
| තේ ශක්ති | 101,300 |
| T.S. සුභසාධන රක්ෂණය | 2,165,425 |
| Ministry Of Plantation GNSS | 7,500,000 |
| පොහොර - යූරියා | 817,146 |
| පස සංරක්ෂණය | 3,448,363 |
| පොහොර සහනාධාර | 9,455,911 |
| යූරියා ව්‍යාපෘතිය - සමිති | 4,061,498 |
| මාර්ගස්ත මුදල් | 127,790 |
| ග්ලයිෆොසෙට් | 4,827,478 |
| CO3 ගුණන බිම් කොටස් | 67,660 |
| State - පොහොර ව්‍යාපෘතිය | 400,984 |
| පොහොර චක්‍රිය අරමුදල | 7,653,505 |
| කොම්පෝස්ට් ව්‍යාපෘතිය | 1,808,632 |
| විශේෂ ව්‍යාපෘතිය- කොම්පෝස්ට් ව්‍යාපෘතිය | 682,450 |
| ඉහළ සෙවන විශේෂ ව්‍යාපෘතිය | 206,489 |
| ජම්බෝ පැල නඩත්තු අරමුදල | 256,875 |
| සෘජු තේ වගාව - විශේෂ ව්‍යාපෘතිය | 184,554 |
| DTPC යන්ත්‍ර නඩත්තු / පාලන අරමුදල | 4,970,038 |
| සමාජ වාහන විකුණුම් | 9,155,483 |
| වෙනත් | 556,692 |
| උප එකතුව | 64,764,690 |
| **එකතුව** | **113,560,830** |

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

**සටහන් අංකය.10**

**උපචිත වියදම්**

රු.

| විස්තරය | එකතුව |
|---|---|
| ගොඩනැගිලි පිරිසිදු කිරිම / නඩත්තුව | 371,975 |
| පස සංරක්ෂණය | 260,000 |
| විදුලිය සහ ජලය | 542,094 |
| EPF & ETF | 7,792,445 |
| ව්‍යාපෘති වැඩසටහන් | 1,520,932 |
| නොමිලයේ දෙන තේ | 600 |
| ඉන්ධන | 529,761 |
| වැටුප් /වේතන හා අතිකාල | 2,541,446 |
| IPVPN bill | 72,997 |
| පරිගණක නඩත්තුව | 102,630 |
| වෛද්‍ය සත්කාර | 960,527 |
| යතුරුපැදි නඩත්තුව | 254,356 |
| පුවත්පත් දැන්වීම් | 48,831 |
| පැළ තවාන් සහ මව් වගා | 26,781 |
| කාර්යාල උපකරණ නඩත්තුව | 44,700 |
| වරිපනම් සහ බදු | 109,338 |
| නැවත වගා සහනාධාර 2024 | 371,519 |
| කුලිය | 494,477 |
| ආරක්ෂාව | 1,999,661 |
| සමිති සංවිධාන | 600,000 |
| මුද්දර ගාස්තු | 113,575 |
| ලිපි ද්‍රව්‍ය | 282,828 |
| විවිධ | 298,775 |
| දුරකථන සහ තැපැල් | 212,898 |
| පුහුණුව | 796,464 |
| ප්‍රවාහන ගාස්තු | 11,138 |
| ගමන් වියදම් සහ යැපිම දිමනා | 1,281,665 |
| නිල ඇඳුම් සහ බූට්ස් | 43,393 |
| වාහන නඩත්තුව | 593,482 |
| සුභසාධනය | 80,444 |
| විගණන ගාස්තු | 1,950,000 |
| නීති ගාස්තු | 1,448,500 |
| වියදම් සඳහා වෙන් කිරිම් | 2,174,802 |
| **එකතුව** | **27,933,035** |

**සටහන් අංකය.11**

**වෙන්කිරිම්**

| විස්තරය | එකතුව |
|---|---|
| පාරිතෝෂික වෙන්කිරිම | 198,650,839 |
| **එකතුව** | **198,650,839** |

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**1.වාර්තා කරන ආයතනය**

**1.1. ආයතනික තොරතුරු**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය (TSHDA) 1977 දී 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ ස්ථාපිත කරන ලදී. කුඩා තේ වතු සංවර්ධනය සඳහා බලපත්‍රලාභී එකම ව්‍යවස්ථාපිත ආයතනය ලෙස, නිෂ්පාදනය ඉහළ නැංවීම, අලෙවිකරණ කටයුතු, ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ කුඩා තේ වතු හිමියන්ගේ සුභසාධනය සඳහා කටයුතු කිරීම අධිකාරියේ අරමුණු වේ.
කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල 08කින් සහ රත්නසිරි වික්‍රමනායක පුහුණු මධ්‍යස්ථානයෙන් සමන්විත වේ.

**1.2. මූල්‍ය ප්‍රකාශන**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

**2.ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.1 ගිණුම්කරණයේ පදනම**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සම්පාදිත ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කරනු ලැබ ඇත. එම ගිණුම්වලට බලපෑම්කරනු ලබන උද්ධමනීය සාධක උදෙසා ගැලපුම් කිසිවක් සිදු කර නොමැත.

**2.2. සංසන්දනාත්මක තොරතුරු**

සංසන්දනාත්මක තොරතුරු සපයා ඇත්තේ වත්මන් වසරේ ඉදිරිපත් කිරීමට අනුකූල ව වත්මන් කාල සීමාව තුල මූල්‍ය ප්‍රකාශන අවබෝධ කරගැනීම සඳහාත් අවශ්‍ය ස්ථානයන්හි දී නැවත වර්ගීකරණය සඳහාත් අදාළ වන්නා වූ සියළු දෑ හෙළිදරව් කර ඇත.

**2.3. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්**

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සියළු ප්‍රමාණාත්මක සිදුවීමක්ම සලකා බලා ඇති අතර අවශ්‍ය ස්ථානයන්හි දී ගැලපීම් හා හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබුණි.

**3.දේපළ, පිරියත සහ උපකරණ**

**3.1 හඳුනාගැනීම**

දේපළ, පිරියත සහ උපකරණ (PPE) හඳුනාගත හැක්කේ වත්කම හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ අධිකාරිය වෙත ගලා ඒමට ඉඩ තිබෙනම් සහ වත්කමේ පිරිවැය සත්‍ය ලෙස මැනිය හැකි නම් ය.

**3.2 මැනීම**

වත්කම අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වැය කිරීම් දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැයට ඇතුළත් වේ. දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් අඩු කොටය. ප්‍රත්‍යාගණනය කරන දිනට, ප්‍රත්‍යාගණන අගයට ගෙනගිය දේපළවල සාධාරණ වටිනාකම දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂයද අඩුකොටය.
වත්කමක ප්‍රත්‍යාගණනය මත පැන නගින අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතය යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය තුල ඉදිරිපත් කර ඇත.

**3.3. ක්ෂයවීම**

ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පුරා සරල රේඛීය පදනමක් මත ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ක්ෂයවීම් හඳුනා ගැනේ
.

වත්මන් සහ සංසන්දනාත්මක කාල පරිච්ඡේද සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයන් පහත පරිදි වේ,

| | |
|---|---|
| ගොඩනැගිලි | 2.00% |
| මෝටර් වාහන | 20.0% |
| ගෘහ භාණ්ඩ, සවි කිරීම් | 12.5% |
| කාර්යාල උපකරණ | 12.5% |
| පරිගණක | 20.0% |
| යන්ත්‍රෝපකරණ | 20.0% |

ඉඩම් ක්ෂය නොකෙරේ. තවද, ගොඩනැගිල්ල පුළුල් කිරීමේ සහ ප්‍රධාන ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වන පිරිවැය මුල් ගොඩනැගිලිවල ඉතිරි ප්‍රයෝජනවත් ආයු කාලය පුරාවට ක්ෂය වේ.

**4. ආයෝජනය**

ආයෝජන අතර ස්ථාවර තැන්පතු සහ පාරිතෝෂික අරමුදල් ඇතුළත් වේ.

**5. වෙනත් මූල්‍ය වත්කම්**

ආයතනයට පැල තවාන් සඳහා යොදාගන්නා ලද අමුද්‍රව්‍ය පිරිවැය, තවාන් ගෘහයක් ඉදිකිරීමට ගිය වියදම් ද ඇතුළුව, වත්කමේ ඵලදායී ජීව කාලය යටතේ වර්ග කර ඇති අතර එම කාලය සඳහා අදාළ පිරිවැය අපගමනය වූ පිරිවැය ලෙස ඉදිරියට ගෙන එන ලදී. 2024.12.31 දිනට පෙන්නුම් කර ඇති ශේෂය රු. මිලියන 4.9 කි.

**6. තොග සහ ඉන්වෙන්ටරි**

ඉන්වෙන්ටරි මනිනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධිත වටිනාකම් යන දෙකින් අඩු වටිනාකම් අනුව ය. ඉන්වෙන්ටරිවල පිරිවැය පදනම් වී ඇත්තේ "පෙර ලැබීම් පෙර නිකුතු " මූලධර්මය මත ය. ඉන්වෙන්ටරිවල වටිනාකමට අත්පත් කර ගැනීමේදී දරන ලද වියදම්, පරිවර්තන පිරිවැය සහ ඒවා පවතින ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමේදී දරන ලද අනෙකුත් වියදම් ඇතුළත් වේ.

2024.12.31 දිනට රු. මිලියන 30.6 ක තේ පැළ තොගය ඉන්වෙන්ටරි යටතේ දක්වා ඇත. 2024 දෙසැම්බර් 31 දක්වා සමුච්චිත නිෂ්පාදන පිරිවැය මත තේ පැළ තොගය තක්සේරු කර ඇත.

**7. වෙළඳ ණයගැතියන් සහ ලැබිය යුතු මුදල්**

වෙළඳ හා අනෙකුත් ලැබීම් ඒවායේ පොත් අගය අනුව දක්වා ඇති අතර අඩමාන ණය ලැබීම් සඳහා ප්‍රතිපාදන සකස් කර ඇත

| ණය කාලය | ප්‍රතිපාදන |
|---|---|
| වසරකට අඩු කාලයක් | Nil |
| අවුරුදු එකකට දෙකකට වැඩි කාලයක් | 10% |
| අවුරුදු දෙක තුනකට වැඩියි | 30% |
| අවුරුදු තුනකට පහකට වැඩි කාලයක් | 50% |
| අවුරුදු පහකට වැඩි | 100% |

**8. අනෙකුත් ලැබිය යුතු දේ**

වෙළඳ ණයගැතියන් හැර අනෙකුත් ලැබිය යුතු දේ ද ඔවුන්ගේ මුදල් ප්‍රමාණයන්හි දක්වා ඇත.

**9. මුදල් සහ මුදල් හා සමාන දෑ**

මුදල් සහ මුදල් හා සමාන දෑ වලට අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් හා ඉල්ලුම් තැන්පතු ඇතුළත් වේ. 2024 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය රුපියල් මිලියන 278.79කි.

**10. මුදල් ප්‍රවාහ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය භාවිතයෙන් සකස්කර ඇත.

දේපල පිරියත උපකරණ අදාළ උපලේඛනය අනුව වර්ෂයට අදාළව රු.122,299,148.00 වටිනාකම නව වත්කම් අතරින් ස්ටාර් ව්‍යාපෘතියෙන් ලද රු.112,321,965.00 ඉවත් කළ පසු ශුද්ධ මිලදී ගත් වත්කම් වටිනාකම වී ඇත්තේ රු.9,977,183.00 කි.

**11. අරමුදල් ලැබීම් සඳහා ගිණුම්කරණය**

ඒකාබද්ධ අරමුදල හරහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ප්‍රේෂණයකර ඇත්තේ පහත පරිදිය.

| විස්තරය | මුදල් ප්‍රමාණය |
|---|---|
| භාණ්ඩාගාරයෙන් ලද මුළු ලැබීම් ප්‍රමාණය | 989,246,000.00 |
| පුනරාවර්ථන අක්මුදල | 477,921,000.00 |
| ප්‍රාග්ධන අක්මුදල | 511,325,000.00 |

**12. වගකීම්**

ශේෂ පත්‍ර දිනට සියලුම ප්‍රමාණාත්මක වගකීම් ගිණුම්වල ඇතුළත් කර ඇති අතර අසම්භාව්‍ය වගකීම් මත ප්‍රමාණවත් වෙන්කිරීම් සිදුකර ඇත. ඉල්ලුම මත ගෙවිය යුතු කෙටිකාලීන වගකීම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ පෙන්වා ඇත.

**13. පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන**

වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සෑම සේවකයෙක් සඳහා ම පාරිතෝෂික වෙන්කිරීම් සිදු කරනු ලබයි. වර්ෂය සඳහා වෙන්කල මුදල රුපියල් මිලියන 198.65 කි.

**14. බදු ගෙවීම්**

ඒකාබද්ධ අරමුදල යටතේ අරමුදල් සැපයෙන ආයතනයක් බැවින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ආදායම් බද්දෙන් නිදහස්කර ඇත.

**15. රජයේ ප්‍රදාන**

2024 වර්ෂය සඳහා රජයේ ප්‍රදාන (ආයතනික ප්‍රාග්ධනය) පහත පරිදි වේ.

| | |
|---|---|
| ප්‍රාග්ධන අක්මුදල | 511,325,000.00 |
| ආයතනික ප්‍රාග්ධනය | 13,632,012.23 |
| සංවර්ධන ප්‍රාග්ධන එකතුව | 497,692,987.77 |

16. වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුම ජාතික තේ නිෂ්පාදන අවශ්‍යතාවයන්ට අනුකූල ව සකස් කර ඇත.

17. භාණ්ඩාගාර අරමුදල් තුළින් මිලදී ගත් ස්ථාවර වත්කම්වල මුළු වටිනාකම දේපළ පිරියත උපකරණ උපලේඛනයේ වර්ෂයට අදාල එකතු කිරීම් තුළින් ඉදිරිපත් කර ඇත. එම ප්‍රාග්ධන ප්‍රදානයන්හි සම්පූර්ණ වටිනාකම විලම්භිත ආදායම් ලෙස ආදායම් වියදම් ගිණුම තුළ ගැලපුම් කර ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 11හි නව සංස්කරණයට අනුකූලව සිදු කර ඇත.

18. ස්ටාර් ව්‍යාපෘයේ ඇවර කිරිමෙන් ලබා ගත් ප්‍රාග්ධන වත්කම් ප්‍රාග්ධනිකරණය කර ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 11ට අනුව වත්කම් වල ආයු කාලය පුරා ක්‍රමක්ෂය කිරිම වෙනුවට ප්‍රමිතියේ නව සංස්කරණයට අනුකූල විම සඳහා ප්‍රදාන සම්පූර්ණයෙන්ම ලාභ සහ අලාභ ගිණුමට බැර කර ඇත.

19. පවත්නා නඩු දැනට වගකීමක් ලෙස නිශ්චිතව හඳුනාගෙන නොමැත.

1. අනීතික පත්වීම් ලද සේවකයන් සේවයෙන් ඉවත් කිරිම සම්බන්ධව ආයතනයට විරුද්ධව පවරා ඇති නඩුව.
2. පාරිතෝෂික ගෙවීමක් සම්බන්ධ වී.එච්.ඩී.සිල්වාගේ පැමිනිල්ලට එරෙහිව පවතින නඩුව
3. බණ්ඩරවෙල දිසා අධිකරණයේ අංක M /6045 හි නඩු විභාගය

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඒඑල්/ඩී/ ටීඑස්එච්ඩීඒ/1/2024/04    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2025 මැයි 28 දින

සභාපති,
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය.

සභාපති 02 JUN 2025

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සාමාන්‍යාධිකාරී 03 JUN 2025 බත්තරමුල්ල

**කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

පිටපත් :- 01.ලේකම් , වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
02. ලේකම්, මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්/ඩී/ටීඑස්එච්ඩීඒ/ 1/2024/04    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2025 මැයි 28 දින

සභාපති,

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

**කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරනු ලැබූ පිරිවැය රු. 28,588,589 ක් වූ වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කිරීම හෝ ගිණුම් වල හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.

(ආ) ගාල්ල ගොඩනැගිලි පරිශ්‍රයට අදාළ බදු ආදායම රු.7,947,250 ක් වුවද, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනයෙහි රු. 2,493,750 ක් ලෙස හඳුනාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ බදු ආදායම රු.5,453,500 කින් අවප්‍රමාණය වී තිබුණි.

(ඇ) ගාල්ල ගොඩනැගිලි පරිශ්‍රයට අදාළව 2023 වර්ෂයේ ලැබිය යුතු බදු ආදායම රු.4,070,750 ක් වුවද, එම වටිනාකම රු. 9,723,750 ක් ලෙස හඳුනාගැනීම නිසා රඳවාගත් ඉපයුම් හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ලැබිය යුතු බදු ආදායම රු. 5,653,000 කින් අධිප්‍රමාණය වී තිබුණි.

(ඈ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසන් දිනට කිසිදු ඉදිකිරීම් කාර්යයක් ඉටුකර නොතිබුණු රු.16,843,288 ක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශනයේ එම ප්‍රමාණයෙන් කෙරීගෙන යන වැඩ සහ ගෙවිය යුතු වටිනාකම අධිගණනය වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ

විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය

විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය

පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන් ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති/ විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2017.12.21 දිනැති අංක 02/2017 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ වත්කම් කලමනාකරණ චක්‍රලේඛයේ 02 ( i) පරිච්ඡේදය | අධිකාරිය විසින් භාවිතාකරන වාහන 06 ක අයිතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අධිකාරියේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3** වෙනත් කරුණු

(අ) අධිකාරිය සතු නොවන ඉඩමක රු.44,484,405 ක් වැය කර අධිකාරියේ කෑගල්ල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල 2023 වර්ෂයේ ඉදිකර තිබුණු නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් එහි අයිතිය අධිකාරියට පවරාගෙන නොතිබුණි.

(ආ) 1998 වර්ෂයේ පොහොර ණය යෝජනා ක්‍රමය යටතේ පොහොර, දියර ඉසින යන්ත්‍ර හා තරාදි මිලදී ගැනීම සඳහා කුඩා තේ වතු සමිතිවලට ලබා දී තිබුණු ණය මුදල් වලින් සමාලෝචිත වර්ෂය

අවසානයට රු.4,276,531 ක හිඟ ණය ශේෂය, වර්ෂ 25 ක් ගත වී තිබුණද එම මුදල් සමිති වලින් අයකර ගැනීමට ඵලදායි පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) 1998 වර්ෂයේ වර්ණ විභේදන යන්ත්‍ර ලබාදීමේ වැඩසටහන මඟින් පෞද්ගලික තේ කම්හල් හතරකට ලබාදී තිබුණු රු. 5,916,589 ක ණය මුදලක්, 2024 වර්ෂය අවසාන වන තෙක් අයකර ගෙන නොතිබුණි. මෙයින් රු.2,436,449 ක් සඳහා පමණක් නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර ඉතිරි රු.3,480,170 ක මුදල සඳහා ගිවිසුමෙහි පවත්නා අඩුපාඩු හේතුවෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) 1998 වර්ෂයේදී කුඩා තේ වතු සංවර්ධන සමිති වෙත ලබාදී තිබුණු වාහන 23 ක් විකිණීමෙන් ලැබී තිබුණු රු. 9,155,483 ක් භාණ්ඩාගාරයට ගෙවියයුතු ලෙස ගිණුම්ගත කර තිබුණද අදාළ මුදල් ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2021 වර්ෂයේදී කොම්පෝස්ට් අමුද්‍රව්‍ය කැබලි කිරීමේ යන්ත්‍ර 08 ක් ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙතින් රු.2,300,000 කට මිලදී ගෙන තිබුණද, එයින් යන්ත්‍ර 06 ක් නිෂ්පාදන කටයුතු සිදුකිරීමකින් තොරව නිශ්කාර්යව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) කුඩා තේ වතු හිමියන්ට, වාණිජ තේ වගාකරුවන්ට හා ආයතනයේ තේ තවාන් සඳහා ආයතනය විසින් වැඩි දියුණු කළ ප්‍රභේද සහිත ගුණාත්මක බවින් යුතු පැළ සැපයීම සඳහා ආයතනික තේ තවාන් 11ක් පවත්වා ගෙන යනු ලබන අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අලෙවි කල පැළ ප්‍රමාණය සියයට 31 කින් පහත ගොස් ඇති අතර තවාන් 03ක ආදායම ඉක්මවා රු.2,745,500 ක වියදම් දරා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ අනුමත සහකාර ප්‍රාදේශීය කළමනාකරු (ව්‍යාප්ති), කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරි හා තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරි සංඛ්‍යා පිළිවෙලින් 8 ක් 26 ක් හා 144 ක් වුවද තත්‍ය නිලධාරි සංඛ්‍යාව පිළිවෙලින් 3 ක් 21 ක් හා 114 ක් විය. ඒ අනුව තේ ගොවීන් හා සමිති සම්බන්ධව රේඛීය සම්බන්ධතාවයක් පවත්වනු ලබන මෙම නිලධාරීන්ගේ ඇතිවන පුරප්පාඩු නොපිරවීම අධිකාරියේ සහනාධාර වැඩ පිළිවෙල සාර්ථක කර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපාන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඌ) ගිවිසුම් ගත වී වර්ෂ 02 කට වැඩිකාලයක් ගත වුවද ගාල්ල ගොඩනැගිලි පරිශ්‍රයේ බදු ගැණුම්කරුවන් තිදෙනෙකු විසින් ගිවිසුම් ප්‍රකාරව තැන්පත් කළ යුතු රු.3,984,000 ක ආරක්ෂිත තැන්පතු සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් තැන්පත් කර නොතිබුණු අතර ගොඩනැගිල්ලෙහි අලෙවිකුටි අංක 9,10 සහ 11 පරිශ්‍රයන්හි බදු ගැණුම්කාර පෞද්ගලික

ආයතනය විසින් 2023 ජුනි මස සිය ව්‍යාපාර කටයුතු ආරම්භ කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් විධිමත් බදු ගිවිසුමකට එළඹීම සිදුකර නොතිබුණි.

(ඵ) ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ රාජ්‍ය පොහොර සමාගම යන ආයතනය එක්ව කුඩා තේ වතු හිමියන් වෙත මිශ්‍ර පොහොර බෙදා දීමේ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය අවසන් දිනට කුඩා තේ වතු සමිති විසින් පොහොර මෙට්‍රික් ටොන් 8,970 ක් ඇණවුම් කර තිබුණු අතර රාජ්‍ය පොහොර සමාගම විසින් මෙට්‍රික් ටොන් 5,982 ක් බෙදාහැර තිබූ බැවින් ලැබී ඇති ඇණවුම් ප්‍රමාණයෙන් සියයට 37 ක් පමණ නිකුත් කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඒ) ප්‍රධාන කාර්යාලයේ, ගාල්ල හා රත්නපුර ප්‍රාදේශීය කාර්යාලවල වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ )